FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

**“රංගිරි ශ්‍රී ලංකා”**

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු


# රංගිරි ශ්‍රී ලංකා

## RANGIRI SRI LANKA NEWSPAPER


FM 104.4,105.7

ශ්‍රී ලංකාවේ ප්‍රථම බෞද්ධ ගුවන් විදුලි නාලිකාව

**“රංගිරි ශ්‍රී ලංකා”**

සැබෑ මාධ්‍ය සංස්කෘතියක පෙර ගමන්කරු



ශ්‍රී.බු.ව. 2565- ක්‍රි.ව. 2022
ජනවාරි (දුරුතු)

මාසික බෞද්ධ සාර සංග්‍රහය - අන්තර්ජාල කලාපය

38






**රංගිරි ශ්‍රී ලංකා රූපවාහිනිය**

**UHF CH 60**
**PEO TV CH 22**
**Dialog Tv 21**
**Dish Tv 2532**

RSL TELEVISION

**රංගිරි ශ්‍රී ලංකා ගුවන් විදුලිය**
**දේශයේ රන් හඬ**

RSL RADIO

**FM 104.4 - 105.7**

වෙබ් : www.rangirisrilanka.lk



රංගිරි දඹුල්ල සංවර්ධන පදනමේ ප්‍රකාශනයකි.



# දුරුතු පෝය වර්ණනාව

දඹදිව බුද්ධගයාවේදී සම්මා සම්බුද්ධත්වයට පත් වූ ගෞතම බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව බරණැස ඉසිපතනාරාමයේදී පස්වග මහණුන්ට දේශනා කළ සේක. එතැන් සිට උරුවෙල් දනව්වට වැඩමකොට තුන් බෑ ජටිලයන්ට දහම් දෙසා ඔවුන් සියළුමදෙනාට ධර්මාවබෝධය ලබාදුන් සේක.

බුද්ධත්වය ලැබීමෙන් පසු නව වන මාසයේ දුරුතු පෙහෝ දින ලක්දිව මහවැලි ගංගා අසබඩ මහියංණයට වැඩම කොට එහි සිටි යක්ෂ ගෝත්‍රිකයන්ට දහම් දෙසා ඔවුන් නිවන් මගට යොමු කළ සේක. එම අවස්ථාවට සහභාගි වූ ''සුමන දෙවියන් ධර්ම දේශනාව කෙරෙහි පැහැදීමෙන් පසු පිදීමට පූජාහර්හ වස්තුවක් ලබාදෙන ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේය. එම අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ තම හිස දක්ෂිණ හස්තයෙන් පිරිමැද කේශධාතුවක් ගෙන සුමන දෙවියන් අත තැබූ සේක. එය ගෞරවාදරයෙන් පිළිගත් සුමන දෙවිදුන් එම කේහ ධාතුන් නිධන් කර ඉඳුනිල් මැණිකෙන් එම ස්ථානයේ ස්ථූපයක් කරවා පූජාවිධි පැවැත් වූ බව වංශකථාවල සඳහන් වෙයි.

වසරේ මුල් පොහොය වන දුරුතු පොහොය ලෝකවාසී බෞද්ධ ජනතාවට වඩාත් වැදගත් වන්නේ වසරේ ආරම්භක පොහෝ දිනයවීමය. ලක්දිව පිහිටි කැළණි විහාරය ප්‍රධානව සෑම විහාරස්ථානයකම විවිධ ආමිස මෙන්ම ප්‍රතිපත්ති පූජාවන්ද පැවැත්වෙන අතර, එමගින් බෞද්ධ ජනතාව නිරාමිස ප්‍රීතියක් භුක්ති විඳිති.

ඇම්.ඩී.විජයවර්ධන

## පුදබිමක අසිරිය

# මහියංගනය



ගෞතම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී පාද ස්පර්ශය ලැබූ පුණ්‍ය භූමියක් ලෙස මහියංගන පුදබිම හැඳින්විය හැකිය. ඌව පලාතේ බදුලු දිස්ත්‍රික්කයට අයත් මහියංගනය ලක්දිව ප්‍රධාන ගංගාව වශයෙන් සැළකෙන මහවැලි ගඟ අසබඩ පිහිටියේය. සම්බුද්ධත්වයෙන් නවවෙනි මස එළැඹි දුරුතු පොහෝ දිනක බුදුරජාණන් වහන්සේ මෙම ගංතෙරට වැඩම කළ බව මහාවංශය, දීපවංශය වැනි ඓතිහාසික ග්‍රන්ථවල සඳහන්වෙයි. මෙම ප්‍රදේශයේ ජීවත් වූ යක්ෂ, ගෝත්‍රික ජනයා දමනය කර ඔවුන් සරණසීලයෙහි පිහිට වූ බවත් එම අවස්ථාවට සහභාගි වූ දෙවිවරුන් සිටි බවද විස්තර වෙයි. සුමන සමන් දෙවියන් බුදුරජාණන් වහන්සේගේ දේශනාවට පැහැදී පූජාර්ථ වස්තුවක් ඉල්ලූ විට හිස පිරිමැද කේශධාතු මිටක් ලබාදුන් බවත් එය රන්කරඬුවක තරන්පත් කර ෂත්රියන් උසැති ස්ථූපයක් කළ බවත් වංශ කථාවෙහි විස්තර වේ. මෙම ස්ථූපයේ තවත් වැදගත් කරුණක් වන්නේ සැරියුත් මහ රහතන් වහන්සේගේ ශිෂ්‍යයෙකු වූ සරභූ මහරහතන් වහන්සේ ලක්දිවට වැඩම වනවිට රැගෙන ආ ග්‍රීවා ධාතුව මෙ ස්තූපයේ නිධන් කොට දොළොස් රියන් උසට පූජාවිධි පැවැත් වූ බවට මහාවංශය තොරතුරු සපයයි. දේවානම්පියතිස්ස රජුගේ සොහොයුරු චූලාභය රජතුමා මෙම ස්තූපය තිස්රියන් උසට සාදවා පූජාවිධි පැවැත් වූ බවට බෝධිවංශයෙහි තොරතුරු සඳහන් වෙයි. දෙතිස්ඵල බෝධියක් ද රෝපණය කර තිබූ බවට වංශකතාවල සඳහන් වේ.ද්‍රවිඩ පාලනයෙන් රට මුදාගත් දුටුගැමුණු රජතුමා මෙම ස්තූපය අසූරියන් උසට ඉදිකොට පූජාවිධි පැවැත් වූ බවට ඉතිහාසගත තොරතුරුවල සඳහන් වේ.පළමුවන විජයබා රජතුමාද නිශ්ශංකමල්ල රජතුමාද, දෙවන විමලධර්ම සූරිය රජතුමාද මෙම පුදබිම ප්‍රතිසංස්කරණය කොට නව කර්මාන්ත ඉදිකළ බවට තෝරතුරු සඳහන් වෙයි. මෙම කරුණු නිසාම මහියංගන පුදබිම බෞද්ධ ජනතාවගේ ගෞරවාදරයට පාත්‍ර වූ බව සඳහන් කළ හැකිය. මෙවැනි ඓතිහාසික පුණ්‍යභූමි සංවර්ධනය කිරීම බෞද්ධ ජනතාවගේ පරම යුතුකම වන්නේය.



විජය තලවත්තේගෙදර

# නව වර්ෂය ජය හා සතුට වේවා



වර්ෂයක් ගෙවී නව වර්ෂයක් උදා වීම පුද්ගල චින්තයත් බාහිර ක්‍රියා කාරකනුත් යම් තරමකින් හෝ වෙනස්කමක් දැකීමකට පෙළගැස්සවීමකි. එහිදී බොහෝ දුරට නව චින්තයක් අපේක්‍ෂා කරනු ඇත. සැම දෙයක්ම සුභ විදියට සිදුවීම කාගේත් අපේක්‍ෂාව වනු ඇත. යහපත් සිතුම්, පැතුම්, යහපත් ක්‍රියාකාරකම් නව වර්ෂයක පුද්ගල සන්තානයන්හි ඇති විය යුතුව ඇත. ඒ සඳහා අභියෝග ජය ගත යුතුය. සියලු බාධකයන් ජය ගැනීමට හැකියාව ඇත්තේ ඉවසීමේ ගුණය වර්ධනය කළ අයට පමණි. ''ඉක්මන් කොටයි'' සේම ඉවසීමෙන් සැනසීම ලැබේ. යන පාඨයන් පිළිබඳව සිතීම දේශපාලන ක්ෂේත්‍රයේ ඉහළ සිට පහළ අය දක්වාම වැදගත් වන්නකි.

බුදු දහම තුළ ඇති ''අභික්කම'' යන උපසර්ග පදය ඒ සඳහා එකතු වූවෝතින් එපා යන අර්ථය ගෙන දේ. මා ''නිවත්ත අභික්කම'' යනුවෙන් සිදුහත් කුමරු බුද්ධත්වය පතා රජමාළිගයෙන් නික්මෙන අවස්ථාවේදී මාරයා විසින් කළ ප්‍රකාශය තුළින් ඉදිරියට නොයන්න හා නවතින්න යන අර්ථය ප්‍රකාශ කොට ඇත. ඒ අනුව විශේෂයෙන් රජයක් වශයෙන් එම ප්‍රකාශ පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් වනු ඇත. රටට සුභ වැඩ පිළිවෙලක් කිරීමට ප්‍රයත්න දරණ ඕනෑම වේලාවක සතුරෝ මාරයින් විලසින් කුපිත වී එම සුභ වැඩය කඩාකප්පල් කිරීම සාමාන්‍ය ක්‍රියාවකි. එවැනි අවස්ථා වලදී බුද්ධිමත්ව ක්‍රියාකිරීම රටට ආදරය කරන දේශපාලඥයින්ගේ වගකීම විය යුතුය.

2021 වර්ෂය නිමා වී උදා වන්නේ 2022 වර්ෂයයි. එහිදී තවත් අවධානය යොමු කළ යුතු දෙයක් නම් වැරදි අඩුපාඩු සකස් කරගෙන ඉදිරියට යෑමයි. පුහුදුන් සත්වයින් වශයෙන් කා තුළත් වැරදි අඩුපාඩු තිබෙනු ඇත. කෙනෙකුට තවත් කෙනෙකුට ඇඟිල්ල දික් කිරීමට බැරි තරමට පුහුදුන් සත්වයින් .තුළින් වැරදි නොකරන අය නොව වැරදි හදාගත් අයයි. යනුවෙන් විලියම් ශේක්ස්පියර් පවසා ඇත. කෙනෙක් තුළ වැරැද්දක් නැතැයි කීම සාධාරණ කියමනක් නොවේ. බුදුදහමට අනුව බැලූ කළ පුහුදුන් සියල්ලෝම පිස්සන්ය. නමුදු උසස් චින්තනයක් සමග දිවියට පිවිසෙන මිනිසා නැමති සත්වයාට පුළුවන් තරම් වැරදි අඩුපාඩු සමබර කරගැනීමේ හැකියාවක් ඇත.

රටක විවිධ ජාතීන් සේම විවිධ ආගමිකයින් ද වසනු ඇත. ඒ අනුව වර්ග කිරීම දැඩි ලෙස ගැනීම පාලන කටයුතු වලට බාධා පැමිණෙනු ඇත. විශාලව වැඩුණු වෘක්ෂයක අතු කපා දැමීම නිෂ්ඵල ක්‍රියාවකි. එසේ වෘක්ෂය විනාශ කිරීමට අවශ්‍ය නම් එයහ ට ගැනීමේ බීජයම විනාශ කළ යුතුය. හේතුඵල ධර්මයට අනුව බීජය ඇති කල්හි පැලය වේ. බීංය නැති කල්හි පැලය නොවේ. නමුදු බොහෝ දෙනෙක් රටක ප්‍රශ්න දෙස බලන්නේ තම තම දෘෂ්ටිකෝණ තුළිනි. පොදු දෘෂ්ඨි කෝණයකින් බලන්නේ ඉතා අල්පය. ඒ අනුව රටක් ඉදිරියට යෑම සිදු නොවේ. එනිසා අප ''ැ 'රු යමප්බ ඊැබි'' අප සියල්ලෝම මිනිසුන් යන ආකල්පයෙන් බැලීමට පුරුදුවීම ඉතා වැදගත් වනු ඇත. කා තුළත් ඇත්තේ රතු රුධිරයයි. යම් ගමනක් ඇරඹීමේ දී කාටත් පොදු වූ න්‍යායක් දෙස පළමුව අවධානය යොමු කොට පුද්ගල වර්ගීකරණයන් ඊට පසු සිදු කිරීම වැදගත් වනු ඇත. විවිධ ප්‍රභේද හේතුවෙන් සියල්ලෝටම ඒකමතික අදහසක් දීමට අපහසුය. නමුදු සියල්ලන්ටම පොදු වූ කරුණක් පළමුව ගෙන එනම්, ''ා්මප්බ ඊැබි'' අපි මිනිසුන්ය යන තැන ඉදන් ගමන ආරම්භ කිරීම සාර්ථක ඉිදිරි දැක්මක් ඇති කරනු නියතය.

ඉදිරියටම යෑමේදී වැදගත් වන කරුණක් නම් ''දුර බලන්න ළඟ නොබලන්න'' යන්නයි. ජාතක පොත් වහන්සේ තුළ ඇති දීඝිති කෝසල ජාතකය තුළින් ඒබ ව අර්ථවත් කොට ඇත. 'දීළං පස්ස මා රස්සං'' දුර ලබන්න ළඟ නොබලන්න යන්නෙහි ලොකු අර්ථයක් තිබෙනු ඇත. දීඝිති කුමරුගේ මව පියා දෙදෙනාම දීඝකෝසල රජු විසින් මරා දැමූහ. දීඝිති කුමරුට මව්පියන් මැරූ පලිය ගැනීමේ වාරය උදා වුවද කුමරු එසේ නොකොට ''අනුන්ට හිංසා කිරීම සත්පුරුෂ ධර්මයක් නොවේයයි දැන රජු සමග කඩුවෙහි අත ගසා දිවුරා ඔවුනොවුන් ක්ෂමා කරගත්හ. ඒ අනුව සිතීමේදී අද සිදු වන්නේ එහි අනිත් පැත්තය. පුංචි දේට පවා රණ්ඩු වීම, අඩ දබර වීම, ඇණ කොටා ගැනීම, ගහමරා ගැනීම, සාමාන්‍ය දෙයක් බවට පත් වී ඇත.

සමහරු බලයට එන්නට උත්සාහ කරන්නේ අනෙකාට සමබර එක දීමටය. සදාකාලික ගින්නක් ඇති කිරීමෙන් රටක් සමාජයක් ඉදිරියට යෑමක් සිදු නොවේ. සැමදාම උසාවි ගානෙ, පොලීසි ගානෙ, ළගිමින් නඩු හබම විසදා ඉන්නවා හැර ඉදිරියට යෑමක් සුභ වැඩ පිළිවෙලකට එකතු වීම හා සහයෝගය දීම කළ යුතුව ඇත. දේශපාලඥයන් බෙදා ගැනීමට ඔවුන්ට ඇති පක්ෂපාතිත්වය අනුව රට වැසියාද නිරන්තරයෙන් කලකෝලහලවලට යොමු වීම ද අනුවණ ක්‍රියාවකි. දේශපාලඥයනි'එකම ය්රදමච එකකි. ඔවුන් ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා එකතු නොවී ඔවුන්ගේ පටු පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා එකතු වෙති. ජනතාව මෝඩයින්ය. චන්දා දෝෂා, භයා, මෝහා යන ෂතර අගතියට හසු වූ ජනතාව ළගම බලති දුර නොබලති. දේශපාලඥයෝ ඔවුනොවුන් වෙනුවෙන් දුරම බලති. ළඟ නොබලති. මස්පිඬු වලින් වෘෂභයින් සේ වැඩුනද බුද්ධිය නොවැඩීමේ විපාකය සැම කෙනෙකුටම බලපාන්නකි. ''මංසානි තස්ස වඩ්ඪන්ති පඤ්ඤා තස්ස න වඩ්ඪති'' සමහර දේශපාලඥයින් වෘෂභයින් සේ මස්පිඬු වලින් වැඩී ඇත. එයට හේතුව මෝඩ අගතිගාමි ජනතාව සිටීමය. ඔවුන්ගේ කර උඩින් යන වෘෂභයින් වන දේශපාලඥයින් බොහෝ දෙනෙකුට බුද්ධිය වර්ධනය වී නැත. ඇත්තේ මුබරිකම හා කපටිකම පමණි.

එසේ වූ විට රටක් ඉදිරියට යෑම වෙනුවට ''කන්දක් නගිනකොට ආපස්සට එන්නා සේ රට ආපස්සට ඒමය.

රටක වසන ජනතාවට ඕනෑවට වඩා නිදහස හා වරප්‍රසාද ලබා දීමද රටක ප්‍රගමණයට බාධාවකි. දියුණු රටවලට නෙත් යොමා බලනු මැන. ජනතාවට එම රජයන් හරහා මොනවද ලබා දෙන්නෙ කියා. ඔවුන් මැසින් සේ උසේ පටන් රාත්‍රී දක්වා අලෂ නොවී වැඩ කිරීම එම රටවල දියුණුවට හේතු වී ඇත. එම රටවල දේශපානඥයන්ට වැඩි වරප්‍රසාදයන් නැත. රජය හරහා ශ්නෑවට වඩා ජනතාවට පිනිට දීමක් ද නැත. අප රටේ පුංචි දේටත් ''එරසනි ''එරසනිග බොහෝ දේවල් රට වැසියාට පිනට දීම හේතුවෙන් රටවරසියා කසැමලි වී ඇත. එබැවින් ඒ දේවල් බලා පොරොත්තුවෙන්ම කල් මරති. අද අප රටේ වෙලා තියෙන්නේ රට වැසියා විසින් බුද්ධියක් නොමැති පිරිසක් තම වටිනා ඡන්දෙන් පිනට ජීවත් වන්නවුන් පිරිසක් බිහිකොට ඔවුන්ගේ වලිගෙ එල්ලී රට වැසියා අපසයින් බවට පත් වීමය. එතුළින් සීඝ්‍රගාමී වෙනුවට මන්දගාමී රටක් නිර්මාණය වී ඇත. මා මුලින් මතක් කලා සේ කෙනෙක් තව කෙනෙකුට ඇඟිල්ල දිගුකොට විසඳිය හැකි ප්‍රශ්නයක් නොව අපට ඇත්තේ. හැමකෙනාම එකතු වී බෙදාගත යුතු ප්‍රශනයකි. මේ උදාවී ඇත්තේ, ''සුද්ධි අසුද්ධි පච්චත්තං - නාඤ්ඤමඤ්ඤං විසෝධයෝ'' පිරිසිදුකමද , අපිරිසිදුකමද පවත්තේ තමන් තුළය. අනෙකෙක් අනෙකෙකු පිරිසිදු කරන්නේවත් අපිරිසිදු කරන්නේවත් නොවේ.

අප රටේ දේශපාලනය කරන්නන් තුළ ඇති ප්‍රධාන ලක්ෂණයක් වන්නේ නිරන්තරයෙන් අනෙකාට බැන වැදීමය. තම තමා පිළිබඳව වර්ණනා කරගන්නවා හැර තමා තමාගේ වැරදි අඩුපාඩු ගැන සිතීමක් නැත. සියල්ලෝම එක අත්තේ ගෙඩි කන කුරුල්ලන්ය. හොඳ, හොඳ ගෙඩි සොයමින් ඒ් ගසට පියාඹනමින් අතු නසා ගෙඩි කන්නවුන් සේ කරන විනාශය කියා නිමකළ නොහැක. රටවැසියාද නිරන්තරයෙන් හඬ නගන්නේ අනවශ්‍ය දේවල් සඳහා ඒවා වැඩි දියුණු කර ගැනීම සඳහාය. ගෙවල් දොරවල්, ආහාරපාන, ඇඳුම් පැළඳුම්, බේත් හේත් යන ජනතා මූලික අවශ්‍යතා බොහෝ දෙනෙකුට තිබුණද සෑහීමකට පත් නොවනු අත. අද පොල් අතු ගෙයක් දකින්නට නැති තරම්ය. බොහෝ ගෙවල්වල එදඑදර සයිකලයක් හෝ දකින්නට ලැබෙනු ඇත. පුංචි අය තුළ පවා ෆෝන් දෙක, තුනය. ඉන්දියාව, නේපාලය වැනි රටවල නිරන්තරයෙන් වන්දනාවේ යැමද සිදු වේ. අප රටේ ද වන්දනා ගමන් නිරන්තරයෙන් යෑම සිදුවේ. අද ඒවා ඔරසව වශයෙන් ශ්‍රද්ධාවක් නොමැතිවම සිදුවේ. ඔදඅබ එකට ගිය කළ ඇඳුම් කඩවල පෝලිමට ඇඳුම් ගැනීමට සැරසී ඇත. මේ ආදී වශයෙන් බලන කල්හි අන් රටවල් සමග සංසන්දනය කිරීමේ දී අප රට ප්‍රපාතයටම නොවැටී ඇත. නමුදු බොහෝමයක් පිරිස් ලද දෙයින් සතුටු නොවී හූල්ල හූල්ල පිනට ලැබෙන දේ පිළිබඳව සිත සිතා ඒ පිළිබඳ විවේචනය කරමින් සිටිති. බංගලිදේශ, ඉන්දියා, නේපාල, සෝමාලියා, ඉති යෝපියා වැනි රටවල මොන තරම් මිනිසුන් දුක් විඳිනවාද? ඉන්දියාවේ මිනිසුන් එදාවේල සොයා ගැනීමට තව මිනිසෙක් ඍසජනිය්අ එකක දමාගෙන පැදගෙන යති. ආසියාතික සමහර රටවල භික්ෂූන් වහන්සේලා එහි ඇති දුෂ්කරතා හේතුවෙන් අප රටට පැමිණ අධ්‍යාපන කටයුතු සිදු කරති.

ඒ තරමටම තරම් අප රටේ මිනිසුන්ට අවස්ථාව උදාවී නැත. ගහක් කොළක් හෝ එදා වේල සරිකර ගැනීමට ඇත. රැකියාවලට ඇබෑර්තු නිරන්තරයෙන් පුවත්පත්, පෝස්ටර් ආදිය තුළින් නිකුත් වේ. නමුදු හඬ නගන්නේ අන් දුප්පත් රටවැසියන්ටත් වඩා නැතිබැරිකමින් අනන්තයට වැටුනා සේය. එයට හේතුව අනවශ්‍ය වියදම් හා ලද දෙයින් සතුටු නොවීමය. අපේ අතීතයේ මිනිසුන් ගෙවූ ජීවත ගැන

15 පිටුවට...

මහව, උඩගම ශ්‍රී ඉන්ද්‍රසුමන මහ පිරිවෙන්හි ප්‍රවීණාචාර්ය, ප්‍රවචන කීර්ති ශ්‍රී ලේඛණ ශාස්ත්‍රීගලගෙදර රතනවංස ස්ථවිර

# ශ්‍රී ලංකාවේත් - බුරුමයෙත් විශාල ආගමික ප්‍රබෝධයක් ඇති කළ මහා විහාරවංශික ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ උපසම්පදාව

මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්ම දූත පිරිස ලක්දිව බුදු සසුන පිහිටුවීම සඳහා සම්බුද්ධ පරිනිර්වාණයෙන් 236 වැන්නෙහි පොසොන් පොහෝ දා අනුරාධපුර මිහින්තලාවට වැඩම කළහ. එහිදී දෙවනපෑතිස් රජතුමා බුදු සසුන්හි පැහැද තෙරුවන් සරණ ගියේය. මිහිඳු මහරහතන් වහන්සේ තමන් විසින් සම්මත කරන ලද 'තුම්බුරු' සිමා මාලකයේ දී අරිට්ඨ ඇමති ප්‍රධාන සිංහලයන් 56 දෙනාගේ මහණ උපසම්පදාව සිදු කළහ. මේ සිංහල භික්‍ෂුවංශයේ ආරම්භයයි. අරිට්ඨ මහරහතන් වහන්සේ ප්‍රධාන සිංහල රහතුන් වහන්සේලා 56 නමකගේ ආරම්භ වුණු සිංහල භික්‍ෂු පරම්පරාව ලංකා ශාසන ඉතිහාසයේ ථෙරිය නිකාය, මහා විහාර භික්‍ෂුවංශය හා සිංහල භික්‍ෂු වංශය යන නම් වලින් අපේ වංශ කථාවන් හි සඳහන් වෙයි. මෙසේ සිංහල භික්‍ෂු පරපුරක් ඇතිවීම ලංකා සම්බුද්ධ ශාසනයේ පැවැත්මට විශාල අනුබලයක් විය. ක්‍රමයෙන් සිය දහස් ගණනින් සිංහල කුල දරුවෝ සසුන්ගත වන්නට වූහ. ඔවුන් හැමදෙනාම මහ මෙවුනා උයනෙහි සම්මත කළ බුද්ධ සීමාවෙහි උපසම්පන්න බව ලැබූහ.

ලක්දිව බුදුසසුන් පිහිටුවා ටික කාලයක් ගත වූ විට දෙවනපෑතිස් රජතුමා මිහිදු මා හිමියන් වහන්සේගෙන් ප්‍රශ්නයක් ඇසීය. ස්වාමීනි දැන් ලක්දිව බුදු සසුන පිහිටියේ දැයි ඇසීය. එයට උන්වහන්සේගේ පිළිතුරු වූයේ බුදු සසුන පිහිටුවන්නේ උපෝසථ කර්ම වාදි විනය කර්ම සඳහා සීමාවක් පිහිට වුවහොත් පමණක් බවය. තව දුරටත් කරුණු පැහැදිලි කළ මිහිදු මා හිමියන් මහරජ ලක්දිව බුදු සසුන් පිහිටියේය. එහෙත් එය තවම ලක් පොළොවේ මුල් බැස ගෙන නැත. යනු උන්වහන්සේගේ පිළිතුර විය. ශාසනය ලක් පොළොවේ මුල් බැස ගන්නේ කෙසේ දැයි තව දුරටත් අසන ලදුව, යම් කලෙක ලංකාවේ මවුපියන්ගෙන් සිංහල රටේ උපන් දරුවෙක් ලංකාවෙහිම විනය සංගායනාවක් කළොත් එදාට ශාසනය ලක් පොළොවේ මුල් බැස ගියා වන්නේ යැයි මිහිදු හිමියෝ විස්තර කර දුන්හ. මේ සාකච්ඡාව සිදුවන විට මහා අරිට්ඨ තෙරුන්හට ඒ සියල්ල සම්පූර්ණ වී තිබුණේය. එහෙයින් විනය සංගායනාවක් පැවැත්වීමට නොපමාව කටයුතු සංවිධානය විය. අනුරාධපුර ථූපාරාමයට රැස් වූ අනුබුදු මිහිදු හිමියන් ප්‍රධාන මහා සංඝයා වහන්සේ මැද මහා අරිට්ඨ රහතන් වහන්සේ විනය සංගායනා කළහ. බුදු සමය සිරිලක් දේශයෙත් සිංහල ජාතියෙත් උරුමය හැටියට ස්ථිරව සදහටම පිළිගැනීම මෙම ඓතිහාසික සිද්ධියෙන් පසු සිදුවිය. මෙතැන් සිට සිංහල භික්‍ෂූන් වහන්සේගේ මාර්ගෝපදේශකත්වය ඇතිව සිංහල සාහිත්‍යය, සිංහල සංස්කෘතිය, සිංහල සිරිත්, විරිත් සිංහල කලා ශිල්ප ගෘහ නිර්මාණ ශිල්පය සහ නගර නිර්මාණයත් රටේ ජනතාවගේ අධ්‍යාපනයත්, චුදරිත වර්ධනයත්, ආගමික ශ්‍රද්ධානයත් දියුණු වන්නට විය.

මෙසේ ඇති වුණු ශ්‍රී ලාංකික භික්‍ෂු පරම්පරාවේ ශ්‍රී ලංකාවේ සිදු වූ පළමු වැනි මහණ උපසම්පදාව වූයේ මිහිදු මාහිමිපාණන් වහන්සේ සමග ලක් දිවට පැමිණි භණ්ඩුක කුමරුන්ගේය. භණ්ඩුක කුමරුන් මිහින්තලාවේ දී මිහිදු රහතන් වහන්සේ විසින් පැවිදි කරන ලදි. දෙවනුව ඉට්ඨිය - උත්තිය - සම්බල - භද්ධසාල හිමිවරුන් සහිත පඤ්චවර්ගීය සංඝයා වහන්සේ විසින් ග්‍රාම සීමායෙහි දී භණුඩුක සාමණේරයන් වහන්සේ උපසම්පදා කරනු ලැබීය. මෙය ලක්දිව දි සිදු කළ ප්‍රථම උපසම්පදාව විනය කර්මය විය. මෙය සිදු වූයේ පොසොන් පොහෝ දිනයේය.

ලක්දිව විටින් විට විදේශ සතුරු ආක්‍රමණ ඇති විය. ඒ හේතුවෙන් ජාතික, ආගමික හා ධර්ම ශාස්ත්‍රීය සේවාවන් අඩ පණ විය. සොළී ආක්‍රමණ නිසා පොළොන්නරුව යුගයේදී සෑහෙන ශාසන පරිහානියක් ඇති වී තිබුණි. මහා විජයබාහු රජතුමා විසින් සියලු කරුණු දැනගෙන උපසම්පදා විනය කර්මයක් සිදු කිරීම සඳහා ගණපුරණයටවත් ප්‍රමාණ උපසම්පන්න භික්‍ෂූන් වහන්සේ ලක්දිවින් සොයා ගැනීමට නොහැකි වූයෙන් බුරුමයේ (මියන්මාරයේ) රාමඤ්ඤ රට රක්ඛංග දේශයෙන් භික්‍ෂූන් වහන්සේලා වැඩමවා පොළොන්නරුවේ මහවැලි ගගේ දි උපසම්පදාවක් මේ ආකාරයෙන් සිදු කිරීමට හේතු වූයේ ලක්දිව පැවති අභ්‍යන්තර - බාහිර කළකෝලහල නිසාය. ඒ අනුව සිංහල භික්‍ෂු වංශය පිරිහෙන්නට විය. නවවැනි සියවසේදී අනුරාධපුර විසූ රජවරු අභ්‍යන්තර - බාහි කලකෝලහල සිදුවන්නට විය. ඒ අතර ඉන්දියන් සොලී - පාඩි ජාතීන් දෙක අතර තිබූ ගැටුම්වල ප්‍රතිඵල ලක්දිවටත් බලපෑවේය. සිංහල භික්‍ෂූන් දෙපක්‍ෂයට බෙදී ධර්මය පමණක් නොව රාජ්‍ය පාලනයන්ද බෙදාගෙන සිටියහ. මේ කරුණු හේතු කොටගෙන අනුරාධපුර යුගයේ අවසානයක් සිංහල භික්‍ෂූන් වංශයේ පිරිහීමත් ඇති වන්නට විය.

## රාමඤ්ඤ භික්‍ෂු වංශයේ ආරම්භය

ක්‍රි.ව.1056 - බු.ව.1608 දී පමණ ලංකා රාජ්‍යයට පත් මහා විජයබාහු රජතුමාගෙන් පිරිහී තිබුණු බුද්ධ ශාසනයාගේ දියුණුවටත්, රටේ සාමයටත්, සමගියටත් සෞභාග්‍යයටත් උදාර සේවාවක් සිදු විය. මේ විරෝධාර රජුගේ රජවීමත් සමග චෝල පාලනයෙන් පොළොන්නරුව නිදහස් කරගන්නට හැකි විය. සතුරන් පලවාහැර රට ප්‍රතිසංස්කරණය කළේය. බුද්ධාගම යථාස්ථානයට පත් කිරීම සඳහා අප්‍රතිහත ධෛර්යයෙකින් යුතුව ක්‍රියා කළේය. මෙකල විහාරාරාම පිරිවෙන් අඩපණ වී තිබුණු අතර භික්‍ෂු ශාසනය අන්තයටම පිරිහී පැවතුනි. එතුමා රාජ්‍යයත්වයට පත් වී පළමුවෙන්ම සිදුකොට ඇත්තේ භික්‍ෂූන් වහන්සේගේ ඉල්ලීම පරිදි බුද්ධ ශාසනය ආරක්‍ෂා කිරීමට කටයුතු යෙදවීමයි. ඒ බව පොළොන්නරුවේ වෙල්ලක්කාර සෙල්ලිපියෙහි සඳහන් වෙයි. මහා විජයබාහු රජුගෙන් බුද්ධ ශාසනයට සිදු වූ අමරණීය සේවාව නම් බුරුම රට අනුරුද්ධ රජුගේ සහයෝගය ඇතිව ලංකාවේ උපසම්පදාව නැවතත් පිහිටුවීමයි. මේ කාලයේ සිල්වත් භික්‍ෂූන් වහන්සේලා හතර පස් නමක්වත් සොයා ගැනීමට නොහැකි තත්වයක් උදාවී තිබුණි. අවුරුදු ගණනාවකින් උපසම්පදාව නොකෙරුණු බව එතුමාට දැනගන්නට ලැබිණි. ලංකා ශාසන තත්වය දෙස බලා බලවත් කම්පාවට පත් මහා වීජයබාහු රජතුමා ලංකා භික්‍ෂු ශාසනය නැවතත් ඇති කරලීම සඳහා රාමඤ්ඤ රට අනුරුද්ධ රජුගේ උපකාර පැතීය.

රාමඤ්ඤ රටින් භික්‍ෂූන් වහන්සේලා විසිපස් නමක් 25 වැඩමවා ලංකාවේ භික්‍ෂු ශාසනය නැවතත් ඇති කළේය. ලංකාවත් - බුරුම රටත් අතර සම්බන්ධකම් ගොඩනඟා ගැනීමේ මුල් පියවර මේ උපසම්පදා විනය කර්මයයෙන් සිදුවිය. මේ සිද්ධියෙන් පසු දෙරටෙහි රජකළ රජවරුන් දෙපළම මුල් වි රටවල් දෙකටම පොදු ත්‍රිපිටකයක් සකස් කරගත් බව සඳහන් වේ. මේ හේතුවෙන් ලංකාවේත්- බුරුමයේත් විශාල ආගමික ප්‍රබෝධයක් ඇතිවිය. විටින් විට පැන නැගී තිබුණු තුන් නිකාය පිළිබඳ (මහාවිහාර - අභයගිරි- ජේතවන) මත භේද මේ කාලයේ යටපත් වී තිබුණි. ලංකාවේ ජනතාව අතර ආගමික කටයුතු විෂයෙහි උනන්දුවක් අධ්‍යාත්මික ගුණ ධර්මයන්ගේ වර්ජනයක් ඇති විය. එතුමා ත්‍රිපිටකය පිටපත් කරවා භික්‍ෂූන් වහන්සේලාට පූජා කළ බව චූලවංශයේ සඳහන් වේ.

මෙම ශාසනික නවෝදයත් සමග දළඳා



වහන්සේටත් - පාත්‍ර ධාතුන් වහන්සේටත් ආරක්‍ෂාව පිණිස දළඳා මාළිගයක් සදවන ලද බවත් මාගම තුන් නිකායට කෝටියකට අයත් දාගැබ, මණ්ඩලගිරිය ගිරිකණ්ඩ ආදී ස්ථානය ශ්‍රී මහාබෝධි විහාරය ආදී ආගමික් ගොඩනැගිලි රාශියක් එතුමා විසින් කරවන ලද බනත් ශ්‍රී පාදස්ථානයට යන මාර්ගයේ වන්දනාකරුවන්ගේ පහසුව සඳහා ලැගුම්හල් කරවා ආහාර සැපයීමට බරපැන වශායන් රත්නපුරේ ගිලිමගේ නම් ගම වෙන්කළ බවත් සෙල්ලිපිවල සඳහන් වේ. එමෙන්ම මෙකළ ථේරවාදී බෞද්ධ මූලස්ථානය මහා විහාර වංශික භික්‍ෂූන් වහන්සේ සමග බුරුම රට භික්‍ෂූන් සම්බන්ධතා පැවැත් වූහ. බුරුම රටෙහි සංහල සංඝ පරම්පරාව පිහිටුවීම එම සම්බන්ධතාව සිහිපත් කරවන අගනා සිද්ධියකි.

## ලංකාවෙන් උපසම්පදාව පිටරට ගෙන යෑම.

ලංකා ශාසන ඉතිහාසය දෙස විමසා බලනවිට පැහැදිලි වනුයේ වරින් වර ලක් දිවින් පිටරටවලට උපසම්පදාව ගෙන ගිය බවය. හයවන පැරකුම්බා රජ සමයෙහි ලංකාවෙන් සියම් රටට උපසම්පදාව ගෙන ගියේය. ඒ රටේ 'සිංහල සංඝ' නමින් නිකායක් පිහිටුවා ඇත්තේ මෙය සිහිවීමටය. ඊට වසර 64කට පසු ලංකාවෙන් සියම් රටට වැඩම කළ සිංහල සංඝරාජ හිමි නමක් විස්න සියමෙහි බුදු සසුන දියුණු කොට ඇත. ඒ බව සියම් රටේ රජ කළ මහා ධර්මරජ නම් රජු විසින් පිහිටුවා ඇති. 'චක්ජය' පුරාණ විහාරයේ දීත් 6වන බුවනෙකබාහු රජ සමයේදීත් ලංකාවෙන් රාමඤ්ඤ දේශයට උපසම්පදාව නැවත ගෙන ගිය බව එම කල්‍යාණි ශිලා ලිපි වලින් පැහැදිලි වෙයි.



අධ්‍යාපන හා දර්ශන විශාරද පූජ්‍ය ගෝණගල ඥාණාලෝක හිමි,
ශ්‍රී ලංකා රමාඤ්ඤ මහා නිකායේ දිසා පාලක,
(ශ්‍රී ලංකා රාමඤ්ඤ මා නිකායේ 72 වන උපසම්පදා පුණ්‍ය මහෝත්සවය නිමිත්තෙනි)



# ගතට සිතට පැමිණෙන කරදර මෛත්‍රියෙන් වැළකෙයි

අපගේ මෙම ශබ්රය සෑම පැත්තකින්ම දුක්, කම්කටොලු, කරදර බාධක වලට හසුවීමේ ප්‍රවණතාවය වැඩිය. වා, පිත්, සෙම් යන තුන්දොස් කිපීමටත් බාහිර වශයෙන් ස්වභාවික වියත් ඇතුළු සොර සතුරු, සතාසිව්පාවුන්ගේ විපත් වලට ද මුහුණ දීමට සිදුවේ. එනිසා අප නොයෙක් ක්‍රම තුළින් මෙම ශබ්රය ආරක්ෂා කිරීමට වෙහෙසෙමු. නුමදු ඒ සියල්ලම තුළිනි නොකෙරෙන ආරක්ෂාවක් රැකවරණයක් මෛත්‍රී කිරීමෙන් ලැබෙන බව බුදු දහමට අනුව පැහැදිලි වේ.

මෙහිදී මම වයිරස් ගාඩ් යන වචනය ද භාවිතා කර ඇත. එයට හේතු පරිඝණකයකට බොහෝ බාහිරින් නොයෙක් වෛරස් පැමිණ එයට අනතුරක් වීමේ ප්‍රවණතාවය වැඩිය. ඒ සඳහා බොහෝ පරිඝණක සඳහා වෛරස් ගාඩ් එකක භාවිතා කරනු ඇත. සමහර අවස්ථා වලදී එයින්ද පාලනය කළ නොහැකි වෛරස් එන්නට ද පුළුවන. නමුදු බොහෝ දුරට පරිඝණකයකට එයින් ආරක්ෂාවත් රැකවරණයත් ලැබෙනු ඇත.

ඇත්තෙන්ම මිනිසා පරිඝණකයක් නොවේ යැයි මොහොතකට සිතමු. එසේ නම් ඒ පරිඝණකය සඳහා ඉහතින් සඳහන් කළ වෛරස් ගාඩ් එක සම්බන්ධ වූවා සේ මිනිසාගේ ආරක්ෂාව උදෙසා ද යම්කිසි සත්‍යයක් නොහොත් බලයක් අවශ්‍යව ඇත. එය එදිනෙදා ඇසුරු කර හා පරිහණය කරන දේවල් භාවිතා කොට ද සලසා ගත හැකිය. රජ, මැති, ඇමති වරුන්ගේ ආරක්ෂාව පුද්ගලයින් යොදමින්, අවි ආයුධ ද භාවිතා කොට සකස් කර ගන්නා ලද්දකි. ලෝකයෙහි එලෙස බොහෝ දෙනෙක ආරක්ෂාව උදෙසා එවැනි ක්‍රම භාවිත කරයි. තව සමහරු නිරන්තරයෙන් අවි අයුධ භාවිතා කරමින් තව කෙනෙකුගෙන් වන විපත් නති කර ගැනීමට උත්සාහ කරති. තවත් පිරිස් සටන් ක්‍රම භාවිතා කරමින් ආරක්ෂාව සලසා ගැනීමට උත්සාහ කරති. මෙවැනි විවිධ ක්‍රම ඔස්සේ ආරක්ෂාවක් ලැබීමට උත්සාහ කරන්න් අපගේ ශබ්රයට සතුරු උපද්‍රව වැඩි බැවිනි. එලෙසම ස්ථිර ආරක්ෂා වලල්ලක් නොමැතිකම හේතුවෙනි.

නමුදු ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අපට කියා උතුම් පාඩමක් ඔස්සේ අපේ ශබ්රය සුරකිමින් සිත දියුණු කරන වැඩ පිළිවෙලක් ඇත. එය සමහර දෙනෙක් නොහදාරණ අතර එහි ඇති ශක්තිය බලය ගැන ද අවබෝධයක් නැත. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ කිසිදු තැනක ආරක්ෂාවක් ප්‍රාර්ථනා නොකළහ. ඒ සඳහා පිරිස් බලය, අවි ආයුධ, බලය නොපැතුහ. එසේ නම් දහසක් බාහිර බලපෑම් කරදර ඒමේදී බුදුරජාණන් වහන්සේ ආරක්ෂා වූයේ කෙළෙසද? බුදුරජාණන් වහන්සේට කිසිදු බල වේගයකට අනතුරක් කිරීමට නොහැකි වූයේ කුමන කරුණක් නිසාද? එනම් උන් වහන්සේ තුළ ලොව කිසිවෙකු තුළ නොමැති වෛරස් ගාඩ් එකක් තිබුණි. එනම් මෛත්‍රියයි.

මෛත්‍රිය නැමති වයිරස් ගාඩ් එක අප යොදා ගත යුත්තේ කුමක් නිසාද? අප කරා එන වෛරස් මොනවාද මෙම විශ්වයම විනාශ කිරීමට තරම් වෛරස් මිනිසාගේ සන්තානයෙහි පවතී. ඒවා නම් ඊර්ෂයාව, ක්‍රෝධය, වෛරය, පළිගැනීම ආදී දේවල්ය. ඒවා වයිරස් වශයෙන් ඇස්වහ, කටවහ ආදී ඉන්ද්‍රියන් උපයෝගී කර ගනිමින්ද අනතුරු කිරීමේ ප්‍රමාණය වැඩිය. එම සිතෙහි ඇති අමානුෂික සිතුවිලි වෛරස් වශයෙන් සිතුවොත් ඒ සඳහා එකම ගාඩ් එක නොහොත් රැකවරණය මෛත්‍රීය බව අප අමතක නොකළ යුතුය.

මෛත්‍රිය යන වචනයට නිර්වචනයක් සපයන විසුද්ධිමාර්ගය තුළින් මෙලෙස පැහැදිලි කොට ඇත. 'මෙජ්ඣතීති මෙත්තා සෙනෙහතීති අත්‍ථො මිතෙත භවා මිතතසසා වා සො පවත්තීති මෙත්තා' සියලු සත්වයෝ සුවපත් වෙත්වා, නිදුක් වෙත්වා, නීරෝගී වෙත්වා යනාදී වශයෙන් සියලු සත්වයන් කෙරෙහි සෙත් පැතීම ද , මිත්‍රයන් පිළිබඳව සිතෙහි ඇතිවන ස්වභාවය වැනි ස්නේහයක් හැම සතුන් කෙරෙහිම ඇති වීම ද, සියලු සතුන් කෙරෙහි සිතෙහි ඇතිවන මෘදු මොලොක් ගතිය මෛත්‍රිය නම් වන බව එහිදී වැඩි දුරටත් සඳහන් වේ.

අ.නි. චතුක්ඛ නිපාතයෙහි සඳහන් මෙත්තානිසංස සූත්‍රය මෛත්‍රිය පිලිබඳව වැදගත්ම සූත්‍රයකි. එහි සඳහන් පරදි කය සුවපත් කරනහා කය ආරක්ෂා කරන බලවත්ම ගාඩ් එකක් වශයෙන් එම සූත්‍රය ඉතා ප්‍රකටය. එහි සඳහන් පරිදි කරුණු 11ක් ජීවිතය හා සම්බන්ධ වේ.

1. සුඛං සුපති (සුවසේ නිදයි)
2. සුඛං පටිභුඤ්ජති (සුවසේ නින්දෙන් පිබිදෙයි)
3.න පාපකං සුපිනං පස්සති (නපුරු සිහින නොදකියි)
4.මනුස්සානං පියෝ හෝති (හැම මිනිසුන්ටම ප්‍රිය වෙයි.)
5. අමනුස්සානං පියෝ හෝති (අමනුස්‍යයින්ට ද ප්‍රිය වෙයි.)
6.දෙවතා රක්ඛන්ති (දෙවියන් විසින් ආරක්ෂා කරයි.)
7.නාස්‍ය අග්ගි වා විසං වා සත්‍ථං වා කමති. (ගින්නෙන් විසෙන් ආයුධ වලින් අනතුරු නොලබයි)
8.තුවටං චිත්තං සමාධියති ( සිත එකඟ බර ගනී)
9.මුඛ වනෙනා විප්පසීදතී (මුහුණ පැහැයෙන් වෙයි)
10.අසම්මුල්හො කාලං කරෝති (නොබියව මරණයට මුහුණ දෙයි)
11. උත්තරිං අප්පටි විජ්ජනෙතා බ්‍රහ්ම ලොකූපගෝහොති (එම ආත්මයේදීම රහත් වීමට නොහකි වුවහොත් මෛත්‍රිය ධ්‍යාන උපදවාගත් විට මරණින් මතු බඹලොව උපදියි.)

අග්ගික්ඛන්ධොපම සූත්‍රය තුළින් බුදු රජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට දේශනා කළේ ලෝක වාසීන් දෙන දානය වැළඳීම හරියට ගිණි ගුලි ගිලීමක් හා සමාන බවය. නමුදු බුදු රජාණන් වහන්සේ එයින් ගැලවෙන ක්‍රමය ද දේශනා කළහ. යම් භික්ෂුවකට අසුරු සැනක් ගසන ස්වල්ප කාලයක් සමුදු සියලු සතුන් කෙරෙහි මෙත් සිත වඩයි නම් හෙවත් මෛත්‍රී කෙරේ නම් එම භික්ෂුව හිස් නොවන බවත්, ශාස්තෘත්වයත් අවවාදත් පිළිගන්නෙකු බවත් දේශනා කළහ. ඒ අනුව භික්ෂුත්වය වුවද ආරක්ෂා කෙරෙන මාර්ගයක් වශයෙන් මෛත්‍රී වැඩීම පෙන්වා දිය හැකිය.

ඛන්ධ පිරිත තුළින් දේශනා කරන ඇත්තේ විශේෂයෙන් සර්පයින් ඇතුලු සතාසිව්පාවුන්ට මෛත්‍රි කිරීමේ ක්‍රමයකි. බුදු රජාණන් වහන්සේගේ කාලයේදී එක් භික්ෂුවක්ට සර්පයෙක් දෂ්ඨ කිරීම නිමිති කර ගෙන දේශනා කළහ. එහිදී බුදු හිමි සඳහන් කරන්නේ එම භික්ෂුව සිවු නා රද කුලයන් වෙත මෛත්‍රී කර නැති බවයි. එනම්, විරූපාක්ෂ, ඒරාපථ, ඡබ්‍යාපුත්ත, කණ්හා ගෝතමක යන නාග රාජ කුල සතර කෙරෙහි මෛත්‍රිය කළ යුතු බවයි.

තවද පා නැති සතුන්, දෙපා සතුන්, සිව්පා සතුන්, බහුපා සතුන් ආදී සියලු සත්ව කොට්ඨාශයන් උදෙසා ද සියලු භූතයන් උදෙසාද මෛත්‍රී වඩා ඔවුන්ගෙන් කරදරයක් නොවේවාකියා පැතීම කළ යුතුය. භික්ෂුවක වනාන්තරයකට ගියද, ගල් ගුහාවකට ගියද, සුන්‍යගාරයකට ගියද ඒ ඕනෑම තැනකදී තම ශරීරය ආරක්ෂා කර ගන්නා ක්‍රමය මෛත්‍රිය ඇතුලත් විවිධ සූත්‍ර තුළින් පැහැදිලි කර දී ඇත.

මිත්තානිසංස සූත්‍රය තුළින් මිතුරන් සම්බන්ධ කරගෙන මෛත්‍රිය ප්‍රගුණ කිරීම දේශනා කොට ඇත. තේමිය කුමරාව සොහොනට ගොස් වළලා දැමීමට ඔහුගේම පියා අණ කිරීමෙන් තේමිය කුමරා සොහොනට ගිය රියදුරා ප්‍රමුඛ පිරිසට මිත්‍ර ද්‍රෝහී නොවීමේ විපාක පෙන්වා දීමක් සිදු කරනු ලබයි. එහිදී පැහැදිලි වන්නේ මිත්‍ර දෝහි නොවීමෙන් විපාක පෙන්වා දීමක් සිදු කරනු ලබයි. එහිදී පැහැදිලි වන්නේ මිත්‍ර ද්‍රෝහී නොවීමෙන් සොරසතුරු බියක් නොවී භවභෝග සම්පත් ලැබී සමාජයේ කීර්ති ප්‍රසංසා වලට ලක් වෙමින් නිවසක සමඟියෙන් සතුටින් ජීවත් වන අතරම දෙවියෙකු මෙන් බැබලීමට ලක් වන බවයි.

කරණීය මෙත්ත සූත්‍රය තුළින් පැහැදිලි කර ඇත්තේ අමනුෂ්‍යයින්ගෙන් වන අනතුරු ආබාධ දුරු කර ගැනීමට මෛත්‍රිය ප්‍රගුණ කර ගන්නා ආකාරයයි. එවකට භික්ෂූන් වහන්සේලාට භාවනා කිරීමේදී පැන නැගුණ අමනුෂ්‍ය කරදරයන් හේතුවෙන් බුදු රජාණන් වහන්සේ මෙම සූත්‍රය දේශනා කොට ඇත. පණ ඇති, බිය වන හෝ නොවන, මධ්‍යම ප්‍රමාණයේත්, කෙට්ට කුඩා, තර ආදී සත්ව කොට්ඨාශයෙන්ද ඇසට පෙනෙන, ඇසට නොපෙනෙන, දුර වසන්නා වූද, ආදී මුළු විශ්වයටම පැතිරෙන අයුරින් මෛත්‍රීය වැඩීම ඉතා ප්‍රථිඵල දායක බවය. සිව් දිසාවම හසුවන සේ එය කළ යුතුය. සිටිමින්, ඇවිදිමින්, හිඳිමින්, සයනය කරමින් යන හැම ඉරියව්වෙන්ම එය කළ යුතුය.

බුදු රජාණන් වහන්සේ යුතුකම් හ වගකීම් පිළිබඳ සිඟාලොවාද සූත්‍රය තුළින් දේශනා කිරීමේදී ගිහි කොටසින් පැවිද්දන් උදෙසා ඉටුවිය යුතු යුතුකම් අතර,

මෛත්‍රී සහගත කාය කර්මයෙන්
මෛත්‍රී සහගත වාක් කර්මයෙන්
මෛත්‍රී සහගත මනෝ කර්මයෙන්

වශයෙන් යුතුකම් තුනක් පිළිබඳ හඳුන්වා දී ඇත. එහිදී මෙම මෛත්‍රීය ත්‍රිවිධරද්වාරයෙන්ම කළ යුතු දෙයක් බව පැහැදිලි වේ. අද බොහෝ දෙනෙක් අසන ප්‍රශ්නයක් වන්නේ මෛත්‍රී කළාට ඉහත සඳහන් කළ ප්‍රතිඵල ලැබිය නොහැකි බවයි. එයට හේතුව මෛත්‍රීය හරියාකාරව නොවැඩීමය. කරණීය මෙත්ත සූත්‍රය තුළින් බුදු හිමි පහදා දී ඇත්තේ,

'මාතා යථා නියං පුත්තං
ආයුසා ඒක පුත්ත මනුරක්ඛෙ
ඒවම්පි සබ්බ භූතේසු
මානසං භාවයේ අපරිමාණං'

මවක් යම් සේ තම එකම පුත, තම ආයුෂ සේ රකීද, එසේම සියලු සත්ත්වයන් කෙරෙහි අප්‍රමාණ වූ මෙත් සිත් පතුරන ලෙයසි.

අද සිදු වන්නේ මෛත්‍රීය කිරීම ආලය කරන ආකාරයෙන් සිදු කිරීමය. ආර්තමාර්ථකාරීත්වයෙන් කරන මෛත්‍රීයෙන් ප්‍රථිපල නොලැබේ. අද බොහෝ දුරට මම - මගේ, අප අපේ කියන තැනට මෛත්‍රීය කිරීම සීමා වී ඇත. එනිසා නිවසින් එහාට මෛත්‍රිය පැතිරෙන්නේ පටු පරමාර්ථයන් සමඟය. ආත්මලාභය උදෙසා සමහරු මෛත්‍රී කරති. සමහරු එය විලාසිතාවක් වශයෙන් සිදු කරති. ලෝකයාට පෙන්වන්නේ භාවනාවෙන් ඉහළම තැනක සිටින ආකාරයකි. නමුදු තම සේවකයාට අසරණ අයට, දුබල අයට ඔහුගේ මෛත්‍රියෙන් ඵලක් නැත. එනිසා බුදුරජාණන්වහන්සේ දේශනා කළ අයුරින් මෛත්‍රී කිරීමට අප උත්සාහවත් විය යුතුය. එවිට අප කිසිදු බලවේගයකට පැරදවිය නොහැක. එලෙසම විශාල ආරක්ෂාවක් ද තමා වටා ගොඩ නැගෙනවාට කිසිදු සැකයන් නැත.

මෛත්‍රී නැමැති වෛරස් ගාඩ් එක පැළඳ මුළු විශ්වයෙම සැරි සැරුවත් කරදයක් කිරීමට කිසිවෙකුට අපහසුය. එය නියම විධියට සිදු නොවීම නිසා අප වෙනත් ආරක්ෂා ක්‍රම භාවිතා කිරීමට වෙර දරමු. වෙනත් ආලේපන මඟින් ශබ්රය ලස්සන කර ගැනීමට උත්සාහ කරමු. එය කෙටි වේලාවකට සීමා වූවකි. නියම ලෙස මෛත්‍රී භාවනාව ප්‍රගුණ කිරීමෙන් අපට ආරක්ෂාව හා ලෞකික සැප සම්පතුත් ලැබීමට පුළුවන. එබැවින් අප අපගේ ආරක්ෂාව සලසා ගත යුතු බැවින් මෛත්‍රී භාවනාව වඩා සියලු බාහිර බලවේග වලින් වැළකීමට උත්සාහ කරමු.

කොබෙයිගනේ පුබ්බිලිය ශ්‍රී සාරානන්ද පිරිවනේ ආචාර්ය
ගලේවෙල පුවක්පිටිය ශ්‍රී බෝධිරාජාරාමයේ
ගලගෙදර රතන වංශ හිමි.

# පිරිතෙහි ගුණ

කරණීය මෙත්ත සූත්‍රය - බූනාටු, තලාටු, දේව කෝප සංසිදවා දියුණුව කරා යන මඟ සුභ ලකුණු කියයි.

බන්ධ පරිත්තය: බිහිසුණු සර්ප කුල හතරක් ඇතුළු තිරිසන් ගත සියළු සතුන්ගෙන් රැකවරණ කරයි.

රතන සූත්‍රය : තෙරුවන් ගුණ මහිමයෙන් තුන් බිය දුරු කර ආරක්ෂාව සපුරා දෙයි.

මෙත්තානිසංස සූත්‍රය : කලකිරුණු දෙවියන්ගෙන් අමනුෂ්‍යයන්ගෙන් විය හැකි උවදුරු වලකාලයි.

වැසි පිරිත : නියං කල්හි වැසි ලබා ගැනීමට කරන ප්‍රාර්ථනාවකි.

මිත්තානි සංල සූත්‍රය : රාජ්‍ය සමාජ සහ පස මිතුරු බාධා හිරිහැර වලකා ජයග්‍රහණය ලබා දෙයි.

ධජග්ග පරිත්තය : භය, තැති ගැන්ම, හදිසි අනතුරු වලකා ආරක්ෂා කරයි.

ඣමෝරා පරිත්තය : පරිසරය සුරක්ෂිත කර ජීවන බාධා බැහැර කරලයි.

ඡන්ද පරිත්තය : සතුරු ග්‍රහණයෙන් මිදීමටත්, ආරක්ෂාව ඇති කිරීමටත් උපකාරී වේ.

ගරිමාන්න්ද පරිත්තය : පරිසර දූෂණයෙන් වැලදෙන රෝග වලකා සුවය ලබා දෙයි.

අංගුලිමාල පිරිත : ගැබිණි මව්වරුන්ට හා කුසෙහි බිළිඳුනට ආරක්ෂාව සලසයි.

ආලවක සූත්‍රය : යක්ෂ, භූතාදීන්ගෙන් සිදුවන විපත් උවදුරු දුරුකොට සෙත සාදා දෙයි.

**භාග්‍යා එම්. හේරත්**
**කැකිරාව**

# මැදුම් පිළිවෙතට අනුව හැඩ ගැසෙන්නේ නම්......

අපේ අමා මැණී ගෞතම බුදුරජාණන් වහන්සේ ඉතාමත් නිවැරදි අර්ථ සහිත සුපිරිසිදු, ශීල, සමාධි, ප්‍රඥා යන ත්‍රිලක්ෂණයෙන් යුක්ත ආර්ය අෂ්ඨාංගික මාර්ගය නොහොත් මධ්‍යස්ථ පිළිවෙත දේශනා කළ සේක.

මෙම මාර්ගය පිලිපැදීමෙන් අපට ධර්මාවබෝධය ලබාදේ. කෙලෙස් සංසිඳුවා, සත්තිස් බෝධි පාක්ෂක ධර්ම වැඩී, අවබෝධ ඥානය සේම චතුරාර්ය සත්‍යය අවබෝධය තුළින් උසස් ජීවිත ගත කිරීමට මෙන්ම, නිවන් අවබෝධ කර ගැනීමට ද ඉවහල් වේ.

ලෝභ ද්වේශ, මෝහ මුදල් කරගත් සිතිවිලිවලින් පුහුදුන් සිත පිරී පවතී. ඉන් මිදී අලෝභ, අදෝස, අමෝහ කුසල් සිත පිරිසිදු කිරීමට ප්‍රයත්න දැරිය යුතුයි. බුදුරජාණන්වහන්සේ උගන්වා වදාළ මැදුම් පිළිවතෙ නම් වූ ජීවක දර්ශනය නූතන සමාජගත ගැටලු විසඳා ගැනීමට කදිමය. මධ්‍යම ප්‍රතිපදාවට අනුව සිත හැඩගස්වා ගන්නා පුද්ගලයාගේ ජීවන දර්ශනය ඒ අනුව සකසා ගත හැකි වන්නේය.

මේ අනුව සම්ම දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි යන ප්‍රතිපදා අංග අට මනස තුළ සංවර්ධනය කර ගත හැක. ඒ තුළින් පුද්ගල ජීවිතයේ ගැටළු මෙන්ම සමාජගත ජීවිත ගැටළුවලට සාධාරණ විසඳුම් පහසුවෙන් සොයා ගත හැක.

මැදුම් පිළිවෙතට අනුව නිවැරදි දැක්ම ජීවිතයක හැම අංශයක් කෙරෙහිම බලපායි. පවුල් ජීවිත ගත කිරීමේදී තම වගකීම් හා යුතුකම් නොපිරිහෙලා ඉටුකිරීමේදී ද මෙම මධ්‍යම ප්‍රතිපදාව ප්‍රායෝගිකව ජීවිතයට සම්බන්ධ කර ගැනීමට පිලිවෙන. යහපත් ජීවිතයකට වුවමනා කරන්නාවූ ප්‍රතිපත්ති සිඟාලෝවාද සූත්‍රය සහ පරාභව සූත්‍රයේ ඉතා පැහැදිලිව දක්වා ඇත.

විනාශකාරී ක්‍රියාවන්හි නිරතව සිටින වත්මන් ලෝකයටම මෙම මැදුම් පිළිවෙත අනුගමනය කරන්නේ නම් ආචාරශීලි, ධාර්මික මෙන්ම සහනශීලි සමාජයක් ගොඩ නඟා ගත හැකි වන්නේය.

මෙහිදී නිවැරදි දැක්ම, නිවැරදි සංකල්ප, හොඳ වචන, යහපත් කර්මාන්ත, යහපත් ජීවන පැවතුම්, යහපත ව්‍යායාමය, හොඳ සිහිය, හොඳ චිත්ත ඒකග්‍රතාවය යන මේ සියලු කරුණු පුද්ගල ජීවිතයටත්, සමාජයටත් සම්බන්ධ කර ගැනීම මානව සංහතියේ පැවැත්ම කෙරෙහි ප්‍රභල බලපෑමක් කළ හැකි සාධකයකි. බුදු දහම උගන්වන මධ්‍යම ප්‍රතිපදා දර්ශනය, නිවන් දැකීම සඳහා පමණක්ම නොව ගිහිජීවිතයේ යහපත් පැවැත්ම උදෙසා ද අදාළ කරගත හැකිය.

**චවින්ද්‍රා වෛද්‍යරත්න - කුරුණෑගල**

# රජෙක් වන්න මව්පියන් නමදින්න.

උගතෙක් වන්න. බුද්ධිමතෙක් වන්න. දියුණුවන්න රජෙක් වන්න මව්පියන් වන්දනා කරන්න.

දස මාසෙ උරෙ කත්වා
පෝසේසි වුද්ධිකාරණං
අයුදීගං වස්ස සතං
මාතු පාදං නමා මහං

වුදධි කාරො ආලිං ගිත්වා
චුම්බිත්වා පිය පුතතකං
රාං මජජං සුප තිටඨං
පීතු පාදං නමා මහං

මෙම ගාථාත්‍රයන් පල දරන්නේ මව්පියන් ජීවත්ව සිටි කාලයේදී පමණයි. ආදරයෙන් කරුණාවෙන් මව්පියන් වන්දනා කිරීමෙන් මව්පියන්ගෙන් ආශිර්වාදය ලබාගන්නා විට හදවතට ඇතිවන සතුට කියා නිම කළ නොහැකිය. මව්පියන් විසින් හිස අතගා දෙවුර පිරිමැද ඣීත් පිරිමැද කරනු ලබන ආශිර්වාදය ඔවුපියනීගේ ලේ, මස්, ඇට, ඇට මිදුළු වලින් මතුවවන ආදරය කරුණාව මෛත්‍රීය හද පතුලින්ම නැගෙන මානුෂික ගුණයයි.
දරුවන් ලොකු මහත් වූ කල ඔවුන් දෑතට වඩාගත නොහැකිවූ බඹයක් විතර මිනිසෙකි. සිරුර පිරිමදිති. තුරුලු කරගනිති. කෙතරම් ලොකු වුවත් දරුවන්ව ජීවත්ව සිටිනා තුරු කුඩා දරුවන් ලෙස හදවතට දනෙති. කෙතරම් කාලයක් ගතවුවත් මව්පියන් වන්දනා කරන්න. ඔවුන් වයසට ගිය කළ නොසලකා හැරියොත් ඔබට එහි එල විපාක ලැබෙනුයේ කල් යාමේදීය.
මව්පියන් වයස්ගතවූයේ ඔබගේ සිරුර මනස ඇති දැඩි කිරීමට ගත් වෙහෙස නිසාය. එදා ලස්සන සියුම්, හැඩි දැඩි ශක්තිමත් දෑත් දෙපා අද වෙව්ලන දුර්වල දුර්වර්ණ බවට පත්වූයේය ඔබගේ වැඩීමට උගැන්වීමට උදෙසා ගත් උත්සාහය නිසා බව සිතන්න. 'අග්බෝ රජු මැණියන්ට සැලකූ අයුරු ඔබ සිහියට ගන්න.
මවගේ පියාගේ ශක්තිය ධෛර්යය උත්සාහය උනන්දුව අද ඇත්තේ ඔබ ලඟයි. එම සියලුම හැකියාවන් අස්වැන්නේ පල
ඔබට දී ඇත. ඔවුන්ට අද ඇත්තේ දුර්වලවී ගිය සිරුරකි. එහෙත් ඔබලාට ආශිර්වාදයෙන් ලබාගත හැකි නිධානයක් ඔවුන් සතුව ඇති බව සිතන්න. එය ඔබට ලබාගත හැක. එදා ඔබව පෝෂණය කළ ඔවුන් අද ඔබ පෝෂණය කර රැක බලාගන්න.
සම්බුද්ධත්ව ජයන්තිය උදාවී ඇති මේ අවස්ථාවේ ඒ ගැන සිතන්න. සතියේ දවසක් ඔවුන් වෙනුවෙන් වෙන් කරන්න. කාලය සාදා ගන්න. දෙමව්පියන් ලඟට යන්න. වතුර උණුකර නාවන්න. සබන් ගා කුණු අතුල්ලා සිතේ සතුටින් කුඩා දරුවන්සේ නාවන්න. රෙදි පිළි ඇඳ ඇතිරිලි කිලිටි වී ඇති සියලුම අපිරිසිදු දෑ පිරිසිදු කරන්න. ඔවුන් සිටින ස්ථානය බුදුමැදුරක් සේ පිරිසිදු කරන්න. සුවඳවත් කරන්න. රසවත් ආහාර නැතත් රෝගයක් අනුව සුදුසු කෑම බීම දීත්මන් කැවීමෙන් කුසගිනි නිවන්න. බෙහෙත් ආදිය දෙන්න. අත්පා වේදනාව අසා බලා තෙල් බෙහෙත් ගල්වා පිරි මැද ගත සිත සනසවන්න. ළදරුවෙකුට කරනු ලබන සත්කාර සිතා ඔවුන් සනසන්න. සුදු රෙදි කඩක් දෙපා මුල තබා දෙපා අල්ලා වන්දනා කරන්න. එවිට ඔවුන්ගේ හද පතුලේ ඇති අගනා ධනය ලබා ගත හැකිය. මව්පියන් හද පතුලින් කරනු ලබන ආශිර්වාදය මැද ඔවුන්ගේ දෙනෙත් වලින් ගලන කඳුළු කැට ඔබගේ හිසට වැටේවි. පිට මැදට වැටේවි. ඔවුන්ගේ හදවතේ ඇති නිමක් නැති ආදරය කරුණාව මෛත්‍රීය මගේ දරුවන්ට වැඩි වැඩියෙන් ලැබේවා! දඅයුණුවෙන් දියුණුව පත්වේවා! සම්මා සම්බුදු සරණයි! තුන් සරණින් දෙවි රැකවරණින් නිදුක් නීරෝගී වේවා! සුවපත් වේවා! නිමක් නැති ආශිර්වාදයෙන් ඔබේ කන් පිරේවි.
ඔබ ජීවිත කාලය තුළ මෙතෙක් හිරි හම්බ කළ රන් රිදී මුතු මැණික් වලට වඩා වටී, යැයි සිතට නැගේ. මේ ධනයත් අපට සසරේ ගෙනයා නොහැක. මව්පියන්ගේ ආශිර්වාදයෙන් ලැබූ ධනය සසරේ ගෙන යන්නට රැස් කළ හැකිය. ජීවිතය ඇති තුරාවට අපට මව්පියන් රැක බලාගත් කල ඒ අය නැති කල දුක්වීමට සිදු නොවේ.
ඌාදර බර මව්පියන් ඔබ හැර ගියත් ඔවුන් ඔබට පින් රැස් කර ගැනීමට පින්කෙතක් වී සිටිය බව සතුටු විය හැක.
මෙම ලිපිය කියවා බලා දරුවන් දහදෙනෙක් හෝ හොද මඟට හැරෙත්වා. ආදර මව්පියන්ට පුද සත්කාර කර සසරේ ගෙන යා හැකි පින් රැස්කර ගනිත්වා.



**ඇම්.ඩී. මාලතී ගුණතිලක**
**පොලොත්තරුව**

# නව වසරේ සිතුම් පැතුම් ඉටුකර ගනිමු



වසරක් ගෙවී නව වසරකට පාබන මේ අවස්ථාවේ ඉදිරි වැඩකටයුතු සාර්ථක කරගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ගයන් ගැන අවධානය යොමු කිරිම ඉතා වැදගත් වේ. බෞද්ධයන් ලෙස කල්පනා කළ යුත්තේ බුදු දහමට අනුව නිවැරදි ජීවිතයක් සකස් කර ගන්නා පිළිවෙල සකසා ගැනීමය. බෞද්ධයාගේ ජීවිතය ආරක්ෂා කරන ප්‍රධානම මෙවලම වන්නේ පංචශීල ප්‍රතිපත්තියයි.මෙම ශීල ප්‍රතිපදාව ගත්කළ බෞද්ධයන්ට පමණක් සීමා වූ දෙයක් නොවේ.එය සෑම මිනිස් කොට්ඨාසයකටම පිළිගත හැකි සර්ව සාධාරණ එකකි. මෙහිදී විශේෂයෙන් සාකච්චාවට භාජනය කරනු ලබන්නේ බෞද්ධ ජනතාවගේ ජන ජීවිතයයි. මෙම අවස්ථාවේ ඉපැරණි ධර්ම ග්‍රන්ථයක සඳහන්වන කරුණක් ගැන සිහිපත් කිරීම වැදගත්ය. දිනක් සක්‍ර දේවේන්‍ද්‍රයා මාතලී රියදුරා සමඟ ගමනක් යනවිට මනුලොව දෙස බලමින් තමා හුනස්නෙන් නැගිටිමින් ආචාර කරනු දක්නට ලැබුණි.මේ දුටු මාතලී රථාචාර්‍යයවරයා සක්‍ර දේවේන්‍ද්‍රයාගෙන් විමසා සිටින්නේ දෙදෙව්ලොවටම අධිපති ඔබවහන්සේ මෙලෙසින් හුනස්නෙන් නැගිට ආචාර කරන්නේ කවරෙකුටද යවන්නයි. එවිට සක්‍රදේවේන්‍ද්‍රයා පවසන්නේ,


යේ ගහට්ටා පුඤ්ඤකරා සීලවන්තා උපාසකා
ධම්මේන දාරං පෝසෙන්ති තංනමස්සාමි මාතලී

යම් තැනැත්තෙකු පින්කම් හි නියැලී සිටිමින් සීලවන්තවේද දැහැමිව අඹුදරුවන් පෝෂණය කෙරේද එබඳු තැනැත්තන් දුටුවිට මම නමස්කාර කරන්නෙමියි යනුවෙනි.

මෙයින් ප්‍රකාශවන අර්ථය වන්නේ මිනිස් ආත්මයක් ලැබූ කෙනෙකු තම ජීවිතය පවත්වාගෙන යා යුතු පිළිවෙලයි.තවත් තැනක දුලලභඤ්ච මනුසත්තං මෙයින් කියවෙන්නේ මිනිස් ආත්මයක් ලබා ගැනීම ඉතා දුර්ලභ වන බවයි. එවැනි මිනිසත් බවක් ලබාගත් අප ඒ සාර්ථක කරගන්නේ කෙසේද යන්නට පිළිතුරු සොයාගත යුතුය.බුද්ධෝත්පාද කාලයක උපත ලබා ගැනීමත් පූර්ව කුෂල කර්මයක විපාකයක් ලෙසටයි දහමෙහි සඳහන් වන්නේ උපන් මිනිසා අධාර්මිකව වසර ගණනක් ජීවත් වුවත් එය නොවටිනා බවයි දැක්වෙන්නේ දැහැමිව එක් දවසක් ජීවත් වුවත් එම ජීවිතය වටිනාකමක් ඇති බවයි දක්වා ඇත්තේ මෙම කරුණු පදනම් කරගෙන අප ලබාගෙන ඇති මනුස්ස ජීවිතය දැහැමිව සකස් කර ගැනීමට ක්‍රියා කල යුතුය. කන කැස්බෑවා වියසිදුරෙන් අහස බලන්නේ යම්සේද එපරිද්දෙන් මිනිසත් බවක් ලබා ගැනීම අති දුෂ්කරය. එබැවින් ජීවත්ව සිටින කාලයේදී මෙලොව සාර්ථක කර ගැනීමත් පරලොව සඳහා අවශ්‍ය දේ ඉටු කරගැනීමත් කළ යුතුවේ. මහාසච්චක සූත්‍රයේ දක්වා ඇත්තේ ගිහි සැප විදීම සෑම කෙනෙකුටම සිදුකළ හැකි බවයි. එහි දී සොරකම් කිරීම් වංචා කිරීම්, දූෂණය වැනි අපරාධ වලින් තොරව එය සිදුකළ යුතු බව පැහැදිලිව දක්වා තිබේ. ඒ සඳහා උට්ඨාන වීර්‍යයත් කල්‍යාණ මිත්‍ර සේවනයත් අවශ්‍යම වේ.

වසරක් ගෙවී නව වසරකට පා තබන මෙම අවස්ථාවේ තම ජීවිතයේදී මෙතෙක් සිදු වූ අඩුපාඩු හා වැරදි සකස් කරගෙන නිවැරදිව ඉදිරි ජීවිතය සාර්ථක කරගැනීමට අදිටන් කරගැනීම වැදගත් වන්නේය.

**විජය**



# දහමෙන් පෙන්වන විසඳුම්

ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනයෙන් 70% පමණ බුදු දහම අදහති. අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ මෙරට බුදු දහම ස්ථාපිත කර දූනට වසර දෙදහස් හයසීයක් ඉක්මවා ගොස් ඇත. මෙම අති දීර්ඝ කාල සීමාව මිනිස් සිත්සතන් තුළ බුදුදහමේ මූලික හරය නිවැරදිව හා ස්ථාවරව මුල්බැස ගැනීමට කාලය ප්‍රමාණවත් වේ. බුදුදහම හා බෞද්ධ සංස්කෘතිය ජීවන දර්හනය කොට ගත් බෞද්ධ පිරිසක් රට තුළ දක්නට සිටිය යුතුය. නමුත් එවන් බුද්ධිමත් පිරිසක් මේ දිවයිනනේ සැළකිය යුතු තරමින් නොමැති බව සඳහන් කළ යුතුමය. ජනතාවගේ ක්‍රියාකාරකම් විග්‍රහ කර බලන විට මැනවින් ඒ පිළිබඳව විදහා පෙනේ.

'නත්ථි මෙ සරණං අඤ්ඤං බුද්ධො මෙ සරනං වරං'

බුදු සරණ හැර අන් සරණක් මට නැත. ධර්මය හැර අන්සරණක් මට නැත. සංඝයා හැර අන්සරණක් මට නැත. යන ජීවන චක්‍රය පිළිපැදිය යුතු බෞද්ධයා වර්තමානයේ නානාවිධ ඇදහිලි හා භූත විද්‍යාව වැළඳ ගෙන ඇත. බුදු දහමත් භූත විද්‍යාවත් සමගාමී මාවතක් තුළ ගමන් නොකරන බැවින් දෙවියන් යදින්නා හෝ භූත විද්‍යාවේ නියැලෙන්නා කිසිදින බුදුසව්වකු නොවේ.

තථාගත දහමට අනුව නිවන් ලබන මඟ අතිශය සුන්දරය. ලෝකෝත්තර සුවය ගෙනදේ. පවතින සංකීර්ණ සමාජය තුළ මිනිසාගේ හදවත තෘෂ්ණාවෙන් පිරී ඉතිරී ඇත.

පුද්ගල සන්තානගත හා සමාජගත අර්බුධවපට පැහැදිළි විසඳුම් බුදුදහමේ දක්නට ඇත. ඕනෑම අර්බුදයක් සමනය කර ගන්නා ආකාරය බුදු දහමේ සඳහන්ය. බුදු සහමේ අවසාන පියවර නිවන වුවද ලෞකික ජීවිතය සාර්ථක කර ගන්නා අන්දමද බුදුදහමේ පෙන්වා දෙයි. ඒ නිසා බුදුදහම නිවැරදිව අධ්‍යනය කොට තම තමන්ගේ දෛනික ජීවිතය සාර්ථක ලෙස සකස්කර ගැනීමට උත්සහ කළ යුතුයි. 'ඔබ එබගේම පහනක් වන්න' 'තමාට පිහිට තමාමය' 'තමාගේ ගැලවුම්කරු තමාමය' පිරිසිදු වීම හෝ අපිරිසිදු වීම තමාගෙන්ම ඉටුවිය යුත්තකි. මෙම අනඟි බුදුවදන් වලට බෞද්ධයා අවංකවම ලංවිය යුතුවේ.

බුදුදහම එක් අංශයකින් දර්ශනයකි. මෙලොව ජීවන මඟ සාර්ථක කරගන්නා අන්දම ත්‍රිපිටකයේ විවිධ සූත්‍රවල දක්වා තිබේ. පුද්ගලයාට ස්වකීය ජීවිත කාලය තුළදී ජීවන ගැටළු ඇතිවන්නේ ඔවුන්ගේම වැරදි ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙසයි. ඒවාට විසඳුම් ලබාගැනීමේදී තමා දෙසටම විමසුම් ඇස යොමුකරවීම යෝග්‍ය වේ.

සිත, කය, වචනය පාලනය කරගනිමින් ක්‍රියා කරන්නාට මතුවන අර්බුධ අල්පය. ධම්මචාරීව ජීවනමඟ සකස්කරගතහොත් පැන නඟින ජීවන අර්බුධ දුක් පීඩා මඳ වේ. යහපත් ලෙස සිතමින් ශිෂ්ඨ වචන කථා කරමින් යහපත් ලෙස ක්‍රියා කරන්නාට ඉදිරි ගමන සුවදායක කරගැනීමට පිළිවන.

මිනිසත් බවක් ලැබීම දුෂ්කර කටයුත්තකි. ඉතාමත් අපහසුවෙන් ලබාගත් මෙම මිනිසත් බව නැමති සම්පත්තිය පිළිබඳව චිත්ත සන්තානය තුළ කිසියම් වූ වැටහීමක් අවබෝධයක් ඇති කර මෙලොව හා පරලොව ජීවිත සාර්ථක බවට පත් කර ගැනීමට අවකාශ ලැබෙන බව පෙන්වා දියහැකිය.

**පූජ්‍ය මෙත්තානි අසේකා මෙහෙණින් වහන්සේ**

# මූලාශ්‍ර

ලංකා ඉතිහාසය ගොඩනැගීම සඳහා පාදක කොටගන්නා මූලාශ්‍ර සාහිත්‍යමය හා පුරා විද්‍යාත්මක ලෙෂ කොටස් දෙකක් වේ. මෙම මූලාශ්‍ර දෙකින් පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර වලින් ලැබෙන තොරතුරු බොහෝ දුරට විශ්වසනීයත්වයට ලං වන බැව් පෙන්වා දිය හැක. ඊට හේතුව සාහිත්‍යමය මූලාශ්‍ර බොහෝ විට සුළු සිද්ධීන් වටා ගෙතුණු ප්‍රබන්ධවීමත් පුරා විද්‍යාත්ම මූලාශ්‍ර යම් කිසි සිද්ධියක් බොහෝ දුරට ඒ අයුරින්ම ඉදිරිපත් කරන වාර්ථාවක් වීම නිසා යයි දැක්විය හැක. බොහෝ අවස්ථා වලදී සාහිත්‍ය මූලාශ්‍ර රචනා කිරීමේදී එම ග්‍රන්ථ කර්තෘවරුන්ගේ පෞද්ගලික රුචි අරුචිකම් හා ඔවුන් වාසය කළ වටපිටාව වැනි කරුණු එම රචනාවන්ට බලපා ඇත. ඒ නිසා ඒවායේ අන්තර්ගත ඓතිහාසික බීජය වටා නොයෙක් කරුණු ගෙතී ඇති බව දක්නට ලැබෙන කරුණකි. එහෙත් පුරා විද්‍යාත්මක මූලාශ්‍රවල එවැනි තොරතුරු දක්නට ලැබෙන්නේ නැති තරම්ය.

එසේ වුවද පොදුවේ සලකන විට දිවයිනේ අඛණ්ඩ සාහිත්‍යමය මූලාශ්‍ර බව පෙනේ. එසේ අවිච්න්න ඉතිහාසයක් ගොඩනැගීම සඳහා පුරා විද්‍යාත්මක මූලාශ්‍ර ද බෙහෙවින් උපකාරී වන බැව් පෙනේ. මේ පිළිබඳව කරුණු විමසා බැලීමේදී පළමුවෙන්ම සාහිත්‍ය මූලාශ්‍රවල අන්තර්ගත ඇතැම් කරුණු වල සත්‍යතාවය නිශ්චය කරගැනීමට පුරා විද්‍යාත්මක මූලාශ්‍ර මහෝපකාරී වේ. දෙවනුව සාහිත්‍ය මූලාශ්‍ර වල සඳහන් සදොස් තැන් නිදොස් කරගැනීමට ද ඒවා පිටිවහලක් වේ. තෙවනුව සාහිත්‍ය මූලාශ්‍ර වල අන්තර්ගත නොවන කරුණු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රවලින් ලබාගත හැකි හෙයින් සාහිත්‍ය මූලාශ්‍ර වලට ඌණ පූරක වශයෙන් පුරා විද්‍යාත්මක මූලාශ්‍ර උපයෝගී කරගත හැකිවේ.

ඊළඟට ලක්දිව අඛණ්ඩ ඉතිහාසයක් ගොඩනඟා ගැනිමේදී ඉවහල්වන ප්‍රධාන සාහිත්‍යමය හා පුරා විද්‍යාත්මක මූලාශ්‍ර කිහිපයක් පිළිබඳව විමර්ෂණයක යෙදීම උචිත යයි සිතමි.

මේ නයින් සලකන විට සාහිත්‍යමය මූලාශ්‍ර වශයෙන් පාලි වංශ කතා ඉතා වැදගත් වේ. යම්කිසි රටක හෝ පුද්ගලයන්ගේ හෝ පුද්ගලයෙකුගේ හෝ යම්කිසි වස්තුවක හෝ වනත් එවැනි දෙයක හෝ පරම්පරාගත කතා විස්තර කරණු ලබන ග්‍රන්ථ වංශකතා ලෙස හඳුන්වා දිය හැක. මෙම වංශකතාවල විද්‍යාමාන වන ප්‍රධාන ලක්‍ෂණයක් නම් ඒවා මුඛ්‍ය වශයෙන් බුදුසමය හා අනුරපුර රජපවුල වටා ගෙතී තිබීමයි.

එබැවින් මේවායේ අංග සමුපූර්ණ ඉතිහාසයක් ගොඩනගා ගැනීම සදහා අවශ්‍ය දත්ත සපයන මූලාශ්‍ර වශයෙන් සැලකිය හැකිය. මෙම වංශකතා හා සම්බන්ධ තවත් වැදගත් කරුණක් නම් මේවා බෞද්ධ භික්‍ෂූන් වහන්සේලා අතින් රචනා වී තිබීම නිසා ආගමිකත පක්‍ෂයට ගැඹුරු ව රචනා තිබීමයි.

දැනට ශේෂ වී පවතින වංශකතා ඒවා රචිත භාෂාව ගැන සලකන විට පාලි වංශකතා හා සිංහල වංශකතා යනුවෙන් කොටස් දෙකකට වෙන්කර දැක්විය හැක. මෙයින් පාලිවංශ කතා අතර දීපවංශය,ත මහා වංශය, ථූප වංශය, ධාතු වංශය, සිංහල ථූප වංශය, දළදා සිරිත, හා රාජාවලිය යන ග්‍රන්ථ වැදගත් ඒවා ලෙෂ සැලකිය හැක. මෙයින් දීප වංශය හා මහාවංශය ක්‍රි.ව 4 වන සියවසේ සිට 56 වන සියවස දක්වා කාලයේ දී ලියවී ඇත. දැනට ලැබී ඇති පැරණිතම ශ්‍රී ලාංකික ග්‍රන්ථය වනුයේ දීප වංශයයි. ඇතැම් අය මහා වංශ වූ කලී දීප වංශයේ අට්ඨකතාව යැයි දක්වති. එසේ අදහසක් ඇතිවීමට තරම් මෙම ග්‍රන්ථ දෙක අතර සාම්‍යයක් දක්නට ලැබේ. පරිච්ඡේද 22 කින් සමන්විත දීපවංශයේ බුදුරජාණන් වහන්සේගේ චරිතයේ එන සමහර සිදුවීම්ද උන්වහන්සේගේ ලංකා ගමනය යන කරුණු විස්තර කිරීමෙන් පසුඅව විජය රජුගේ රාජ්‍ය සමයේ සිට මහසෙන් රජතුමාගේ රාජ්‍ය කාලයේ අවසානය දක්වා තොරතුරු රැසක් විස්තර කිරීමට උත්සහ දරා ඇත. විජය රජුගේ සමයේ සිට මහසෙන් රජතුමා දක්වා ශ්‍රී ලංකා රාජනාමාවලිය ඒ ඒ රජු හා සම්බන්ධ වැදගත් තොරතුරු සමහරක් සමඟ මෙහි දක්වා ඇත. එම කරුණු ඉදිරිපත් කිරීමේදී ජනකතා හා ජන විස්වාස ආදිය පදනම් කොටගෙන ඇති අතර ඓතිහාසික කරුණු සංස්කරණය නොකොට ඒ අයුරින්ම මෙම ග්‍රන්ථයේ ඉදිරිපත් කොට ඇත.

දීපවංශය මහා වංශයට වඩා ප්‍රමාණයෙන් කුඩා වුවත් එහි අන්තර්ගත ඇතැම් කරුණු මහාවංශයේ දක්නට නොලැබේ. මහා සම්මත රාපරම්පරාවට අයත් ඇතැම් රජවරුන්ගේ නම් ප්‍රථමධර්ම සංගායනාවේදී ධර්මය පිටක වශයෙන් සංගායනා කිරීම, පණ්ඩාවාසදේව රජුගේ පුතුන් දස දෙනාගේ නම් සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමඟ වැඩම කළ අවශේෂ භික්‍ෂුණීන් වහන්සේලාගේ නම් ආදිය එවැනි ඓතිහාසික කරුණු කිහිපයක් වේ. මෙම කෘතිය විධිමත් සැලසුමකින් තොරව රචනා කරන ලද ග්‍රන්ථයක් වීම නිසා දෝ ඇතැම් තැනක පරස්පර විරෝධී තොරතුරු අඩංගු කොට ඇත. රුවන්වැලි මහා සෑය හා ලෝවා මහා ප්‍රාසාදය දුටුගැමුණු රජතුමා විසින් කළ බැව් එක් තැනක සදන් වන අතර තවත් තැනක එමස්ථාන සද්ධාතිස්ස රජතුමා විසින් කරන ලද බැව් සඳහන් වීම ඊට නිදසුන් ලෙස දක්වා ලිය හැක.

එසේ වුවද ලංකාවේ අඛණ්ඩ ඉතිහාසය ගොඩනැගීමේදී සුවිශේෂී වූ කාර්යභාරයක් ඉටුකරන ග්‍රන්ථයක් ලෙස මහාවංශය දක්වාලිය හැක. ඉතිහාසඥයින්ගේ අදහසට අනුව ක්‍රි.ව 5 වන සියවසේ විසූ අනුරපුර දික්සඳ සෙනෙවියා පිරිවෙනෙහි අධිපති ධාතුසේන රජතුමාගේ මාමා කෙනෙකු වූ මහානාම හිමියන් විසින් මහාවංශය රචනා කළ බව සඳහන්වේ. මහාවංශය නමින් හඳුන්වනු ලබන්නේ පළමු පරිච්ඡේදයේ සිට 37 වන පරිච්ඡේදයේ 52 වන ගාථාව හෙවත් ආරම්භයේ සිට (ක්‍රි.පූ 6 වන සියවස) පමණ සිට මහසෙන් රජතුමාගේ රාජ්‍ය කාලය අවසානය (ක්‍රි.ව 301)දක්වා වූ කාලපරිච්ඡේදය අළෙලා මහානාම හිමි විසින් රචනා කරන ලද ග්‍රන්ථය ලෙසට ද මතයක් විද්වතුන් අතර ඇත. එහෙත් ඇතැම් අය 37 වන පරිච්ඡේදයේ සිට ඉදිරියට ලියා ඇති කොටස චූලවංශය ලෙස හැඳින්වීමට පෙළඹී ඇත. මහානාම හිමියන් රචිත මහාවංශයේ මුල් කොටසෙහි බුදුරජාණන් වහන්සේලාගේ සහ රහතන් වහන්සේලාගේද ප්‍රධාන රාජවංශයේද ඉතිහාසය කියැවෙන නිසා එය මහාවංශය ලෙස අර්ථගැන්වූ බව මහාවංශ ටීකාවෙහි සඳහන් වේ.

එවකට රචනා වී පැවැති වෙනත් මූලාශ්‍රවල ආභාෂ ලබා මහානාම හිමි විසින් රචනා කරන ලද මහාවංශයෙන් මූලික අරමුණ වී ඇත්තේ බුද්ධ ශාසනයත් අනුරපුර රාජධානියේත් යම් යම් කරුණු ඉදිරිපත් කිරීම බව පෙනේ. එසේ ඉදිරිපත් කිරීමේදී මහා විහාර සම්ප්‍රධාය එම ග්‍රන්ථයෙහි ඉස්මතු වී ඇති බවත් දෘශ්‍ය මානවේ. මීට එක් උදාහරණයක් ලෙස දුටුගැමුණු රජතුමාගේ චරිතය දැක්විය හැක. එම ශ්‍රේෂ්ඨ නරපලුන්ගේ චරිතය වඩාත් තීව්‍ර කර පෙන්වීමේ අභිලාශයෙන් මහාවංශ කතුවරයා එම චරිතයට වැඩි ගාම්භීරත්වයක් ආරෝපණය කළ අතර එම චරිතය ආකල්පයක් දක්වා ඇතිබැව් පෙන්වා දිය හැක. බුදුසමය දිවයිනේ ස්ථිර වශයෙන් පිහිටුවීමට ක්‍රියාකළ ප්‍රථම වීරචරිතය දුටුගැමුණු රජු නිසා යුගයේ වීරයා වශයෙන් දුටුගැමුණු රජු තෝරා ගෙන ඇති අතර ලංකාවේ ආර්ය ජනාවාස ආරම්භ කළ වීරයා වශයෙන් පණ්ඩුකාභය රජුට විශේෂ සැලකිල්ලක් දක්වා ඇත. මෙම ඉහත රජවරුන් දෙදෙනාම පැවැති සමාජ සම්මතය පිළිබඳ සැලකිලිමත්වූ මහානාම හිමි එම දෙදෙනාට මහා වංශයේ විශේෂ ස්ථානයක් දීමට පෙළඹුනේ එම සමාජ සම්මතයට ගරුකිරීමක් වශයෙන් යයි කිව යුතුය.

මහාවංශය සඳහා යම් යම් කරුණු හා විස්තර සෑහෙන ප්‍රමාණයක් අභිලේඛන හා වෙනත් පුරා විද්‍යාත්මක සාදක වලින් අනාවරණය වී ඇත. දිවයිනේ එවකට පැවති වාරි තාක්‍ෂණය, කෘෂිකර්මය, වාණිජ ක්‍රම සමාජ ව්‍යුහය, හා එහි ක්‍රියාකාරිත්වය යන අංශ හැදෑරීමට අවශ්‍ය වන තොරතුරු සපයන වංශ කතා සාහිත්‍යයේ අග්‍රගණ්‍යයේ කෘතියක් ලෙස මහා වංශය සැලකේ.

මහාචාර්ය ගයිගර් මහතාට අනුව මහාවංශයේ 37 වන පරිච්ඡේදයේ සිට ඉදිරියට ඇති කොට චූලවංශය ලෙස දක්වා ඇති අතර මෙය මහා වංශය රචනා කිරීමෙන් අවුරුදු 700කට පසුව ලියා ඇති බව සඳහන් වේ. මෙහි මහා වංශයේ 38 වන පරිච්ඡේදයේ සිට 79 වන පරිච්ඡේදය දක්වා විස්තර ඉදිරිපත් කොටඇත. ඊළඟ කොටස 80 වන පරිච්ඡේදයේ සිට 90 වැනි පරිච්ඡේදය දක්වා රචනා කොට ඇත. මෙහි දැක්වෙන පොළොන්නරු රාජධානියේ සිටි ෂ වන පරාක්‍රම බාහු රජුගේ විදේශීය ආක්‍රමණය හා ආර්ථික හා සාමාජීය සේවාවන් සම්බන්ධ විස්තර ශිලා ලේඛන මගින්ද තහවුරු වී ඇත.

පාලි මහා බෝධි වංශයද ඓතිහාසික තොරතුරු ලබාදෙන වැදගත් ග්‍රන්ථයකි. බෝධින් වහන්සේ ලංකාවට වැඩමවිම ඒ හා සම්බන්ධ කරන ලද පුද පූජා පිළිබඳවත් බුද්ධාගම පිළිබඳවත් විස්තර කර ඇති මෙම ග්‍රන්ථය අනුරාධපුර යුගයේ විසූ හිමිනමක් විසින් රචනා කරන්නට ඇතැයි සිතිය හැක. දඨාවංශය නම් කෘතියෙහි දළදා වහන්සේ පිළිබඳ තොරතුරු ගොනුකර ඇති අතර එය පොළොන්නරුවේ සිටි ලීලාවතී රැජිණගේ කාලයේ වාසය කළ ධර්මකීර්ති නම් හිමි නමක් විසින් පරාක්‍රම නම් සෙනෙවියාගේ ආරාධනය පරිදි රචනා කළ බව සඳහන් වේ. රාරත්නකරය, යන සාහිත්‍ය කෘතියද දේශපාලන, ආර්ථික, සමාජයීය හා සංස්කෘතික තොරතුරු ලබාගත හැකි මූලාශ්‍ර වලින් කිහිපයක් වේ.

පුරා විද්‍යාත්මක මූලාශ්‍ර අභිලේඛන. කාසි, නටඹුන් (මූර්ති හා කැටයම්) වශයෙන් විවිධාකාර වේ. දැනට ලැබී ඇති ක්‍රි.පු 3 වන සියවසට අයත් මිහින්තලේ හා වෙස්සගිරිය ආදී ස්ථාන වලින් සොයාගන්නා ලද ශිලා ලිපි පැරණිතම අභිලේඛන ගණයට අයත් වේ. බ්‍රාහ්මී ලිපි වශයෙන් සඳහන් කරන මේවා කඳුකර ප්‍රදේශයේ හැර දිවයිනේ නොයෙක් පළාත් වලින් අතර මේවායින් ආර්ය ජනාවාස වල හා බුද්ධාගමේ ව්‍යාපල්තිය පිළිබඳ තොරතුරු ලබාගත හැකිවී තිබේ. ඉතාමත් කෙටි ලිපි මත මේවායේ තේමාව වී ඇත්තේ යම් කිසිවකු විසින් භික්‍ෂූන් වහන්සේලාට කරන ලද පරිත්‍යාගයක් ලියාපදිංචි කර තැබීමයි. ක්‍රි.පූ 3 වන සියවසේ සිට ක්‍රි.පූ 1 වන සියවස දක්වා ලියා ඇති මෙම ලිපි වස්තු විෂය අතින් සමානතාවයක් දක්නට හැකිය. මුල් වර්ගයේ සෙල්ලිපි වලින් යම් යම් ප්‍රකට පුද්ගලයින් පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු ඉදිරිපත් කරන අතර දෙවන වර්ගයේ සෙල්ලිපිවල ඊට වඩා වැඩි තොරතුරු ඇතුලත් වේ. මේ සෙල්ලිපි දෙවර්ගයෙන් සිංහල අක්‍ෂරවල විකාශය, නොයෙක් සංකේත සිංහල ව්‍යාකරණ, විරුද නාමථ ප්‍රාදේශීය රජුන් හා කුමාරවරුන් ගැන රාජකීය විරුද නාම බ්‍රාහ්මණ පරුමක, ගපති හා වෙනත් කණ්ඩායම් පිළිබඳ තොරතුරු රැසක් හමුවේ.

තවද රාජ්‍ය නිළධාරින් හා එවක පැවති වෙළදාම් හා රැකිරක්‍ෂා පිළිබඳව ද ආර්ථික තත්වය හා ඉඩම් භුක්තිය පැවරීම සම්බන්ධව සමහර වංශකතාවල දක්නට නොලැබෙන තොරතුරු මෙම ලේඛන වලින් ලබාගැනීමට ඉඩසැලසී ඇත. ආගමික ලෙස නොයෙක් භික්‍ෂු භික්‍ෂුණීන් හා උපාසක උපාසිකා වන් හා විවිධ ආගමිකත විශ්වාස ගැන තොරතුරු ලබාගත හැක.

ක්‍රි.ව 3 වන සියවසේ සිට 7 වන සියවස දක්වා කාලය තුළ පැවති ශිලා ලේඛන වල ආගමික කාර්යයන් පදනම් වී ඇති අතර ඒවාට විහාරාම සතු ගම්බිම් වලට කරන ලද පුද පූජා හා වරප්‍රසාද ආදී කරුණු තේමා වී ඇත. නිදසුනක් ලෙස ඉතා වැදගත් අභිලේඛනයක් වූ වල්ලිපුරම් රන් සන්නස වසභ රජුගේ පාලනය, යාපන අර්ධද්වීපයෙහිද ස්ථාවරව පැවති බවට සාධකයක් වේ. එසේම අනුරාධපුරයේ රජ කළ රජවරුන් රාශියකගේ නම් සෙල්ලිපි මගින් සොයා ගැනීමට හැකි වී තිබේ. ඇතැම් අවස්ථාවලදී වංශකතාවල සඳහන් තොරතුරු ශිලා ලේඛන මගින් සනාථ කර ඇත. ඊට එක් නිදසුනක් ලෙස "දේවානම්පියතිස්ස" යන විරුදනාමය අනුරාධපුර යුගයේ රජවරුන් වැඩි පිරිසක් යොදාගෙනව ඇති බව සෙල්ලිපි වල සඳහන් වී පෙන්වා දිය හැක. තවද හබැස්ස, වෙස්සගිරිය, තිඹිරිවැව, යන ස්ථාන වලින් හමුවූ ශිලා ලේඛන වලින් ද මහාවංශයේ ඇතැම් ඌණතා සම්පූර්ණ කරගැනිමට හැකිවී තිබේ. උප රජවරුන් හා ප්‍රාදේශීය රජවරුන් පිළිබඳ සාහිත්‍ය ජ

15 පිටුවට...

විශ්‍රාමලත් සහකාර සංස්කෘතික අධ්‍යක්‍ෂ, ඩී.එම්.එච්.කරුණාරත්න මහත්මාගේ අභාවයෙන් පසු උපහාර පිණිස පලකෙරේ.

රංගිරි ශ්‍රී ලංකා RSL NEWSPAPER
රංගිරි - ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය
රංගිරි දඹුල්ල සංවර්ධන පදනම,
අංක 130, දඹුල්ල.
දුරකථනය: 066-2283606 (දිගුව 161) හෝ 071 5361328
ෆැක්ස්: 066-2284603
ඊමේල්: rangirinewspapers@gmail.com
වෙබ් අඩවිය: www.rangirisrilanka.lk

# ප්‍රථම ලංකා ගමනයේ සැමරුම් ඔස්සේ 2022ට...........

ඒ සම්බුද්ධත්වයෙන් නව වෙනි මාසයයි. දුරුතු පුන් පෝ සඳ විශ්වාලෝකය පතුරද්දී ලංකාද්වීපය සඳහම් ආලෝකයෙන් නැහැවී ගිය උතුම් දිනය එදාය. ත්‍රෛලෝක නාථ සම්මා සම්බුදු රජාණන් වහන්සේ සිය ප්‍රථම ලංකා ගමනෙහි සදහමින් මහියංගනයට වැඩම කරවීමේ ආශ්චර්යවත් මහා මංගල්‍යය එදින සිදුවිය.

මහා වංශයෙහි දැක්වෙන්නේ බුදුන් වහන්සේ එහි සිටි යක්ෂයින් දමනය කිරීමට ලක්දිවට වැඩම කළ බවය.

එදින සවස් කාලයේ මහා වාලුකා (මහවැලි) ගංතෙර පිහිටි මහියංගන වෘක්ෂොද්‍යානයෙහි සිටි යක්‍ෂයින් දමනය කිරිම උදෙසා බුදුන් වහන්සේ අහසෙහි නැගී පෙළහැර පෑ බවද මහා අන්ධකාරයක් මවා යකුන් දමනය කළ බවද ඉතිහාසයෙහි දැක්වෙයි.

අවසානයෙහි යකුන් ගිරි දිවයිනට පලවාහැර ලක්දිව මනුෂ්‍ය වාසයට සුදුසු දේශයක් බවට පත්කළ බවද ඉතිහාසයෙහි විස්තර වේ.

මෙකී සංසිද්ධිය වසර 2565ක් සැමරීමේ ඓතිහාසික දිනය මෙවර උදාවීමද සියලු බෞද්ධයින් හට අමරණීය වන්නකි. එවක් පටන් ලක්දිව බුදුරජාණන් වහන්සේ උදෙසාම බුදුරජාණන් වහන්සේ නෛසර්ගික ශ්‍රී සද්ධර්මයෙහි හිටි සැදැහැවත් පින්බර ජනතාවක් ඉන් පසු ලක්දිව පහළ වූ අතර මහින්දාගමනයෙන්ද, දුමින්දාගමනයෙන්ද අනතුරුව අප රට බෞද්ධ රාජ්‍යයක් බවට පත් වුයේ 50000 කල් බුදු දහම මෙරට පවතින බවට කළ නියත විවරණයක්ද සහිතවය.

එදා මෙදා තුර භික්ෂු සංඝයා විසින් අපරිමිත පරිත්‍යාගයෙන්ද, ශද්ධාවෙන්ද, අවබෝධයෙන්ද සුරක්ෂිත කොට ආරක්ෂා කළ බුදු දහම සහ බුදු සසුන සියළු සත්වයාගේ එලොව මෙලොව යහපත සනසන ඒකායන ධර්ම මාර්ගය බවට පත් වෙමින් තිබීම අප ලද භාග්‍යයකි.

බුදුරජාණන් වහන්සේගේ දහමේ හරය වුයේ අප්‍රමාදයයි. සැමරුම් සංවත්සර ජයන්තීන්ට වඩා වැදගත් වන්නේ ප්‍රචාරාත්මක විස්තරාත්මක දේ නොව ගුණාත්මක හා හරයාත්මක දෙයයි.

යහපත් චේතනාවන්ට හෝ ක්‍රියාවන්ට කළ නියමයක් නැත. අප්‍රමාදව කුසල් රැස් කිරීමෙන් සියලු දුක් සංකා දුරු කළ හැකිය යන්න සම්බුද්ධ දේශනයයි.

මේ උතුම් වර්ෂයේ හෝ අප්‍රමාදව තිදොර සංවරයෙන් කටයුතු කොට ත්‍රිවිධ බෝධියකින් එක් අස්ථාවකදී කර ගැනීමට අවශ්‍ය පාරමිතා හා අරිඅටගි මග අනුව යන්නට අධිටන් කර ගන්නා මෙන් ගිහි පැවදි සැමට අපි බැතියෙන් ආරාධනා කර සිටිමු.

# පන්සිය පනස් ජාතක පොතේ කතුවරයා



"ජාතකට්ඨ කථාවේ කතුවරයා කවරෙක්ද?" යන ප්‍රශ්නයට නොයෙක් දෙනා නොයෙක් මත ප්‍රකාශ කරති. එය විවාදයට භාජනය පවත්නා කරුණකි. එබැවින් අපි එයට ඇඟිලි ගැසීමට නොකැමැත්තෙමු. පන්සිය පනස් ජාතක පොත කාගේ කෘතියක්ද යන්න සැක සහිතය. ඇතැම්හු මේ ග්‍රන්ථය කීප දෙනෙකුගේ පරිවර්ථනයක් යැයි කියති. ශ්‍රී බුද්ධ වර්ෂ 1846 දී ලක් රජය කළ සිව්වන පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ පරිවර්ථනයකැයි අනෙක් මතයයි. මේ දෙවනුවට සඳහන් කළ මතය මහාවංශය අනුවද ඔප්පු වෙයි. සිව්වන පණ්ඩිත පරාක්‍රම බාහු ගැන සඳහන්වන කොටසේ ඒ බව සඳහන්වන අයුරු මෙසේය.

"අථ සෝ චෝල දේසියං
තා නා භාෂා විසාරදං
තක්කාහම ධරං ඒකං
මහා ථෙරං සුසඤ්ඤතං"

"රාජා රාජ ගරුට්ඨානේ
ඨපෙත්වා තස්ස සන්තිකේ
ජාතකානිච සබ්බානි
සුත්වා සුත්වා නිරන්තරං"

"උග්ගණ්හිත්වා තදත්තම්පි
ධාරෙත්වා තද තත්ථරං
තානි සබ්බානි පඤ්ඤසා
ධිතේ පඤ්ච සතේ සුතේ"

"ජාතකෝ පාලි භාෂාතේ
සීහලයා නිරුත්තියා
කාමතෝ පරිවත්තෙත්වා
පිටකත්තය ධාරිතං"

"මහා ථෙරාන මජ්ඣම්හි
සාවෙත්වා පරිසොධිය
ලඛකායාං පත සබ්බත්ථ
ලේඛා පෙත්වා පවත්තයි"

"ජතකානි පුතේ තානි
නිජ්සිස්සප් පවේණියා
පාලයිත්වා පවත්තේතං
ආරාධෙත්වානධීමතෝ"

බොහෝ දෙනෙකුගේ පරිවර්ථනයකැයි ඇතමුන් කියන මතය ඔප්පු කිරීමට ඓතිහාසික තොරතුරක් නැත. ඔවුන් එසේ කියනුයේ භාෂා ශෛලිය දෙස බැලීමෙනි. සිව්වන පණ්ඩිත පරාක්‍රම බාහුගේ පරිවර්තනයකැයි ප්‍රකටවම මහාවංශයේ තිබෙද්දී එයට බහු කතෘත්වයක් ආරෑඩ කරන්නට යාම කොතෙක් දුරට ප්‍රඥා ගෝචරදැයි විමසීම ඔබ සතු යුතුකමකි. සිංහල ජාතක පොතේ එහි කතෘ ගැන පැහැදිළිව සඳහන්ව නැතත් "පන්සිය පනස් ජාතක දේශනාව එළුවෙන් දක්නට වුව මැනවයි කියා පරාක්‍රම නම් ඇමති සත්පුරුෂයාගේ ආරාධනාවෙන් හා වීරසිංහ පතිරාජ අමාත්‍යාගේ උත්සහයෙන්ද අටුවා සාමින් ජාතක නියාව නොවරදවා ජාතක නියාව එළුවෙන් ලියූ ජාතක කතාව ......... " යනාදි පාඨය ඒ ගැන යමක් සිතන්නට හේතුවකි. මහා වංශයේ ගාථාවෙනුත් මේ පාඨයත් තවත් එවැනි කරුණක් ලංකරගෙන සුදුසු තීරණයකට එළඹීම ඔබ සතුයි.

පන්සිය පනස් ජාතක පොතේ සඳහන්වන ඉහත සඳහන් පාඨයෙන් එම පොත ජාතකට්ඨ කතාව පරිවර්ථනයක් බව කියවේ. එබැවින් දැන් අපේ විමසුම් නුවණ යොමු විය යුත්තේ ජාතකට්ඨ කථාව හා එහි පරිවර්ථනයක් වන පන්සිය පනස් ජාතක පොත දෙසටය. මේ පොත් දෙකේම මුලින් සඳහන් වන ජාතකය අපණ්නක ජාතකයයි. ජාතක කථාවේ එය පටන් ගන්නේ "ඉදං තාව අපණ්නක ධම්ම දේශනං භගවා සාවත්තියං උපනිස්සාය ජේතවන මහා විහාරේ විහන්තෝ කථේසි" යනුවෙනි. එහෙත් පන්සිය පනස් ජාතක පොත පටන් ගැනෙන්නේ එසේ නොවේ. මුලින්ම බුද්ධ චරිතය සම්බන්ධයෙන් සංක්ෂිප්ත විස්තරයක් ඇතුලත් වේ. ඒ සුමේධ බුදුන්ගේ කාලයේ සිටය. දම්දෙසමින් ඇවිදින කළ දිනක් දෙව්රම්හීදී මේ ජාතකය දෙසු වග කියවේ.

පන්සිය පනස් ජාතක පොතේ කතුවරයා පාලි කථාවන් සිංහලයට නැගීමේදී තරමක් වෙනස් මඟක ගොස් තිබේ. තවත් කියතොත් සිංහලයට නැගීමේදී ගැලපෙන අයුරින් කතුවරයා එය ඉටුකොට ඇත. ජාතකට්ඨ කථාවත් පන්සිය පනස් ජාතක පොතත් එක්තැන් කරගෙන කියවන්නට පටන් ගන්නා විටම මේ බව පැහැදිළි වේ. ජාතක දෙක තුනක් හැරෙන්නට සෑම ජාතක කතාවක්ම පාලි පොතේ සඳහන්ව ඇත්තේ ඒ ඒ ජාතකයනහි වූ ගාථාවන්හි මුල් පදය මුලට යෙදීමෙනි. "කිමස්සති තණ්ඩුල නාළිකාති ඉදං සත්ථා" යනාදි ක්‍රමයටය. එහෙත් එය සිංහල පොතේ සඳහන්වන්නේද තවද එක් සමයෙක්හි ශාක්‍ය සිංහ වූ සම්‍යයක් සම්බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර නිසා" යන ලෙසිනි.

ජාතකකට්ඨ කථාවේ පන්සිය පනස් ජාතක පොතත් එක්කර බලන කළ පැහැදිළිව දක්නට ලැබෙන එක් විශේෂ කරුණකි. එනම් පාලි පොතේ සඳහන් හැම කරුණක්ම සිංහල පොතේ නැති බවය. උදෘහරණයක් වශයෙන් පාලි පොත කියවන්නෙකුට "යේ කේචි බුද්ධං සරණං ගතාසේ තතේ ගමිස්සන්ති අපායං" යන ලෙසින් අපණ්නක ජාතකයේ සඳහන් ගාථා පෙළකම දැකිය හැකිය. එහෙත් සිංහල ජාතක පොතේ මේ ගාථාවන් සඳහන් නැත. මෙවැනි තැන් නව බොහෝය. මේ අනුව සිංහල ජාතක පොතේ පරිවර්තකය කොතරම් සියුම් අන්දමින් පාලි පොත හෙළයට නැගීමේදී විමසිලිමත් වීද යන්න පැහැදිළිය. කෙලින්ම කියතොත් ජාතකකට්ඨ කතාව සිංහලයට නගන්නට ගිය ජාතක පොතේ කතුවරයා සිංහලයට නගා ඇත්තේ ජාතක කථා වස්තුව පමණි. කථාවස්තුවේ සඳහන් යම් යම් කරුණු ගැන ලියා ඇති අටුවා සිංහලයට නැගුවේ නැත. යම් වදිහකින් පාලි පොත එලෙසම සිංහලයට නැගුවේ නම් ජාතක පොතේ බණ අසන්නට උපාසක උපාසිකා වන්තුළ පවත්නා ඕනෑකම අඩුවන්නට තිබුණි.

කථා වස්තුව පමණක් සිංහලයට නගන්නට ගිය පන්සිය පනස් ජාතක පොතේ කතුවරයා බොහෝ සෙයින්ම පෙළ පොත සිංහලයට නැගුවේය. එහෙත් හෙතෙම සිංහල රීතිය අමතක කළ බවක් නොපෙනේ. සමහර තැන් වලදී පාලි වචන විස්තර කොට දක්වා තිබේ. "සීලාදි ගුණෙන බුද්ධෝන සදිසෝ නාම තත්ථි"යන වැකිය සිංහලයට නගා ඇත්තේ සීල, සමාධි, ප්‍රඥා ආදී ගුණයෙන් බුදුන් සමාන කෙනෙක් නැත යනුවෙනි.

ඇතැම් පාලි වැකි වරදවා සිංහලයට නැගූ තැන්ද ජාතක පොතේ සොයා ගැනීමට අපහසු නොවි. "සෝ අජ්ජ ගච්ඡාම ස්මේ ගච්ඡාමාති දිවසේ අතික්කා මේති" යන්න සිංහලයට නඟා ඇත්තේ "බස ඉකුත් කරන්නේය" යනුවෙනි. ඇතැම් විට ඒ සිංහලයට හුරු ක්‍රමයයි කිව හැකිය. එහෙත් එය වැරදි දෘෂ්ඨියකි. "දිවසේ" යන්නට කිසිම ලෙසකින් "බස" යැයි කිව නොහැකිය. එය දවස් පසුකාලෙයැයි හෝ දවස් කල් ගෙවීයයි විය යුතුය.


මේ අනුව සලකා බලන කල ජාතක කථා කතුවරයා පාලි ජාතක කථා සිංහලයට නැගීමේදී යම් යම් සුළු අඩුපාඩුකම් දක්නට ලැබුනද ජාතතක පොත කියවන පාඨක ජනයා උදෙසා පහන් සංවේගය උපදවා ගැනීමට තරම් සරිලන ආකාරයෙන් ජාතක පොත සිංහලයට නැගීමට ඇතැයි කිවමනාය.

ශාස්ත්‍රවේදී පූජ්‍ය දෙල්තොට පියසිරි හිමි.

# සඳ සිසිල

සංස්කාරක
"සඳ සිසිල"
රංගිරි ශ්‍රී ලංකා පුවත්පත
අංක 130,
නුවර පාර,
දඹුල්ල.

කවියට ලැදි රංගිරි ශ්‍රී ලංකා පාඨකයින් උදෙසා කවියට කවිය 'කවි පැන' තීරයේ
පල කිරීමට අප සූදානම්ය. ඒ සඳහා පද දෙකකින් යුත්
රසවත් කවි පැන අප වෙත යොමු කරන්න.
*සංස්කාරක කවි පැන.....*



## සුහද ඇරයුම

මිදුලේ කිරි ඉද්ද ගහේ කැකුළියන්ට ඇස් අරින්න
මහ වැස්සක් වෙන්න එපා පොද වැස්සක් වී වහින්න
ගිනි අව්වේ වෙහෙස විදින ගත රැදි දාහය නිවන්න
සැඩ සුළඟක් වෙන් එපා මඳ සුළඟක් වී හමන්න

බුදු කුටියේ පුංචි පැලේ හැමදා සණ්දුර මකන්න
පසළොස්වක සඳක් නොවී, පහනක් වී එළිය දෙන්න
පිපාසයෙන් හෙම්බත් වූ තොල් පෙති හෙමිහිට තෙමන්න
මහ මුහුදක් වෙන්න එපා දොල පාරක් වී ගලන්න

රණ විරුවන් මිහිදන් කළ සොහොන් පුරා සුවඳ දෙන්න
අරුමෝසම් මලක් නොවී සැබෑ මලක් වී පිපෙන්න
මඟ වැරදී කඳුලු සලන ජීවිත සුවපත් කරන්න
රාගය මුදලට නොලියා යහපත් කවි ගී ලියන්න

අද ඇති වී හෙට නැතිවන ධනය බලය ඉවත ලන්න
කොයි කාටත් හදවතින්ම පිවිතුරු හසරැල් පුදන්න
අහස් මාළිගා නොහදා පොළොවේ සෙනෙහස වවන්න
ඔබට මෙන්ම මුළු ලොවටම හැකිවෙයි එහි පල ලබන්න

දුලානි චම්පිකා
මාතලේ




## නව අවුරුදු ප්‍රාර්ථනා

සාමයේ සතුටු මල් නිරතුරු පිබිදේවා
මිසදිටු කුරිරු අදහස් සැම දුරුවේවා
දුසිරිත් හැරදමු සුදනන් බිහිවේවා
සිරිලක් මාතාව දැහැමෙන් වැජඹේවා

වීරෝධාර සෙබළුන් නිති රැකදේවා
අවිබිම තබන්නට කාලය එළඹේවා
යුද බිය තුරං වී සාමය ලැබේවා
තුන් හෙළ සියළු දෙන සතුටින් වැඩඹේවා

තුන් හෙළ පුරා එක සිහ ධජයක් ඔසවා
යුධ ගිනි නිවා සාමයෙ පහනක් දල්වා
හදතුල සසලවන පැතුමන් ඉටුකරවා
ලැබූ නව වසර සිරිලකටම ජයවේවා

එස් වික්‍රමසිංහ
දි.මු. රෝහල
රිකිල්ලගස්කඩ

## රංගිරි කවිය...

වනයෙහි වන මල වන බඹරාටයි
රණ මොණරිය හිමි රණ මොණරාටයි
පින දෙන පල හිමි පින කළ අයටයි
රණ බිම රණ ජය රණ විරුවාටයි

*අහංගම*

## නව වසර සව් සිරියෙන් පිරෙත්වා

ගුවන් ගැබ වැහි වළාහක දෙව් යොමා නෙත් කල් වැසි වසිවා
රුවන් ඩා බිඳු හෙළා වැපිරු සියළු කෙත් වත් සාර වේවා
පහන් සිතුවිලි පහළ වී හැම දෙනාගෙන සත් සිත් නිවේවා
දහම් දිවයින නගා සිටුවා රජය දැහැමිව ලොවැඩ වේවා

ගෙවුන වසරේ අතිතය දෙස කාට කාටත් මෙනෙහි වෙත්වා
නොදැන හෝ දැන කෙරුණ සියළුම වැරදි නිවැරදි කර ගනිත්වා
සිතන යහපත් පැතුම් ඉටු වී නැවුම් සිතුවිලි පහළ වෙත්වා
සරණ තෙරුවන් බෙලෙන් ලැබූ නව වසර සව් සිරියෙන් පිරෙත්වා

මුතු බණ්ඩා මදුරප්පෙරුම
මකුල්පොත

## නොකරනු මැනවි පියෙකුට අවමං නින්දා

දා බිඳු සලා ගෙන වැඩ කළ පියාණන්
අප රැක ගන්න වෙර දැරූ අපේ පියාණන්
නිවන් යන්න පින් කර ගත් පියාණන්
මට මහ රජෙක් සැමදා අපෙ පියාණන්

කවියෙන් ලීවාට පිය ගුණ කියවන්ට
කවි මදි පියාගේ ගුණ මට පවසන්ට
කවි මල් පුදමි සතුටින් ඔබ පිලිගන්ට
කවි බල බලා කඳුලැලි ඔබ නොසලන්ට

දරුවෙනි පියා හට දුක් ගිනි නොදෙන්න
පියෙකුගේ කඳුළු බිඳු පහළට නොගන්න
පියෙකුට සදා මල් තිය තිය වැඳගන්න
පියෙකුගේ අසිරි මැද ඔබ ජිවත් වෙන්න

පියෙකුගෙ පැතුම දරුවන් ලොකු තැන රන්දා
මේ පිළිබඳව සැමදා සිතිවිලි වින්දා
සමහර දරුවෝ සඳහට සිහිනය බින්දා
නොකරනු මැනවි පියෙකුට අවමං නින්දා

සමන් බණ්ඩාරනායක
යෝධගම

## ගෙවදීම

*ගෙවදින්නට අලුත් නිවහනට*
*සුභ නැකතින්*
*කල එළි කරද්දී නිවස*
*සතුටින්*
*දොර උළුවහු කොහේ සවියෙන්*
*ඉදිකර තිබූ නිවස වෙහෙසින්*
*අහිමි විය කුඹලාට සැනකින්*

ශිරානි

## සරසවි වරම්

**සිදුරු සහිත බටනලාවකින්**
**මිහිරි ගීයක් වාදනය**
**කළ හැකි නම්**
**වේදනාත්මක හදවතක් තුළින්**
**වාසනාවන්ත අනාගතයක්**
**දැකිය හැක..........**
**අධ්‍යාපනය නැමැති රුවන්**
**මාළිගයට ඇතුල් වන විට**
**ආදරය නැමැති පාවහන්**
**ගලවා තබන්න...**
**එවිට ඔබට...**
**සරසවි වරම් ලැබෙනවා.....**



එල් සුගත් බණ්ඩාර
ගම්පහ

## නොමිනිස්කම

නොමිනිස්කම වපුරන්නට
වන වනසන මිනිස් අතින්
ගසට හෙළූ පොරෝ පහර
වැදුනේ කුඩු තල මතටයි




උන් හිටි තැන් අහිමි වෙලා
මරණ බියෙන් වියරු වෙලා
ගම්බිම් වැද සටන් කළේ
අයිතිය රැකගනු පිණිසයි

පාරිලෙය්‍ය කුලේ දිනූ
දළ දන් දී පෙරුම් පිරූ
නාලාගිරි කළේ නුඹව
දේව දත්ත මිනිස්සුමයි



ගිනි අවිගෙන හපනුන් වී
ගිජිඳුන් වනසන මිනිසුනි
විය හැකිනම් මට මහ බඹු
දෙදළ මවන්නේ තොපටයි.

සරත් නිමල් පෙරේරා
(උතුරු කැලිෆෝනියාව)



## නිදහස



ගතට විසක් නැති අහරක් කෑමට නැතිනම්
හිතට බියක් නැති මිතුරෙකු ඇසුරට නැතිනම්
හිසට බරක් නැති පෙමක් විඳින්නට නැතිනම්
කුමට ද නිදහස සිනහව මුහුණක නැතිනම්

ලද දේ සතුටින් ජිවත් වීමට නැතිනම්
කෙනෙකුගෙ සුසුමට සැනසුම වීමට නැතිනම්
දෙපයින් සිටගත් මිනිසෙකු වීමට නැතිනම්
කුමට ද නිදහස සිත් තුළ සාමය නැතිනම්

*භාග්‍යා හේරත් - කැකිරාව*

## මුළු රට වටේ ළෙලදේවා සිංහ කොඩි

රණවිරු විජය ඩෙන්සිල් වැනි රණ විරුවෝ
අල්ගම ලකී-ජානකලගෙ පණ නැසුවෝ
රණවිරු රිචඩ් වැනි දහසක් රණ විරුවෝ
රට වෙනුවෙන් ඒ ජීවිත පුද කෙරුවෝ

කිතුල් උතුවෙ මිනිසුන් කපලා මැරුවා
දිඹුලාගල සම්දුගේ ජීවිත නැසුවා
කිරිදරුවන් උදුරගෙන පොළවේ ගැසුවා
කොටි හපුවන් ළඟයි යන්නට කම්මුතුවා

කිලිනොච්චියෙන් ජයගෙන රණවිරුවො එඩි
අලිමංකඩත් ජය ගත්තනෙ තබා වෙඩි
වත්මන් ගැමුණු රජු තව තව පෙරට වඩී
මුළු රට වටේ ළෙලදේවා සිංහ කොඩි

**තෙන්නකෝන් රත්නායක**
**දේවහුව**

## අම්මා පමණි පුතකුගෙ තනියට ඉන්නේ ...



ලොව කිසිවෙකුට කිසිදින කළ නොහැකි මිලක්
මුවඟින් ගලා එන්නේ පිය වචන පෙලක්
ජීවන කතර මැද දුටුවෙමි සොඳුරු විලක්
අම්මා මගේ එහි සුපිපුන සුවඳ මලක්

අප වෙත හඹා එන විට ගැරහුම් නින්දා
නොබියව මුහණ දී ඒ බාධක බින්දා
සිරිදුව වෙසින් සිට සුව සහනය කැන්දා
අප දිවි මාවතේ ඔබ ජය දද බැන්දා

දෙතොළග පිපි සිනා හිමමෙන් පිරිසිදුය
පිවිතුරු හද මඬල මල් පෙති මෙන් මුදුය
පෙන්වන ආදරය අප කාටත් පොදුය
හිරු සඳු කුමට.. අම්මා ලොව හිරු සඳුය

පෙම්මා වැඩූ මුළු ලොව හැම දරුවන්නේ
සම්මා ජීව ගුණයෙනි දිවි ගෙනියන්නේ
නිම්මා නැති සුවඳ සෙනෙහස පුදමින්නේ
අම්මා පමණි පුතකුගෙ තනියට ඉන්නේ

සුරංජි වාසනා
නාත්තන්ඩිය.

# වැඩිහිටියන් මෙන්ම දරුවෝ ද අද අසරණ වී සිටිති.



වෙනදා තම පවුල තුළින් ආරක්ෂාව රැකවරණය ලද වැඩිහිටියෝ අද සමාජය තුළ අසරණ වී සිටිති. තම පවුල තුළින් ඔවුන් බලාපොරොත්තු වන ආද රය සෙනෙහස ද ක්‍රමයෙන් හීනවන බව ප්‍රත්‍යක්ෂ වේ.

එමෙන්ම දරුවන් ද කම්පාවට පත්වන්නේ තමන්ගෙන් ඉටුවිය යුතු යුතුකම් ඒ ආදරය, රැකවරණය අවශ්‍ය ලෙස වැඩිහිටියනට ලබාදීමට නොහැකි වීම පිළිබඳවයි. හැකි සෑම අවස්ථාවකම දරුවන් වැඩිහිටියන් රැකබලාගැනීම සඳහා උනන්දු වූවත් පවතින ආර්ථික හා සමාජීය පරිසරය තුළ ඔවුන්ට ඒ සඳහා ලැබෙන අවස්ථා සීමා වී ඇත.

ශ්‍රී ලංකා සමාජයේ වැඩිහිටියන් සඳහා උරුම වී තිබූ ගෞරවනීය ස්වභාවය සහමුලින්ම සිඳීගොස් නැතත් පැරණි විස්තෘත පවුල තුළ තිබූ ඒ නිදහස, ගෞරවය, සතුට, පිළිගැනීම ආදී ඇගැයීම වාණිජ සමාජය මඟින් ක්‍රමයෙන් දිය කර හරින බවක් පෙනේ. වැඩිහිටියන්ට අවශ්‍ය ආහාර පාන, ඇඳුම් පැළඳුම්, බෙහෙත් හේත් ආදිය දරුවන්ගෙන් ලැබෙනවා විය හැකිය. නැත්නම් තම විශ්‍රාම වැටුපෙන් ගන්නවා විය හැකිය. නමුත් ඊට වඩා වැදගත් වන්නේ ඔවුන්ට අවශ්‍ය ආදරය, සෙනෙහස, ලබාදීමයි. ඔවුන්ගේ පාළුව තනිකම නැතිකිරීමයි. ඒ සඳහා ඔවුන් සමඟ නිදහසේ සිටීමට දරුවන්ට කාලයක් නැතිවිය හැක. ඔවුන්ගේ දුක වේදනාවට ඇහුම්කන් දීම ඉතා වැදගත් නමුත් ඒ සඳහා තම දරුවන්ට කාලය නොමැති විය හැකිය.

රැකියාවෙන් විශ්‍රාම යනතුරු ඔහු පිළිගත් පුද්ගලයෙකු ලෙස සමාජයේ වැජඹුන අතර විශ්‍රාම යාමත් සමඟ ඔහු අකර්මන්‍ය නැත්නම් සමාජයෙන් වෙන්කර තැබිය යුතු පුද්ගලයෙකු ලෙස සලකනු දැකිය හැකිය. මේ නිසා විශ්‍රාමිකයන් කරා හුදෙකලා බව, පාළුව, කාන්සිය නිසා හටගන්නා චිත්ත පීඩාව අධික විය හැකිය.

වැඩිහිටි වයසට ළඟා වන විට විවිධ රෝගාබාධ වැළඳීම ද සාමාන්‍ය දෙයකි. බෝ නොවන රෝග වැළඳීමේ ප්‍රවණතාව ඉතා වැඩිය. ඒ නිසා වැඩිහිටියන්ගේ මෙම රෝගාබාධ සඳහා වෛද්‍ය පහසුකම් ලබාගැනීම, වෛද්‍ය උපදෙස් ලබාගැනීම සඳහා නිතර නිතර වෛද්‍යවරයා හමුවීමට යා යුතුය. ඒ සඳහා නගරයට යා යුතුය. අද වෛද්‍යවරයෙකු හමුවීමද ඉතා තරගකාරී කරදරකාරී කාර්යයකි. වෛද්‍යවරයා හමුවීම සඳහා අවස්ථාවක් ලබාගැනීම (Channeling) වෛද්‍යවරයා එනතුරු රෝහල තුළ පෝලිමේ සිටීම ආදිය ඉතා කරදරකාරී වෙහෙසගන්වන කාර්යයකි. ශාරීරිකව දුර්වල වැඩිහිටි අයට මෙය සැබැවින්ම වේදනාකාරීය.

වැඩිහිටි ජනතාව රටට හා පවුලට බරක් විය යුතුද? මෙතෙක් රට වෙනුවෙන් වැඩ කළ රට ගොඩනැගීමට උරදුන් මොවුන් මෙසේ අසරණ කළ හැකිද? එය කිසිසේත්ම කළ නොහැකිය. යුතුකම් අගය කරන සමාජ හර පද්ධතියක් සහිත ශ්‍රී ලාංකිකයෝ මේ පිළිබඳ කම්පා වෙති. අද රටේ තිබෙන සෞභාග්‍ය ළඟාකර ගැනීම සඳහා දාඩිය මහන්සිය වගුරන ලද්දේ මොවුන්ය. ඒ නිසා මොවුන් දැතින්ම රැකගත යුතුය.

වැඩිහිටියන් ලෙස මෙසේ අසරණ වන්නේ මෙතෙක් රට ගොඩනැගීමට උරදුන් වීර ජන කොට්ඨාසයක් බව අමතක නොකළ යුතුය. වර්තමානයේ රට ගෙනයාමට උගත් බුද්ධිමත් තරුණ දූ දරු පිරිසක් බිහිකළේ මොවුන්ය. නිදහස් අධ්‍යාපනයේ ඉහළටම ගිය ජාතික සංවර්ධනයේ නියමුවන් ලෙස ක්‍රියාකළේ මොවුන්ය. දියුණු වෙමින් පවතින රටක් ලෙස පැවති ශ්‍රී ලංකාව මැදි ආදායම් ලබන රටක් ලෙස යෝධ පිම්මක් ඉදිරියට පැන්නේ මොවුන්ගේ දාඩිය මහන්සියේ ප්‍රතිඵලයෙනි. එවන් ජන කොට්ඨාසයකට තම වියපත් දිවිය ගෞරවනීය ලෙස ගතකිරීමට ඉඩ ප්‍රස්ථා ලබාදීම අපේ යුතුකම විය යුතුය. ඒ සඳහා වඩා සංවේදී ම ස්ථානය වන්නේ තම පවුලයි. තම නිවසයි. නමුත් තම පවුල තුළින් ඒ කාර්යය නිසියාකාරයෙන් ඉටු වන්නේ නැති නම් පවතින සමාජ ආර්ථික සංදර්භය තුළ වඩා සුරක්ෂිත ආයතන ගත රැකවරණ පද්ධතියක් කරා යා යුතුව ඇත.

**එල්.වයි.එස්.ගාමිණි**

## යශෝදරාවතින් ගැමියා දුටු නිර්ව්‍යාජ චරිතය

"යශෝදරාවත" යනු ගැමියන් අතර ඉතා ජනප්‍රිය පද්‍ය කෘතියකි. එය මහනුවර යුගයේ කවියෙකුගේ අපූරු නිර්මාණයකි. පූජාවලියෙත් බුදු සිදිතෙත් දැක්වුණු යශෝදරාවගේ චරිතයට වඩා නුවර යුගයේ ගැමි කවියා නිරූපණය කළ යශෝදරාව වෙනස් වේ. මහනුවර යුගයේ සිටි ගැමි කවියා යශෝදරාව නිරූපණය කරන්නේ උගතුන් දුටු යශෝදරාවට වඩා සාමාන්‍යය ගැහැණියකගේ හැඩයට ආසන්නවය. අප දන්නා බුදු සිරිතේ යශෝදරාව මේ තරම් දීර්ඝ වැළපීමක යෙදුණු වගක් නොදැක්වේ. එසේනම් ගැමි කවියා හොඳින් දන්නා ගැමි ගැහැණියකගේ චර්යා රටාව යශෝදරාවතින් යශෝදරාවට ආරෝපණය කළා යැයි කීම රචකයාට කරන ගෞරවයක් සේ සැළකිය හැකිය.

"මුව ජාතියේවද පළමුව උපන්නේ
එම ජාතියේ සිට නෑරම මම එන්නේ
කොයි ජාතියේ උපන්නත් මෙහෙසුන් වන්නේ
මේ ජාතියේ ඇයි මා තනිකර යන්නේ "

උගතුන් යශෝදරාවගේ වැළපීමට හෝ සිද්ධාර්ථ කුමරුගේ නික්ම යෑනමට හෝ නව අර්ථකතන නොදුන්නෝය. ගැමියා එය වැදගත් වචනයකින් වසා ගැහැණියකගේ තනි වීම අඩු තක්සේරුවකට ලක් නොකළේය. ඒ නිසාම "ඇයි මා තනිකර යන්නේ" යන යෙදුමෙන් ඊට නිසි ස්ථානය දුන්නේය. එමෙන්ම යශෝදරාව හඬා වැළපෙන විට ගැමි ගැහැණියක මෙන් අතීතය පුනරාවර්ජනය කරයි.

"එදා ගියේ තලසට දෙනන සහ කැලේ
වඩා දෙදරුවන් උකුලට රැගෙන ලොලේ
බෙදා උනිම් පන්සල් දෙකම එක කලේ
මෙදා මොකද තනිකර යන්නට මම කලේ"

එම කවියේදීත් ගැමි කවියා මහාභිනිෂ්ක්‍රමණය යනු සැමියෙකු විසින් බිරිඳව තනි කර යෑමකට අර්ථකතනය කරයි. එම කවියේදිත් සාමාන්‍යය ගැහැණියක මෙන් අතීතතය සිහි කිරීමට අමතක නොකරයි.වෙසතුරු ආත්මය තෙක් ඇය සිහි කරයි. යශෝදරාවගේ වැළපිම ගැමි කවියා "කඳුළු" යන වචනය භාවිතා නොකරයි.

" තෙමා වැටේ මගෙ සලුපිළි නෙත් පුරවා
අමා රසක් වැනි හිමි සඳ සිහි වෙනවා
දමා කුමරු වැඩියා මට සිහි වෙනවා
මෙමා ඇරලියෝ ලොවි තුළ ඇද්ද තවා"

ගැමියා යශෝදරාව ලවා සිද්ධාර්ථ කුමාරයා අමාරසයකට උපමා කොට තිබේ. එම යෙදුම ලෞකික පෙම්වතෙකු පිළිබඳ එබඳුම පෙම්වතියකගේ අතිශය පෞද්ගලික ආමන්ත්‍රණයකි. එතනදීත් "දමා කුමරු වැඩියා" යන යෙදුමම යෙදීමට කවියා උත්සහා දරයි.

"මෙමා ඇරලියෝ ලෙවිතුළ ඇද්ද තවා"

ඕනෑම ගැහැණියක් තමන් තරම් කිසිවෙකු දුක් නොවිඳියි සිතයි. යතෝක්තයෙහි යටි අරුත එයයි.

"උන්නෙමු අපි ඉපිද ලෙහෙනුන් කුලේ එදා
වැටුණේ ජලය මැද සමුදුරයේ බිළිදා
දැනුනේ කරපු වීරිය ගොඩ ගන්ට එදා
හිමි රජුනේ මඟ හැරියේ මන්ද මෙදා

මෙලෙස ස්ථාන කීපයකදීම අභින්ෂ්ක්‍රමණය වෙනුවට මඟ හැරීම, තනිකර යෑම, වැනි අර්ථකතනයක්ද දී තිබීම ගැන අප යශෝදරා වත පරිහරණය කරන විට සැළකිලිමත් විය යුතුය.

රුව ඇති පුතුන් හැදුවා මම වැරදීද
රුව ගුණ තේජසක් මගෙ අඩුවුණා වද
ගරු සරු නැති කමක් මාතින් යෙදුණාද
මරු බිඳ බුදු වෙන්න සිහිනෙන් පෙනුනාද

පෙරදිග ස්ත්‍රිය නිතරම අර්බුධයකදී වරද තමන්ගේ යැයි සිතයි. ඉහත කවියෙන්ද දැක්වෙන්නේ නුවර යුගයෙත්, එමෙන්ම තවමත් ඇතැම් කාන්තාවන් තුළ පවතින වරද තමන්ගේ යැයි සිතන මනෝභාවයයි. යශෝදරා දේවියද තමන් හැර යෑමට හේතුව තමන්ගේ වරද බව සිතන අන්දම කවියා පවසයි.

" සුවඳ බොජුන් වැළදූ මගෙ හිමි සඳට
නිබඳ බොජුන් රස කරදුන් වළඳන්ට
සුවඳ පලා පල වැවියන් හිමියන්ට
සුවඳ මල් නිතර පිපියන් රන් කඳට"

යශෝදරාව ලවා ගැමි කවියා කියවන මෙම ප්‍රකාශය දිසි අරුතෙන් පමණක් ගත යුතු නැත. වැසි අරුතක්ද තිබේ. වෙන්ව යන සැමියාට වෙන්ව යැමෙන් පසු ඇති විය හැකි දුෂ්කරතා මේ කවියේ තිබේ. එය කියා ඇත්තේ සෘජුව නොව අර්ථ ධ්වනියක් ඇති වන පරිද්දෙනි. සෘජු භාෂණය රසවත් නැත.

පිරිය ලෙසට සැතපුන අප මල් යහනා
බැරිය ඉතින් දැකලා මගෙ පපුව දනා
විරිය බුදු බවට බාදා නොව වඩිනා
සූරිය මඬල මෙනි ඔබ සැතපුන යහනා

යශෝදරාවතේ එන සංකේත හා වක්‍රෝක්ති වලින් පිරුණු කවියක් ලෙස මේ කවිය හැඳින්විය හැකිය. දෙදෙනා නිදාගත් යහන සූර්ය මණ්ඩලයක් සේ යශෝදරාව දකියි. නමුත් සිදුහත් කුමරු දැන් මාළිගයේ නැත. එම නිසා ඔහු හැසිරුණු තැන් භාවිතා කළ දෙය යශෝදරාවට මහත් කම්පාවක් ගෙන දෙයි. එදා සිදුහත් විඳි සැපත හා අද විඳින දුක් යශෝදරාව සිහිකරයි.

හිමයේ ගොසින් මල් යහනක නිදනවද
කොමළ අනඟි සිරිපා දෙක රිදෙනවද
නැතිව දෙවියෝ මුර කරනවද
මගේ ඇත් රජුනි හිමි සඳ කොතැනකද"

මෙම කවියේදීත් යශෝදරාව සිතන සිතුවිල්ල කෙළින්ම නොපවසා වක්‍රෝක්තියකින් දෙදෙනා අතර ඇති ආදරණීය බැඳීම පාඨකයාගේ සිතට ගලා ඒමට ඉඩ සලසා ඇත. මෙහි අවසාන පදයේ ඇති "මගේ ඇත් රජුනි" යන යෙදුම ලෝකයේ ඇති ලොකුම ප්‍රේමය තමන්ට අයත් බව කීමට යොදා ගෙන ඇති වචනයක් බව හැඟෙයි.

යශෝදරාව තමන් අතහැර ගිය සැමියාට

කැලේ තිබෙන කොයි දේවත් රස වේවා
මලේ බඹමරු මෙන් පිරිවර ඇති වේවා
අව්වේ තියන රැස් මාලා අඩු වේවා
ගව්වෙන් ගව්ව දිව මාළිඟ සෑදේවා

යි පතයි. මෙබඳු වෛරයෙන් තොර විශ්ව ප්‍රාර්ථනාවක් කළ හැක්කේ පෙරදිග ස්ත්‍රියට පමණි. තමන් හැර දා ගිය සැමියාට "ගව්වෙන් ගව්ව දිවමාළිග සෑදෙන්නට යැයි පැතීමට තරම් අහිංසක සිතක් අපේ කාන්තාවට තිබුණි. අදත් ඇතැම් කාන්තාවන් තුළ පවති. කොතෙක් තමාට ගැරහුම් අවමාන කළත් අපේ කාන්ථාව ඔහුට වෛර නොකරයි.

කියන මැසිවිල්ල හිමි හට නොඇසෙනවා
රන්කද මහිමිට මට හිනෙන් නොපෙනෙනවා
කම්රස විදීමක් නැතම දිවිරනවා
වෙන් කර ගියත් මම සිලේ පිහිටනවා

හීනෙන් නොපෙනෙන්නේ යශෝදරාව තද නින්දක නොසිටන නිසාය. "කම් රස විදීමක් නැත" යන ප්‍රකාශය එතැන් පටන් පෙරදිග අපේ කාන්තාවගේ චර්යාවක් විය. පිරිමියා බිරිඳ මිය ගිය විගස විවහා වෙයි. ගැහැනිය හැසිරී ඇත්තේ තවත් විවහයක් ගැන සිතා නොවන බව මෙම කවියෙන් පැහැදිළි වෙයි.

කෙසේ වෙතත් ගැමි කවියා මැවූ යශෝදරාවත තුළින් ස්ත්‍රිය තුළ ස්වාමි භක්තිය, ගෞරවය, අවිහිංසාව ජනිත කරවයි. සැමියාට ගරු කිරීමට උගන්වයි. වර්තමාන ස්ත්‍රිය තුළ පවා යශෝදරාවක් ජීවත් වෙයි. සම්ප්‍රධාය මඟින් හික්මවනු ලැබූ ශ්‍රී ලාංකික අඹුසැමි ප්‍රේමය කිරීමේදි යශොදරාවතේ එන සිදුහත් යශෝදරා ප්‍රේමය ගැමියා දුටු අන්දම තවත් අගයෙන් පිරිහි නැති බව සඳහන් කළ යුතුය.

**පොතපත ඇසුරින්**

# නිවන් අවබෝධය පිණිස කෙළෙස් දුරලමු............



"අත්ථි භික්ඛවෙ කාය පස්සදිධි, චිත්ත පස්සද්ධි තත්ථි යොනිසො මනසිකාර බහුලීකාරො අයමාහාරො අනුප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣංගස්ස උප්පාදාය, උප්පන්නස්ස වා පස්සද්ධි සම්බොජ්ඣංගස්ස භාවනාය පරිපූරියා"

මහණෙනි, කයේ සැහැල්ලුව හා සිතේ සැහැල්ලුව යනුවෙන් සැහැල්ලුතා (පස්සද්ධි) දෙකක් වේ. ඒ පිළිබඳ මනා සිහිනුවණින් නිතර නිතර මෙනෙහි කිරීමෙන් නූපන් කාය/මන සැහැල්ලුවද, උපන් කාය/මන සැහැල්ලුවේ දියුණුව හෙත් පස්සද්ධි සම්බොජ්ඣංගයේ දියුණුව ඇති කරයි.

පස්සද්ධි සම්බොජ්ඣංගය යනු ආශ්‍රව ප්‍රහාණයේ අවසාන පියවර වූ සත්ත සම්බොජ්ඣංගයේ පස්වන අංගයයි. සතර අනුපස්සනාවෙන් භාවනා වඩන්නෙකු සත්ත සම්බොජ්ඣංගය අනිවාර්යෙන් ප්‍රගුණ කළ යුතුය. එසේ සතර සති පට්ඨානය වැඩීමේදී කායික මානසික අපහසුතා ඇති කල්හි සමාධිය නොවැඩේ. සමාධියෙන් තොරව ප්‍රඥාව ලැබීමට ආශ්‍රව දුරු කිරීමට නොහැකිය. පස්සද්ධි සම්බොජ්ඣංගය සම්පූර්ණ කිරීමට කරුණු 7ක් ඉවහල් වේ.

1) පණීතභෝජන සේවනතා

ප්‍රණීත භෝජන වලදන බවය.

2) උතු සුඛ සේවනතා

සැප සෘතු ගුණය සේවනය කිරීම

3) ඉරියාපථ සුඛ සේවනතා පහසු ඉරියව් සේවනය කිරීම

4) මජ්ඣත්ත පයෝගතා

මධ්‍යස්ථ ප්‍රයෝග ඇති බවය.

5) සාරද්ධකාය පුග්ගල පරිවජ්ජනතා

නොසන්සුන් කය ඇති පුද්ගලයන් ඇසුරු කරන බවය.

6) පස්සද්ධ පුග්ගල පරිවජ්ජනතා

සන්සුන් කය ඇති පුද්ගලයන් ඇසුරු කරන බවය.

7) තදධිමුත්තතා

පස්සද්ධි සම්බොජ්ඣංගයට නැමුණු බරවුණ සිතක් ඇති බව.

i. ශරීරයට අවශ්‍ය කරන ආහාර පාන නැති කල්හි කයේ දුබලතා ඇති වී ද සිතද අකර්මන්‍ය වේ. එවිට කාය, චිත්ත පස්සද්ධිය ඇති කර ගැනීමට අපොහොසත්ය. එබැවින් යෝගායචරයාගේ කයට අප්‍රත්‍ය නොවන ප්‍රණීත ආහාර පාන ලැබිය යුතුය. කයට යෝග්‍ය ආහාර ලැබීමෙන් ඒවා ප්‍රමාණාත්මකව අනුභව කිරීමෙන් කාය පස්සද්ධිය ඇතිවේ. කය නීරෝගීව පවත්නා විට සිතද නීරෝගී වේ.

ii. කාය පස්සද්ධිය ඇති වීමට කලගුණ දේශගුණ වශයෙන් ඒ ඒ යෝගියාගේ ශරීරයට හිත කර අව්,වැසි ,සුළං ආදිය ද තිබිය යුතුය. නැති වුවහොත් එයින් ද කයට අපහසුතා ඇති වේ.

iii. භාවනා වැඩීම සඳහා වාඩි විය යුතු ප්‍රධාන අංග දෙක බද්ධ හා අර්ධ පර්යාංකයයි. භාවනා ඉරියව් 4 වන්නේ ඉදගෙන, හිටගෙන, සක්මන හා සයනයයි. මෙහිදී සයනය භාවිත කරන්නේ බැරිම අවස්ථාවකට පමණි. මන්ද යත් සයනය යනු වැඩි බැවින් තීනම්ඨය බහුලව පැමිණීමෙන් බොජ්ඣංග වැඩීමට නොහැකි වන බැවිනි. අර්ධ-බද්ධ පර්යාංකව කෙනෙකුට වාඩිවීම තුළ වැඩි වේලාවක් එක ඉරියව්වක සිටීමට හැකි ආකාරයක් තෝරා ගත යුතුයි. සක්මනද ආකාර පහක් පමණ වේ. එයින් තමාගේ සිත සන්සුන් වන ආකාරයේ සක්මන තෝරාගත යුතුයි. නොඑසේ නම් පැදවල වේදනා ආදිය ඇති වී භාවනාව නතර කිරීමට සිදුවීමෙන්ද සිත නොසන්සුන් වීමෙන් බොජ්ඣංග නොවැඩේ.

iv. "මජ්ඣත්ත පයොගතා"යනු මධ්‍යස්ථ ප්‍රයෝග අනුගමනනය කිරීමයි. එනම් භාවනාවක් වැඩීමට වීර්යය සහ සමාධිය සමානව තිබිය යුතුය. වීර්යයයෙන් තොරව සමාධිය වැඩීමෙන් තීනමිද්ධයද සමාධියෙන් තොර වීර්යය නිසා උද්ධච්ඡ කුක්කුච්ඡ ද ඇති වේ. ඒ නිසා භාවනා වැඩීමේදී සිය ශක්තියට අනුව මධ්‍යස්ථ භාවයෙන් භාවනා නොවැඩීමේදී පස්සද්ධි සම්බොජ්ඣංගය බිඳ වැටේ. එමෙන්ම කයට දැනෙන දුක හැ සැප පිළිබඳව මධ්‍යස්ථව බැලිය යුතුය.

යෝගියකුගේ හෝ ඕනෑම පුද්ගලයකුගේ කයට දැනෙන අපහසුතාවලට හේතුව කර්මයයි. එනම් තමා විසින් මෙලොවදී මෙන්ම පෙර භව වලදී කරන ලද යහපත් අයහපත් ක්‍රියාවල ප්‍රතිඵලයයි. එම ප්‍රතිඵලය පිළිබඳව සිතා ලැබෙන දුක, සැප, දෙකෙහිදීම මධ්‍යස්ථ භාවය ඇති කර ගැනීමෙන් පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩේ.

v. නොසන්සුන් කාය ක්‍රියා ඇති අය නිසා නිවුණ මනසක් පවත්වා ගත නොහැක. නොවුණ මනස හේතුවෙන් පස්සද්ධි සම්බොජ්ඣංගය නොවැඩේ.

vi. සන්සුන් ක්‍රියා ඇති කල්‍යාණ මිත්‍ර සේවනය කාය, චිත්ත ශක්තිය දියුණු කරයි.

vii. පස්සද්ධි සම්බොජ්ඣංගය ඇති කර ගැනීමෙන් සති, සමාධි, ප්‍රඥා වැඩීමට එය උපකාර වන බව දැන එයට නැමුණු සිතක් ඇති කර ගැනීමෙන් හා ඉහත කරුණු පිළිපැදීමෙන් පස්සද්ධි සම්බොජ්ඣංගය වැඩී ආශ්‍රව ප්‍රහාණය වේ.

### ***සමාධි සම්බොජ්ඣංගය***

සිත එක අරමුණක නොසැලී සිටීම නොයෙක් නොයෙක් අරමුණුවල නොගැටී භාවනා අරමුණෙහිම එල්ඹගැනීම 'සමාධිය' නම් වේ. සමාධි සම්බොජ්ඣංගය ඇතිවීමට නැතිවීමට කරුණු 11 ක් වේ.

i. වත්ථු විසද කිරියතා

අභ්‍යන්තර හා බාහිර වස්තු පිරිසිදු කරගැනීම.

ii. ඉන්‍ද්‍රිය සමත්ත පටිපාදයතා

ශ්‍රද්ධාදී ඉන්‍ද්‍රිය සමව පවත්වා ගැනීම

iii. නිමිත්ත කුසලතා

භාවනාරම්මණයන්ගේ නිමිති සිතට ගැනීමේ සමත්බව.

iv. සමයෙ චිත්තස්ස පග්ගහනතා

සිතට අනුබල දීමට සුදුසු අවස්ථාවේ අනුබල දෙන බව.

v. සමයෙ චිත්තස්ස නිග්ගහණතා

සිතෙහි වේගය අඩු කළයුතු අවස්ථාවේ එය සිදුකළ හැකි බව.

vi. සමයෙ සංපහංසනතා

සිත සතුටු කිරීමට අවශ්‍ය විටදී සතුටු කරවිය හැකි බව.

vii. සමයෙ අජ්ඣුපෙක්ඛණතා

සිත මධ්‍යස්ථව පවත්නා කල්හි එය හඳුනාගැනීමට හැකි බව.

viii. අසමාහිත පුග්ගල පරිවජ්ජනතා

සමාධියෙන් තොර පුද්ගලයන් අත්හරින බව.

ix. සමාහිත පුග්ගල සෙවනතා

සමාධියෙන් යුක්ත පුද්ගලයන් සේවනය කරන බව.

x. ඣානවිමෙක්ඛපච්චවෙක්ඛණතා

ධ්‍යාන මාර්ග ඵල ධර්මයන් මෙනෙහි කරන බව.

xi. තදධිමුත්තා

සමාධි සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇති බව.

### i. **වත්ථු විසදකිරියතා**

යෝගාවචරයා විසින් භාවනා කාළය තුළ පරිහරණය කරන කුටිය බාහිර පරිසරය හා බඩු භාණ්ඩ පිරිසිදුව පිළිවලට පවත්වා ගැනීමයි. අපිරිසිදු බව හා අපිළිවෙල ඇති කල්හි සිත වික්ෂිප්ත වේ. එවිට සමාධිය බිඳ වැටේ. එසේම අත්‍යාවශ්‍යම භාණ්ඩ පමණක් පරිහරණය කළ යුතුය. නැතිහොත් විවිධ පලිබෝධ ඇතිවී සමාධියට බාධා පැමිණේ.

### ii. **ඉන්ද්‍රිය සමත්ත පටිපාදනතා**

ශ්‍රද්ධාව, වීර්යය, සතිය, සමාධිය, ප්‍රඥාව යන ඉන්‍ද්‍රිය පහ මධ්‍යස්ථ විය යුතුය. එනම් යම් යෝගාවචරයෙකුට ශ්‍රද්ධාව වැඩී වී අනෙකුත් ඉන්‍ද්‍රිය පහව අඩු වුවහොත් එම යෝගියාගේ මෝහෝය වැඩි

15 පිටුවට...

ශාස්ත්‍රවේදී වත්තේගම කුසලධම්මා මෙහෙණින් වහන්සසේ
ශ්‍රී ධර්මප්‍රදීපාරාමය, ගොකරැල්ල

# පාරමිතා

සරාසැකි කප් සුවහසක් කල් සපිරූ දානාදී පාරමිතාවන්ගේ අසිරිමත් බල මහිමය ඵල ගැන් වූ විජය ශ්‍රී ජයසිරි මහා බෝධි මූලයේදී දස මරුන් පරදවා තිලොගුරු සම්මා සම්බුද්ධත්වයට පත් අප ශාන්ති නායකයාණෝ එකම මායක එකම දිනයක සිදුකළ මේ සුපින්බර පෙළහර නිසා අන් සියලු ආගම්, ශාස්තෲවරුන් අභිබවා විරාජමාන වෙති.

දඹදිව මධ්‍ය දේශයේ සාධු ජනගහණයට නිකේතනයක් වන් කපිලවත්ථු පුරවරයෙහි උභය කුල පාරිශුද්ධ ශුද්ධෝදන මහ රජුගේ අග මෙහෙසිය වූ මහාමායා දේවියගේ කුස පිළිසිඳගත් අප මහා බෝසතාණෝ වෙසක් පුන් පොහෝදා ලුම්බිණී සල් උයනේදී උපත ලැබූහ. බුදු උපතක අසිරිය ලොවට පාමින් මිහිකත තුරුලේ සුපිපි සත් පියුම් මත විරාජමානව දෙපා තැබූ මේ මහා බුද්ධාංකුරයාණෝ "මම ලොවට අග්‍ර යෙමි, ජ්‍යෙෂ්ඨ යෙමි, ශ්‍රේෂ්ඨ යෙමි" මේ මාගේ අන්තිම ජාතියයි. මින් මතු පුනර්භවයක් නැතැ'යි සිහනද නංවා දෙව් මිනිසුන් සහිත තුන් ලොවම විශ්මිත කරවා පාරමී ගුණ විභූතියෙන් සෝබා සම්පන්න වූහ.

අසිත ඍෂීන් වැනි මහානිසත්වයන්ගෙන් අභිවන්දනයක් ලබා සිද්ධාර්ථ නාමයෙන් සර්ව මිත්‍ර ආදී බ්‍රාහ්මණ ගුරුන්ගේ සිප්සතර හදාරා සොළොස් වියට පැමිණ පූර පක්ෂයේ සොළොස් කලාවෙන් ප්‍රතිපූර්ණ සඳමඩල සේ බබළවන්නට වූහ.

සඳකිඳුරුදාවෙන් සිහිපත් වන සංසාරගත ප්‍රේමයක පූජනීයත්වය බෝසත් බිරියක වී සනාථ කරගන්නට පාරමිතා පිරූ යශෝධරාවන්ගේ අතගෙන රම්‍ය සුරම්‍ය සුබ නමින් වූ ප්‍රසාදත්‍රයෙහි ගිහි සුව විඳි සිදුහත් බෝසතාණෝ ජීවිතයක යථාර්ථය පසක් කරන පෙර නිමිති සතරක් දැක මහභිනික්මන් කළෝය.

බුදු බව පතා දන් දුන් ජාලිය ක්‍රිෂ්ණජිනා වන් දරු සෙනෙහසේ ප්‍රතිමූර්තිය රාහුලයෙකු සේ උපත ලද මොහොතේ කිශාවන්ගේ නිවුණු පදවෙන් ශාන්ත වී ඇසළ සඳ නිසලව බලා සිටියදී කෙලෙස් අනෝමාව තරණය කරන්නට තිර අදිටන් පූරණය වී තිබුණි.

මෙතැන් පටන් නිවීමේ මාර්ගය සොයා යාමේ කාර්යයෙහි යෙදුණු බෝසතාණෝ එකල විසූ ධර්මධරයන් වන භාර්ගව තාපසයන් වෙත ගොස් සසර පුරුදු කළ අනතිමානී සිසු ගුණයන් මොනවට තහවුරු කරමින් දහම් උගත්හ.

සියලු සිප් අධ්‍යයනය කළ ද නිර්වාණ මාර්ගය එහි නොතිබුණු බැවින් පිළිවෙළින් ආලාර කාලාම, උද්දකරාම පුත්ත යනන තාපසයන්ගේ ඇසුරෙහි නිවන් සුව සෙවූහ. තදන්තරව ගයා පෙදෙස් සේනානි නම් සියම් ගම් පෙදෙසට පැමිණ අත්තකිලමකානු යෝගී දුෂ්කර ක්‍රියා පිළිවෙතින් විමුක්ති රසය සොයා ඉන් ලද අත්දැකීමෙන් ශරීරයට අධික ලෙස දුක් දීමත් ශරීරයට අධික ලෙස සැපදීමත් යන අන්ත දෙක ප්‍රතික්ෂේප කළ යුතු වග තහවුරු කරගත් එතුමා මැදුම් පිළිවෙතින් විමුක්ති සාදන මගට සමීප වූහ. සම්බුද්ධත්වය පතා තිර අදිටනින් බෝමැඩ වැඩහුන් මහා බෝසතාණෝ බුදුවී මිස නොනැගිටිමියි සිතා බවුන් වඩත්දී වසවත් මරුන් සපැමිණි වජ්‍රාසනය තමන් සතු යැයි අභියෝග කළහ.

බෝසතාණන් වහන්සේගේ අභිප්‍රාය වන්නේ සත්‍යය හඳුනා ගැනීමයි. සත්‍යය දැකීම මරණය තුළින් කළ යුතු ක්‍රියාවක් බවයි මාරයාගේ ප්‍රකාශය. වජ්‍රාසනය යනු බුදු බවට පැමිණ සත්ත්වයා සසර කතරින් එතෙර කරවන උතුමන් සතු අසුනක් බව බෝසතුන් ප්‍රකාශ කළද මාරයා එය නොපිළිගනී. ඔහුගේ තර්කය වන්නේ සත්‍යය ඇත්තේ මරණය තුළ බවයි.

දුකින් මිදීමේ එකම මඟ මරණය වන මිත්‍යා මතයකි. එය අවිද්‍යාව හා බැඳුණු සංකල්පයකි. මරණින් මතු සියල්ල අවසන් වේය යන සංකල්පය සත්‍යය ලෙස ගත් උච්ඡේදනාදීන්ගෙන් පිරුණු ලෝකය මාරයාට පක්ෂපාතී වියහැකි වුත් චතුරාර්ය සත්‍යය ලොවට හෙළි කරන්නට පහළ වූ උතුමන් වහන්සේ ඊට එකඟ නොවෙති.

සත්‍යය දැකිය යුතු වජ්‍රාසනය හිමි විය යුත්තේ නොව බුද්ධියට බවත් බුද්ධියේ විකසිත මොහොත බුද්ධත්වය බවත් එක හෙලාම විශ්වාස කළ බෝසතාණන් වහන්සේ මාරයාගේ අභියෝග කිසිවකින්වත් නොසැලුනහ.

"මාරය මේ වජ්‍රාසනය ඔබටඅයත් බවට ඇත්තේ කුමන සාක්ෂියක්දැයි බෝසතාණන් විචාල කල්හි සියලු මාර සේනාවෝ අපි සාක්ෂියි. අපි සාක්ෂි හඬ නැගූහ. "ඔබට ඇත්තේ කුමන සාක්ෂියක්දැයි මරුන් විචාල කල්හි මේ වජ්‍රාසනය මට අයත් බවට මිහිකත සාක්ෂි යැයි මහ පොළොවට අත දිගු කළහ. එකල මිහිකත කම්පා වී බුද්ධියටම සත්‍යය අයත් බව තහවුර කර දුන්හ. මාර සේනාවෝ පලා ගියහ. අනතුරුව අප මහ බෝසතාණන් වහන්සේ ප්‍රථම ද්වීතීය තෘතීය ආදී වශයෙන් ධ්‍යානයන්ට සමවැදී වෙසක් සඳ වැගී අවරට බැස සඳ කැන් දහරින් ගයා පෙදෙසත් නේරංජනා නදියත් දොවවා සරසාලූ අලුයම සකල ක්ලේෂයන් පරදවා සම්මා සම්බුද්ධත්වයට පත්වූහ.

දුත දුකට හේතුව දුක නැති කිරීම දුක නැති කිරීමේ පිලිවෙත යන සිව්සස් දහමින් තිලොවම එළිය කළ තථාගතයාණෝ සත් සතියක් විවේක සුවයෙන් අවිදු අඳුරු දුරුවී යන විද්‍යා ඥානය විහිදී යන අමා සුව පිරි සඳහම් දෙසා ලොව සුවපත් කළහ.

අනේක ජාතිවල සංසාරේ සොයා ආවෙමි වෙහෙස වී පස් කඳ නැමැති මේ ගෙය හදන වඩුව මා තොප දිටිමි සියලු කැණිමඩල සුන් කළෙමි යළි යළිත් ගෙය සාදනු බැරිය තෘෂ්ණාව ක්ෂය කළෙමි එයින් මා ජය ලැබුවෙමි.

බුදු පදවි ලද මහා වීරයාණෝ උදාන ගීයෙන් ලොවට හෙළි කළේ තෘෂ්ණාවෙන් වෙළී සසර සැරි සරණ අප දුක් කඳ නිමා කළයුතු වන්නේ තෘෂ්ණාවෙන් නික්මී ලද නිවනින් බවයි.



එ කරුණා නිධානය ලොවට පහළ වූ අසිරිමත් වෙසක් පුන් පොහොය දිනක් යළි උදා වී ඇත. මේ නැගෙන්නේ එදා ගයා සිරසේ නේරංජනා ගං දිය රැළි අතර සඳ කිරණ හෙළූ සුපුන් සඳමයි.

දසමරුන් ප්‍රමුඛ මාර සේනාවන් පිරිවරා සපැමිණි මාර දිව්‍ය පුත්‍රයා බුදු පදවි ලත් බෝසතුන්ට අභියෝග කළ මොහොතේ මේ ජය අසුන මට හිමි බවට සාක්ෂි දරනු ඇතැයි මහ පොළොවට ශ්‍රී හස්තය දිගු කළ මොහොතේ කම්පා වී සාක්ෂි දැරූ මිහිකතමයි තවමත් අප උහුලා හිඳින්නේ.

ඒ ලොව කම්පා කළ බුදු උපත සකළ සත්තව ප්‍රජාවගේ දුක් නිවන්නටම සිදුවූවක් බැවින් මංමුලා වී අසරණයන් නොවී තවමත් අපි ද උත්සුක වෙමු. මේ අසම සම බුදුවදනින් නිවී සැනසෙන්නට සසර දුකින් අත්මිදෙන්නට.

ශාස්ත්‍රපති වික්‍රමසිංහ අතපත්තු


භද්‍රා කුණ්ඩලකේශී 12
සැකසුම හා චිත්‍ර...
....ථෙරී ගාථා ඇසුරෙනි.....
මැණියෙනි පියාණෙනි ඔබලාට පිං සිද්ධ වෙනවා ..මා.. වෙනුවෙන් ..මේ.. කරන දේවල් වලට..
...සඳළු තිප්පි වලින් සැරසුන... සත්තුක භද්‍රා කුමරිය සිටින ...සඳළු තලයට පැමිණෙයි..
සත්තුක
සිටු කුමාරි.
ඇයි ඔබ මාව මරණයෙන් ගළවාගත්තේ
ඔබට.. තිබෙන ආදරේ නිසයි ඊයේ ඔබව මරන්ට ගෙන ගිය වෙලේ මා.. ඔබ ..දුටුවා.. ඔබේ ඔය රූප කායටත්.. හැඩි දැඩි සිරුරටත් මා වශී වුනා... සත්තුක. මා.. ඒ මොහොතේමයි අදිටන් කර- ගත්තේ.. ඔබව මගේම කරගන්ට.....
නමුත්.. මා සොරෙක්.. ..කුමරිය..
ඒත් ඔබ.. රජතුමාගෙ අග්‍ර පුරෝහිත- ගෙ පුත්‍රයා... ඔබ ඒක මතක තියාගන්ට..
පියාණන් හා මැණියන් පවසා සිටියා.. නුදුරු දිනකදීම ඔබට මාව කසාද බන්දා දෙන බවට
මේ අවස්ථාවෙ මට ඉවසන්ට වෙනවා.. ..හ්ම්...
අනේ.. ඇත්තද කුමාරි.. මමත් ..ඔබට හරිම ආදරෙයි.
ඉන් පසු.. අප කාටත් හොරෙන් මේ සිටු මැදුරේ අලුත් ජීවිතයක් පටන් ගනිමු සත්තුක---
ඔව්.. සත්තුක.. මමත් ඔබට හරිම ආදරෙයි.. හැබැයි.. මේ සිටු මැදුරෙන් පිටතට යන්ට නම් හිතන්ට එපා.. ඔබව.. හඳුනාගනී..

රංගිරි ශ්‍රී ලංකා
RSL NEWSPAPER

සුරස අතිරේකය






# බුදුරජාණන් වහන්සේ

බුදු පියාණනේ
මනු සත් දෙරණේ අඳුර මකා
පුනරාගමනය කළ මැනවී
පුනරාලෝකය දෙනු මැනවී

පියාණනේ ඔබ බෝ මැඩ සිටියත් නිසංසලේ
ඔබ සෙවණේ දුසරිත් වැඩිවෙයි නිරන්තරේ
බැතියෙන් සපිරුණු ඔබගේ ලෝකය
නොදහම මැද මියැදී අවසානය

නිවන්පුරේ සිට අදිසි වෙසින් හෝ වැඩම කරන්
මිනිසත්කම ගැන බණ පදයෙන් මෝහය දුරලන්
ඔබ දුටු නිර්මල දැහැමි අතීතය
අදමිටු ජනයින් අතර අනාථය

ගේය පද - මහාචාර්ය සුනිල් ආරිරත්න
තනුව හා සංගීතය - සරත් දසනායක
ගායනය - ටී ෂෙල්ටන් පෙරේරා

අප සියල්ලෝම සසර කතරේ අතරමංව මං මුලා වී සිටිමු. එහෙත් අපට එය නොපෙනේ, නොදැනේ. අපට පෙනෙන්නේ විචිත්‍ර වූ සර්ව සම්පූර්ණ වූ ලොවකි.

ලාභය, යසස, ප්‍රශංසා ආදී වූ සුඛවාදී වූ අවස්ථා වල දී ප්‍රීතියෙන් පිනා යන මිනිසුන් සිතන්නේ සදාකාලික සතුටක් සැනසුමක් මෙලොව පවතින බව ය. ජීවිතයත් සැප සම්පත් ආදියත් සදාකාලික යැයි සිතන ඇතැමුන් තම සැප සම්පත් වර්ධනය කර ගැනීමට අයථා ක්‍රියාවන්ට යොමු වෙති. මිනිසුන් තලා පෙලමින් සමාජයට අහිතකර මත් පැන් මත් ද්‍රව්‍ය වැනි සමාජ විරෝධී ක්‍රියා වල නිරත වෙමින් මුදල් උපයති, මුදලට මිනී මැරුම් සිදු කරති. මේ සියල්ල අවසන සදාතනික සැපවත් භාවය ප්‍රාර්ථනා කරති. මේ අපචාරී ක්‍රියා නිසාම තමන්ගේත් අන් අයගේත් ජීවිත හානි දේපල හානි සිදු වුවත් ඔවුන් මෙම ක්‍රියාවන්ගෙන් මිදෙන්නේ නැත. ඒ වෙනුවට සිය අපචාරී ක්‍රියාවන් සඟවා ගන්නට තව තවත් දූෂිත ක්‍රියා සිදු කරති.

වර්තමාන අධිවේගී ජීවන රටාව හා අර්ථ ක්‍රමය තුළ එකෙකු නසා හෝ තමා රජවීමේ බලාපොරොත්තුව නිසා තම දියුණුව උදෙසා ඕනෑම පහත් කාර්යක නිරත වන්නට මිනිසුන් මැලි නොවෙති උගතුන් බුද්ධිමතුන් ද මිල මුදලට නතුවී ඕනෑම පහත් ක්‍රියාවක් කරන්නට පෙළඹී සිටිති. ඔවුහු අල්ලස් වංචා මගින් රාජ්‍ය දේපල ද කොල්ල කති.

එපමණක් නොව අසීමිත රාග ගින්නෙන් පෙළෙන මිනිසා කම් සැප සොයා යන්නට ගොස් ජීවිතයම සනඳුරෙහි සඟවා ගති. බිඳුණු පවුල් වල දරුවන්ගේ වේදනාව බිරින්දෑවරුන්ගේ සැමියන්ගේ වේදනා වලින් සමාජය පිරී තිබේ. පාසල් දරුවන් තරුණියන් කාමාතුරයන්ට බිලි වී මියැදෙති. ඇතැමුන්ට ය හුදු ප්‍රවෘත්තියක් පමණකි. මෙවන් නොමිනිසුන් මැද මනුසත් බවින් පිරිපුන් යහපත් මිනිසුන්ට නිරන්තයෙන් සැකෙන් භයෙන් ජීවත්වන්නට සිදු වී තිබේ.

පියාණනේ ඔබ බෝ මැඩ සිටියත් නිසංසලේ
ඔබ සෙවණේ දුසිරිත් වැඩිවෙයි නිරන්තරේ

නිර්මල බුදු දහම ද කෙලෙසන පාපතරයන් බුදු දහම නමින් විවිධ වූ අමන කම් කරති. නිරතුරුව බුදු දහම දෙසන බුදු දහම අසන රටේ බුදු දහම පිළිපදින්නෝ ඉතා අල්ප ය. බුදු දහ සුරකින පින් බිම පවා දුශ්චරිත වලින් අපවිත්‍රව ඇත. මේ නිසා බුදු දහම තුළ නැවතසංගායනාවක් සිදු විය යුතු ය.

බුදු දහම තුළ පවතින්නේ නම්‍යශීලී ප්‍රතිපත්ති සමුදායකි. එය කිසිවෙකුටවත් බුදු දහම අදහන්නයැයි බල කිරීමක් සිදු නොකරයි. "ඒහි පස්සිකෝ " යන වදන අනුව බුදු දහම යනු තමා විසින්ම යහපත් යැයි අවබෝධ කරගෙන පිළිපැදිය යුතු දහමකි. එනිසාම උගත් බුද්ධිමත් යැයි කියා ගන්නා ඇතැමුන් ද නූගතුන් ද මෙම ප්‍රායෝගික දහම අතහැර වෙනත් මිත්‍යවන් පසු පස ගමන් කරති. එහි හරවත් භාවය විද්‍යාත්මක භාවය වටහා නොගෙන අන්ධකාරයේ සිටිති. "මධුවා මංඤති බාලෝ" නම් ධම්මපද ගාථාවට අනුව හැන්ද මාළු පිණි රස නොහඳුන්නා සේම බෞද්ධ නම් දරා ගත්තෝ එහි වටිනාකම නොහඳුනති. මේ නිසා අමනකම් කරමින් අමන ක්‍රියාවන් අනුමත කරමින් අපි සිටිමු. එ නිසා මේ සියලු අමනයින් රැසම ඉන් මුදවා ගන්නට හැක්කේ තවත් බුදු කෙනෙකුට පමණි.

සමාජ ශෝධනයක් කොට ඔවුන් නිවැරදි මග ගෙනයන්නට බුදු කෙනෙකුගේ පුනරාගමනයක් අවශ්‍යය. අදිසි වෙසින් හෝ බුදු රදුන් යළිත් පැමිණේ නම් එය මහත් අස්වැසිල්ලකි. ඒ මහා ශාන්තිය ජිවිත රැසක් දුඛිත භාවයෙන් මුදවා ගන්නට සමත් වනු ඇත. බුදු දහම සුරකින තැන් විසින්ම බුදු දහම දූෂණය කර ඇති විටෙක එයින් ලැබිය හැකි සැනසුමක් සෙතක් නොවේ. බුදු දහමේ නිර්මලත්වය කෙලෙසී අවසන්ය. නිවැරදි මග පෙන්වන්නට ගුරුවරයෙකු විය හැකි කිසිවෙකුත් සමාජයේ නැත.එනිසාය බුදු කෙනෙකුන්ගේ පුනරාගමනය අවශ්‍ය වන්නේ.


මේ දෙරණේ අන්ධකාරය දුරු කරන්නට අප තවත් බුදු කෙනෙකු වඩින තෙක් බලා සිටිමු. අපට ඇත්තේ එම බලාපොරොත්තුව පමණි.

මහාචාර්‍යය සුනිල් ආරියරත්නයන්ගේ පද වැලට ෂෙල්ටන් පෙරේරා ප්‍රාණය සපයා ඇති අයුරු අපූරුය. ඔහුගේ හඬ මහත් ගැඹුරු ජීවන අරුතක් පසක් කරමින් ශ්‍රද්ධා රසය ගෙන්වමින් ගලා යයි.

-

**චාමිකා ජනනි ද සිල්වා**

# සැනසීමට මඟ ඉවසීමයි



අද සමාජය තුළ පවතින ප්‍රධාන කරුණක් ලෙස මිනිසුන් ඉවසීමක් නැතුව කටයුතු කිරීම හැදින්වීමට පුළුවන. අද සමාජයට අවශ්‍ය ඉවසීමෙන් කටයුතු කරන පිරිසක්ය. ඉවසීමේ අනිත් පැත්ත නොඉවසීමයි. එනම් හදිසි කෝපයයි. අද බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ ඉවසුම් නැති, හදිසි කෝපයක් ඇති පිරිසක්ය. ඒ සඳහා බුදු දහම පැත්තෙන් කරුණු කාරණා දැනගෙන සැනසීමක් ලබා ගැනීම කළ යුතුව ඇත.

ඉවසීම තුළින් සැනසීම ලැබෙන්නේ කෙසේද? යන්න විමසා බැලීමෙන් පැහැදිලි වන්නේ ප්‍රතිවිරුද්ධ කෙනා හෝ පක්ෂය දැඩි තිරණ ගැනිමෙන් වැළකී සිටීමයි. උදාහරණයක් ලෙස යම් කිසි කෙනෙක් අපට බැන්නොත් හෝ ගැහුවොත් අපත් ඔහුට ඒ දේම කරන්න යෑම තුළින් සිදුවන්නේ නොනවතින ගැටුමක් ඇතිවීම හා වෛරසයේ දෝංකාරය උත්සන්න වීමක්ය. වෛරය යනු සත්වයා විනාශයට පත්කරන මානසික විපර්යාසයකි. එතුළින් කායික මානසික දෙඅංශයම පිරිහෙනු ඇත. ඒ නිසා බුදුරජාණන් වහන්සේගේ දේශනය මතක් කිරීම වැදගත් වේ.

"නහී වේරේන වේරානි - සම්මන්තීද කුදාචනං
අවේරේනච සම්මන්ති - එස ධම්මෝ සනන්තනෝ"

"වෛරයෙන් වෛරය නොසන්සිඳේ. අවෛරයෙන් වෛරය සංසිඳේ." තමාගේ සතුරා තමාමය. අපට මිතුරෝ ඇති කර ගැනීමටත් සතුරෝ ඇති කර ගැනීමටත් පුළුවන. හදිසි කෝපය, ක්ෂණික තරහව, තමනුත් අනුනුත් විනාශ කිරීමට පෙරමුණ ගන්නේය. එබැවින් සතුරා ඉදිරියේ වුවද ඉවසීම අත්‍යාවශ්‍ය වන්නේය. කියමනක් තියනවා "හොස්ස ලගින් මැස්ස යන්න බෑ" කියලා. අද සමාජය තුළත් පැහැදිලි වන්නේ පුංචි පුංචි දේටත් මිනිසුන් ඇන කොටා ගන්න මරාගන්න ස්වභාවයකි. ක්‍රිස්තුස් වහන්සේ පවසා ඇත්තේ කෙනෙක් කම්මුලට ගැසූ කළ අනිත් කම්මුලත් අල්ලන ලෙසයි. එතුළින් ක්ෂණික තරහක් ඇතිවුන කෙනාට ලැජ්ජාවක් හෝ පසුතැවීමක් ඇතිවනවාට සැකයක් නැත.

අද පැහැදිලි කරුණක් ලෙස බසයක ගමන් කරන විට, වෙළඳ පොලක බඩු මුට්ටු ගන්නා විට, ටවුමක ගැවසෙන විට, පුංචි දේටත් බහින් බස් වී විශාල ගැටුමකට මුල පිරීම දක්නට ලැබේ. එතුළින් පුද්ගල හා දේපල විනාශයක් ඇතිවනු නියතය. "පනින්න පෙර සිතා බලනු" කියා පවසන්නේ යමක් කිරීමට පෙර සිතිය යුතු බවයි. ඒ තුළ ඉවසීමෙන් කටයුතු කළ යුතු බව ඇගවේ. "ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය" ඉවසන පුද්ගලයා සතුරන් ජවරැන්නා අයුරු ප්‍රකට වේ. ඉවසීම තුළ පවතින්නේ ක්ෂණික හෝ කෙටිකාලීක සැනසීමතට වඩා දිගු කාලීන සැනසීමක්ය. දීඝිති කුමාරයා තමා සේවය කළ බරණැස් රජු විනාශ කරන්න තුන් වතාවක්ම කඩුව අරගෙනත් දුරදිග බලා ඉවසීම තුළින් එය යටපත් කර ගන්නා ලදී.

ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකු වුවද රාජ්‍ය සේවකයෙකු වුවද, ඕනෑම නිලතලයක් දරණ හෝ නොදරණ කෙනෙකු වුවද තමන් කරා එන අභියෝග, ප්‍රශ්න, ගැටලුවලදී එයින් කම්පාවට පත්වීම හෝ ක්ෂණික තරහක් ඇති කර ගැනීම එතරම් හොඳ දෙයක් නොවේ. බුදුරජාණන් වහන්සේට තරම් සතුරන්ගේවිරුද්ධ කරුවන්ගේ ආක්‍රමණ වලට මුහුණ දීමට සිදුවූ තවත් කෙනෙකු මිහිපිට නැති තරම්ය. උන්වහන්සේ කිසිම තැනකදී අටලෝ දහමෙන් කම්පා වූවේ නැත. ඉවසීමේ පරතෙරටම වැඩිය උන් වහන්සේ ක්ෂාන්තිවාදී ජාතකයේදී ඉවසීම මොනතරම් ප්‍රගුණ කලාද යන්න පැහැදිලි වේ.

සැනසීම ප්‍රාර්ථනා කරන ඕනෑම කෙනෙකු ඉවසීම ප්‍රගුණ කළ යුතුය. එය ලෞකික වශයෙන් ද ලෝකෝත්තර වශයෙන්ද හොඳ විපාක ලබා දෙන උසස් ගුණාංගයකි. විශේෂ වශයෙන් අද සමාජයට අවශ්‍යව පවතින්නේ ඉවසීමෙන් කටයුතු කරන පිරිසක් හදාගැනීමය. ඒ උදෙසා සෑම කෙනෙකුටම ශක්තිය, ධෛර්‍ය ලැබේවා. ඉවසීමෙන් දෙලොවම සැනසීමට පත්වේවා යන්න මගේ පැතුමයි.

පූජ්‍ය ගලගෙදර රතනවංශ හිමි

# නව වසර යහපතක් ලෙස සකසා ගන්නේ කෙසේද?

අවුරුද්දක් ගෙවී අවුරුද්දක් ලබා මේ අපි ගෙවන්නේ අලුත් අවුරුද්දක අලුත් මාසයකි. අවුරුද්දේ පළමු මාසයයි. සිංහල බෞද්ධ හදවත් තුළ සැමදා ඊර්ෂ්‍යාව, වෛරය, ක්‍රෝධය පහව ගොස් මෙත් මල් පිපී තිබේ නම් කොතරම් සුන්දර බවට මේ රට පත්වනු ඇද්ද? මේ මාසයේ අපි ගෙවුනු වසර දෙස ආපසු හැරී බලමු. අපි ආශ්‍රය කළේ කවුරුන්ද? ජීවත් වූයේ කෙසේද? අපේ හැසිරීම අනුන්ටත් තමන්ටත් යහපතක් වූයේද? යන්න පිළිබඳව මඳක් සිතා බලමු. ඉන් පසුව අප ආශ්‍රය කළ යුත්තේ කවුද? ආශ්‍රය කළයුත්තේ කෙසේද? ඒ ඇසුර මේ අවුරුද්දේ තමන්ටත් අන්අයටත් යහපතක් වන ලෙසින් සකසාගන්නේ කෙසේද? යන්න විමසා බලමු. ඒ නිසාම අපි ඇසුරු කළ යුතු සත්පුරුෂයන් ගැනත් ඇසුරු නොකළ යුතු අසත්පුරුෂයන් ගැනත් මඳක් විමසා බලමු.

මේ ලිපියට මාතෘකාව ලෙසින් මා ලබාගත්තේ "අලගියවන්න මුඛවැටි කිවිඳුන් විසින් රචිත සුභාෂිතය නම් ග්‍රන්ථයේ සඳහන් වන කවියක කොටසකි." එය මෙසේ අප හඳුනාගනිමු.

"සත් ගුණ යුත් සතන් හට වැඩ කළොත් සරු
අන් පිට දියුණුවම පල දේය නිරතුරු
වන් කළ දිය නෙරළු තුරු මුලට පියකරු
දෙන් මුදුනින් පල රුස රැගෙන අමයුරු"

මෙයින් පැවසෙන්නේ සත්පුරුෂ ගුණයෙන් යුක්ත වූ සත්වයන්හට යහපතක් කළහොත් නිතරම එය දෙගුණ කොට අන්පිටටම විපාක දෙන බවත් එය හරියට පොල් ගස්වල මුලට වක්කරන ජලය හැරගෙන එම ගස්වලින් අමෘතයක් වැනි ඵල සමූහය මුදුනින් ලබා දෙන්නක් වැනි බවයි. මේ අන්දමට අපි ඇසුරු කරන පුද්ගලයන් සත් පුරුෂයන් නම් අපිට ඔවුන්ගෙන් පෙරලා උපකාර ලැබෙයි. පුද්ගලයාට උදව් උපකාර කරන්නේ ඔවුන්ගෙන් පෙරලා උපකාර ගැනීමේ බලාපොරොත්තු ඇතිවම නොවන බවත් සිහි කොට යුතුයි. නමුත් ඇසුරු කරන පුද්ගලයාගේ ලක්ෂණ කෙබඳු දැයි හඳුනාගෙන අපි ඇසුරු කළ යුතුය. බුදුන්වහන්සේ අපට දේශනා කර තිබෙන

"මාතා පෙත්ති භරං ජන්තු
කුලේ ජෙට්ඨා පචායිනං
සන්හං සඛිල සම්භාසං
පේසුනෙය්‍යප්පහායිතං
මච්චේර විනයේ යුත් තං
සච්චං කෝධාභිභූං නරං
නංවේ දේවා නාවතිංසා
ආහුසප්පුරිසො ඉති"

යන බුදුවදනට අනුව සත්පුරුෂයාගේ ලක්ෂණ මෙහි සඳහන් කර ඇත. එයට අනුව දෙමාපියන් පෝෂණය කිරීම, කුල දෙටුවන් පිදීම, ක්‍රෝධ නොකිරීම, ප්‍රිය වචන කථා කිරීම, කෙලෙස් මසුරුගති අත්හැරීම සහ සත්‍යය වචන කථා කිරීම සත් පුරුෂයාගේ ලක්ෂණ වෙයි. එබඳු සත්පුරුෂ අයට දෙවියන් පවා ප්‍රිය කරති. අපි කවුරුන් වැදුම් පිදුම් ලැබීමට හෝ කීර්ති ප්‍රසංසා ලැබීමට ඉතා ප්‍රිය කරන්නෙමු. නමුත් එයින් ඉතා හොඳින් කැපී පෙනෙන්නේ සත් පුරුෂ පුද්ගලයන්ය. ඔවුන් කීර්ති, ප්‍රසංසා, ගෞරවය ආදිය ඉබේම ඔවුන් වෙත ඇදී එයි. ඒ ඔහුගේ සත් ගුණයන් නිසාය. ඔවුන්ට දෙවියන් පවා වැදුම් පිදුම් කරයි. දෙවියන් පවා මනුලොවට වඳින බව

"යේ ගහට්ඨා පුඤ්ඤකරා සීලවන්නා උපාසකා
ධම්මේන දාරං පෝසෙන්ති තං නමස්සාමි මාතලී"

යනුවෙන් පෙන්වා දෙයි. මෙය මාතලී නම් සක් දෙවිඳුගේ රථාචාර්යයා සක්දෙවිඳුගෙන් ඇසූ පැනයකට පිළිතුරු වශයෙන් සක් දෙවියන් ඔහුට දුන් පිළිතුරයි. ඇසූ පැනය නම් "මනුලොව දෙසට හැරී ඔබවහන්සේ වඳින්නේ කාටද යන්නයි" එයට පිළිතුර ඉහත ගාථාවයි. එහි සඳහන් වන්නේ පුණ්‍යවන්ත වූ සිල්වත් උපාසකවන්ටද ධර්මයෙන් පෝෂණය වූ මිනිසුන්ටද සක්දෙවියන් නමස්කාර කරන බවයි. මෙසේ දෙවියන් පවා ප්‍රිය කරන සත් පුරුෂ උතුමන් අද සමාජයේ තරමක් දුෂ්කරය.



අද දෙමාපියන්ට සැළකීම, සත්‍ය කථා කිරීම, කුලදෙටුවන් පිදීම, මසුරුමල දුරු කිරීම ආදී සත් පුරුෂ ලක්ෂණ ලෙස පෙන්වා දුන්නත් සමාජයේ බොහෝ දෙනෙක් මමත්වය පදනම් කරගෙන ඉතා ආත්මාර්ථකාමීව ජීවත් වෙති. තමන් අද සිටින තත්වයට ගෙන ආ ආදරණීය දෙමාපියන් පවා අමතක කර දමන, බොරුව, මසුරුකම රජයන සමාජයකට අපේ බෞද්ධයන් ඇදෙමින් සිටින බව කණගාටුවෙන් වුවද ප්‍රකාශ කළ යුත්තකි. බොහෝ දෙනෙක් මෙය කථා බහට ලක් කරන විට පවසන කරුණක් නම් අද කාලයේ බොරුවෙන් වංචාවෙන් තොරව ජීවත් විය නොහැකි බවයි. නමුත් බුදු දහම කෙරෙහි පැහැදිළි අවබෝධයක් ඇති පුද්ගලයා යථාර්ථය අවබෝධ කරගනී. කොතරම් නින්දා අපහස, තාඩනපීඩන වලට ලක් වුවත් තමන්ටත් අනුන්ටත් දෙපිරිසටම යහපත සිදුවන දෙයට සත්පුරුෂයා කැමතිය. ඔහුගේ ගුණ සුවඳ කොතරම් හිරිහැරවලට ලක් කළත් එතලෙස පවතී. මේ බව අපට සිහිගන්වන සුභාෂිත කවියා

"අමිත ගුණ නුවණ යුත් උතුමෝ පබඳ
අනක වෙහෙස ලදුවත් නොම වෙති දුහද
දියත පතල සුවදැති සොඳ සඳුන් කඳ
සිඳින මඩින එකලෙස පැමිණෙයි සුවඳ''

යනුවෙන් පවසයි. එහි පැවසෙන ආකාරයට "අප්‍රමාණ ගුණයෙන් හා නුවණින් යුත් උතුම් පුරුෂයෝ කෙරවලක් නැති හිරිහැරවලට පාත්‍ර වුවත් දුෂ්ඨ සිතක් ඇති කර නොගනී. දස දිසාවෙහි පැතිරුණු සුවඳින් යුත් යහපත් සඳුන් දණ්ඩ කපන විටත්, කුඩු කරන විටත් එක් විදියටම සුවඳ පැතිරී යන්නා සේ සත්පුරුෂයාද කොතරම් බාධා කම්කටොලු ආවත් එයින් නොසැලී තමාගේ ගුණය ලොවට පෙන්වන බවයි. එමෙන්ම නුවණැති සත් පුරුෂයා පුද්ගලයාට යන්තම් හෝ යහපතක් කළොත් එය ගලෙහි කෙටූ අකුරක් මෙන් සදා පවතී. නමුත් අනුවණ පුද්ගලයාට කොතරම් විශාල අයහපතක් කළත් දියමතුපිට අඳින ලද ඉරක් සේ එය මැකීයන බවද සුභාෂිත කතුවරයා පෙන්වන්නේ,

"නැණැති දනන් හට මද ගුණයක් කළ ද
පවතී ගල කෙටූ අකුරක් මෙන් නිබඳ
විමනි දනන් හට කළ නිති ගුණ නො මඳ
එය නැති වේය දිය පිට ඇඳි ඉරක් ලෙද"

යනුවෙනි. මේ අන්දමට සත්පුරුෂයා හඳුනා ගන්නා සේම සත් පුරුෂ නොවන පුද්ගලයන් ගැනද අපි හඳුනා ගනිමු. ගුණයෙන් හා නුවණින් යුක්ත නොවන පුද්ගලයාගේ ලක්ෂණද සුභාෂිත කතුවරයා මෙසේ පෙන්වා දෙයි.

කොතෙක් ගුණ කළත් දුදනන් හට අසුබ
අතක් පමණවත් නොම කෙරෙති පිළිලබ
එ උක් රසෙහි දැමුවන් නිඹ බිජු කිරබ
උදක් නිත්තමය පසමග තුරෙහි නිබ

මෙහි දක්වා ඇති පරිදි අයහපත් වූ අසත්පුරුෂයන් හට කොතරම් යහපතක් කළත් (ඔවුහු) අක් ගෙඩියක් පමණවත් ආපසු දීමක් නොකරති. උක් පැණිවලට බහා කිරි හා ජලය වත් කොට කොහොඹ ඇටයක් පැල කළත් කොහොඹ ගසෙහි පංචාගයම තනිකර තිත්ත වන්නා සේය. යනුවෙන් එතුමා අසත්පුරුෂයාට කෙතරම් ගුණ කළත් ඔහුගේ අයහපතක් බව කිසිම දිනක අත් නොහරී. එසේම මෙයම පැහැදිලි කරන "ප්‍රත්‍ය ශනකය" එය දක්වා තිබෙන අන්දමද මා මනසට නැගෙයි.

ශුද්ධ පර්වත ම ධ්‍යෙතු - නිම්බ බීජං ප්‍රතිෂ්ඨිතං
ක්ෂීර ධාරා සහස්සානී - නිඹිබ කඃ මධුරායනේ
(ප්‍රත්‍යඨ ශනකය)

මෙහි සඳහන් වන්නේද උක් සකුරු පර්වතයක් කොට ඒ මැද කොහොඹ ඇටයක් සිටුවා එයට කිරි කළ ගෙඩි දහසක් දමා සැදුවත් එම කොහොඹ තිත්තම බවයි. අපි මෙය සමාජය දෙසට සමාජය දෙසට යොමු කළොත් සත්පුරුෂ මිනිසුන් අතර කොතරම් ජීවත් වුනත් අඥාණ මිනිසුන් සත්පුරුෂ ගුණ බිඳක්වත් හඳුනා නොගනී.

ලෝකය විවිධාකාරය. විවිධාකාර වූ මිනිසුන් වෙසෙති. එබදු මිනිසුන් වෙසෙන ලෝකයේ සත්පුරුෂයා හා අසත්පුරුෂයා හඳුනාගැනීමද ඉතා දුර්ලභය. ඒ බව,


වනාගේ බහු වෘක්ෂානී
පුෂ්ප වන්දන දුරුලභඃ
බහු ලෝකේ මනුසසය
සත් පුරුසා අති දුර්ලභඃ

යනුවෙන් ප්‍රත්‍ය ශකය දක්වා ඇත. එහි සඳහන් අන්දමට සෑම වනාන්තරයකම බොහෝ ගස් තිබේ. නමුත් සඳුන් සෑම වනාන්තරයකම නැත. එමෙන්ම ලෝකයේ බොහෝ මිනිසුන් සිටියත් සත්පුරුෂයන් ඔවුන් අතර ඉතා දුර්ලභය. යනුවෙනි.

ඉතින් මේ උදාවූ අලුත් වර්ෂය ඉදිරියට සාර්ථක වසරක්, සාර්ථක ජීවිතයක් ගත කරන්නට නම් අපි අනුන්හටත් තමන්ටත් යහපතක් වන ලෙස ජීවත් විය යුතුය. ඇසුරු කරන පුද්ගලයන් හොඳින් සොයා බලා ඇසුරට ගත යුතුයි. සත්පුරුෂ ඇසුරට ගත් විට දිවියම ඉතා වටී. ලැබූ අලුත් වසරේ අපිද සත්පුරුෂ ගති ගුණ වලින් හා මිත්‍රත්වයෙන් යුතු පුද්ගලයෙක් වන්නට අදිටන් කරගෙන දිවියම සරු බවට පත්කර ගනිමු.

**එස්. දිල්රුක්ෂි අබේකෝන**

# භව නිරෝධය හෙවත් සසර ගමන නතර කිරීම



ලෝකයේ ක්‍රියාකාරීත්වය පවතිනුයේ සිත තුලය. ලෝකය යනු සිතයි-කයයි දෙකේම එකතුවේ පැවැත්මයි. "ඉමස්මිං එව ව්‍යාම මතෙතකලෙවරෙ ස සඤ්ඤිම්හි ස මනෙකෙ ලොකඤ්ච පඤ්ඤපෙමි" මේ ඹබයක් පමණ කයක් සමඟ පවතින සිත ලෝකය වේ. ඒ ආකාරයෙන් සර්ඥ ශාන්ති නායකයාණන් වහන්සේ "ලෝකය" ලෝකයා හමුවේ ගෙන හැර දැක්වූයේ කය යනු රූපයක් පමණි. කයට තනිව කිසිම දෙයක් කල නොහැක. කිසිම ප්‍රාණයක්, ජීවයක්, හැඟීමක්, දැනීමක්, විඥාණයක්, ක්‍රියා කාරීත්වයක් නොමැති කය අප්‍රාණික, අචේතනික, අවිඥානික වස්තුවක් රූපයක් පමණි. කයෙහි අභ්‍යන්තර රූප උපකරණයක් කරගෙන ඇසුරු කරගෙන ආධාර කරගෙන උපකාරීකරගෙන සිත සකස් වෙනවා. "සිතක්" යනු ක්‍රියාවක් "සිත" යනු ලෝකයේ ක්‍රියාකාරික්වයයි. උදහරණයක් මඟින් මේ බව තහවුරු කරගනිමු.

උදළුගාන සිත- උදළුගාන ක්‍රියාව
දුවන සිත- දුවන ක්‍රියාව
කපන සිත- කපන ක්‍රියාව
අඬන සිත- අඬන ක්‍රියාව

එසේ නම් ක්‍රියාවක් කීවත් එකයි, සිතක් කීවත් එකයි. මුලදී සඳහන් කළ මේ කයට කිසිම ප්‍රාණයක් ජීවයක් නොමැති බවත් කිසිම කරන්න බැහැ කියලා. මේ බවත් උදහරණයක් මඟින් සනාථ කර ගනිමු. ඔබ මළ මිනී දැක ඇත. ඔය මළමිනියෙහි අත පේන්න තියනවා. ඒ අතට පිහියක් දී හෝ තබා දර කපන්න කියන්න. පුලුවන්ද? බැහැ. සිත ඉවත්ව ගිය නිසා බැහැ. ක්‍රියාකාරී පුද්ගලයෙකුට ඒ පිහිය දී ගහක් කපන්න කීවොත් ඔහු ගහ කපනවා. ඔහු ගහ කපන්නේ පිහියෙන් නොවේ. අතිනුත් නොවේ. පිහිය හා අත උපකරණයක් පමණි. ගහ කපන්නේ හිතෙන් ඒ හිතට තියෙනවා කපන හිත කියලා. පිහියට අතට ගහ කපන්න, දර කපන්න පුලුවන්නම් මළමිනියටත් ගස්-දර කැපිය හැකි විය යුතුයි. මෙහිදී අප වටහා ගත යුත්තේ කය යනු රූපයක් පමණි. කිසිම ක්‍රියාකාරීත්වයක් නොමැති වස්තුවක්. එසේනම් ක්‍රියාකාරීත්වය ඇත්තේ සිතක් සකස් උනොත් පමණි. මේ කය සම්බන්ධ කරගෙන අභයන්තර රූප හයක් ඇත. මේවාට ආයතන-ද්වාර-ඉන්ද්‍රිය-චිතතයනත නම් ව්‍යවහාර කරනවා.

1. ඇස-චක්ඛු ආයතනය-චක්ඛු ද්වාරය-චකඛු ඉන්ද්‍රිය
2. කණ-ශෝක ආයතනය-ශෝක ද්වාරය-ශෝක ඉන්ද්‍රිය
3. නාසය-ඝ්‍රාණ ආයතනය-ඝාණ ද්වාරය-ඝාණ ඉන්ද්‍රිය
4. දිව-ජිව්හා ආයතනය-ජිව්හාද්වාරය-ජිව්හා ආයතනය
5. කය-කාය ආයතනය-කායද්වාරය-කාය ඉන්ද්‍රිය
6. මන-මන ආයතනය- මනද්වාරය- මන ඉන්ද්‍රිය

ඉහත දැක්වූ ආයතන-ඉන්ද්‍රිය-ද්වාර ඇත්තේ සත්වයා සම්බන්ධව පමණි. බාහිර ලෝකයේ ක්‍රියාකාරීත්වයට හාත් පසින් ක්‍රියාත්මක භාවයක් පෙන්නුම් කරන නිසා අභ්‍යන්තර රූප දැන ගැනීම ඉතා වැදගත්.

ආයතන යනු යමක් නිපදවන තැනක්. සීනි කම්ාන්තය-පිඟන් කම්ාන්තය-උළු කම්ාන්තය උදහරණයි. මේවායින් නිපද වන්නේ සීනි, පිඟන් භාණ්ඩ, උළු ගඩොල්ය. සත්වයා සම්බන්ධ ආයතන වලින් නිපදවන්නේ සිත් හෙවත් සිත නැමති භාණ්ඩයයි.

1 ඇසින්- බලන සිත
2 කනින්- අහන සිත
3 නාසයෙන්- ආඝාණය කරන සිත
4 දිවෙන්- රසවිදින සිත
5 කයෙන්- පහස ලබන සිත
6 මනෙන්- සිතන සිත

එසේ නම් පැහැදිළියි අභ්‍යන්තර ආයතන උපකාරී කරගෙන සිත නැමති භාණ්ඩය නිපදවන බව. මළ මිනියට ඉහත කිසිම සිතක් නිපද වීමේ හැකියාව නැත. හේතුව ආයතන ක්‍රියා විරහිත වීමයි.

තව කරුණක් ගැන මෙහිදී අවධානය යොමු කළ යුතුයි. ලෝකයේ ක්‍රියාකාරීත්වය වූ සිතයි භවයට යන්නේ. කෙසේවත් සිතට තනිව ගමන් කළ නොහැක. හිත යම් තැනකද එතන මනායතනය තිබිය යුතුයි. එසේ නම් සිත හා මන දෙකම භවයට යනවා. භව නිරෝධයට සිතක් හටගන්නේ කෙසේද? හිතේ ක්‍රියාකාරීත්වය කෙසේද? මේ සිත තුළ පවත්නා දර්මතා මොනවාද? ප්‍රභාස්වර සිත අපිරිසිදු වන්නේ කෙසේද? භවයට යා නොදී සිත නිරුද්ධ කරගන්නේ කෙසේද? සංකාර ගත සිත විසංකාර කරගන්නේ කෙසේද? යනාදී වශයෙන් ඉතාමත් පැහැදිළි අර්ථ විග්‍රහයක් පර්යේෂණයක් කිරීම තුළින්මයි. භව නිරෝධය ගෙන මනෝම හටගන්නවා.

"මනො පුබ්බං ගමා ධම්මා
මනො සෙට්ඨා මනො මඨා........"

මෙහිදී "ධම්මා" යනු සිතයි. ඇයි සිතට ධම්මා කීවේ? මේ සිත තුළ මුළු ලෝකයේ යම් ධර්මතාවයක් තිබේ නම් ඒ සියල්ලම සිත තුළ (ලෝකය තුළ) තියෙනවා. ඒ මොනවාද?

1. රූප ස්කන්ධය
2. වේදනා ස්කන්ධය
3. සඳංඥා ස්කන්ධය
4. සංකාර ස්කන්ධය
5. විඥාණ ස්කන්ධය

මේ පංච උපාදානස්කන්ධයයි. සිතක් කිව්වත් එකයි, පංචඋපාදානස්කන්ධයක් කීවත් එකයි. "මන" නොමැතිව කිසිම විටක සිතක් සකස් වෙන්නේ නැහැ. "මන" යනු රූපයක්, "සිත" යනු ලෝකයේ ක්‍රියාකාරීත්වය, විඥාණය යන ධාතුවක් හෙවත් ශක්තියක්. මන-සිත-විඥාණය ගැන හොඳින් දර්මානුකූලව ක්‍රියාකාරීත්වය අවබෝධ කරගත හොත් ඉතාමත් පැහැදිළීව භව නිරෝධය කරගත හැක. මෙය මයි චිත්තානු පස්‍යනාව කියන්නේ.

මේ ධර්ම කරුණු පිළිවෙලින් පෙළ ගස්වා ගනිමු. සත්වයා සම්බන්ධව ඇස,කණ,නාසය, දිව, කය,මන යන රූප හයක් විද්‍යාමාන වේ. (කය යන රූපය නිර්මාණය වී තිබෙන්නේ කෙස්, ලොම් ආදී දෙතිස් රූපයක් එක්වීමෙනි.) රූපය යනු ශක්ති හතරක් ඒකාහී වී පරිවර්ථනය වීමෙන් ඇති වීම නැති වීම තුළින්, චලනය තුළින්, වෙනස්වීම තුළින් හෙවත් අනිත්‍යතාවය නිසා විද්‍යාමාන වන්නා වූ ධර්මතාවයකි.රූපය යනු එසේ නම් ශක්ති හතරකි. ශක්තිය යම් තැනක විද්‍යාමාන වෙන්නේ නම් චලනයක් හෙවත් අනිත්‍ය තාවය වි[මාන විය යුතුමයි. එසේ නම් රූපය අනිත්‍යයි. යමක් අනිත්‍ය නම්, දුකයි, යමක් දුක නම් අනාත්මයි.

"යදනිච්චං තං දුකඛං" යමක් අනිත්‍යනම් දුකයි.
"යං දුක්ඛං තදතථා" යමක් දුක නම් අනිත්මයි.

එසේ නම් සියලුම රූපස්කන්ධයෙහි ස්භාවය අනිත්‍යයි. දුකයි. අනාත්මයි. අභ්‍යන්තර හා බාහිර සකළ ලෝක ධාතුවෙහි විමාන වන්නාවූ සියලු රූපස්කන්ධයටම මේ අනිත්‍ය දුක්ඛ අනාත්මතාවය සාධාරණයි. කිසිම ලෙසකින් මෙය වෙනසක් නැත්තේමය. "මන" රූපයයි. එසේ නම් "මනත්" අනිත්‍යයි. දුකයි. අනිත්මයි.

දැන් "විඤ්ඤාණ" ශක්තිය දක්නට ලැබෙන්නේ කොතැනද? කියා බලමු. විඤ්ඤාණය ධාතුවක් එය සිතක් සකස් කිරීමේ ශක්තියයි. රූප දෙකක් එකතුවෙන්මයි විඤ්ඤාණ ධාතුව හටගන්නේ. ධාතු හයකි.

1. පඨවි- තද ස්වභාවය
2. අපෝ- වැගිරෙන ස්වභාවය
3. තේජෝ- උණුසුම් ස්භාවය
4. වායෝ- හමායන ස්භාවය

මේ හතර කිසිලෙසකින් වෙන් කළ නොහැකි ශක්ති හතරකි. හැම විටම එක් ශක්තියක් වැඩි පුරවමයි දක්නට ලැබෙන්නේ. හතරේ එකතුව රූපයකි. ශක්තියකි, චලනයකි, වේගයකි. එසේ නම් රූප අනිත්‍යයි, දුකයි, අනාත්මයි. 5. ආකාශ හිස් ස්වාභාවය හටගත් ශක්තියයි.

සියලුම ශක්ති පැතිර පවතින්නේ හිස් ස්භාවයේ හෙවත් ආකාශ ධාතුවෙහිය. මෙයත් හටගත් ශක්තියත් අනිත්‍යයි,දුකයි, අනාත්මයි,

විඤ්ඤාණය සිතක් සකස් වීමේ ස්භාවයයි. විඤ්ඤාණය ධාතුවකි. රූපයක් නොවේ. හිත නොවි. නාමයක් නොවි. අපේ මාතෘකාව වූ විඤ්ඤාණය කොතැනද හටගන්නේ? මේ ශක්තිය හටගන්නේ සත්වයා සම්බන්ධව පමණි. එතැන සවිඤ්ඤාණිකත්වය විද්‍යාමාන වන සත්වයායි. දෙකක් එකතුවන තැන විඤ්ඤාණය හට ගනී.

**පොතපත අසුරින්**

03 පිටුවෙන්...

## නව වර්ෂය ජය හා සතුට වේවා

සිතුවොත් ඔවුන්,

සුභර - ආහාරයෙහි පමණ දැන ක්‍රියා කිරීම
සල්ලහුකවුත්ති - සැහැල්ලු දිවි පෙවෙත
අප්පිච්ඡතා - අපේක්ෂා අඩු බව
සන්තින්ද්‍රිය - ඉඳුරන් සංවර කරගැනීම
සන්තුට්ඨී - ලද දෙයින් සතුටු වීම
මුදු - මෘදු සිත් ඇත්තෙක් වීම
අප්පකිච්ච - වැඩ අඩු බව

යනාදී ගුණ තුළින් පෝෂිතව ඉතා සතුටින් ජීවන රටාව ගෙන ගියහ. අද බොහෝ පිරිස් නිරතම අතෘප්තිය, අසහනය තුළ ජීවත් වන්නේ තම තමන්ගේ දෝෂයන් හේතුවෙනි. අප ජීවත්වීමේදි අධික ආශාවන්ගෙන් මිදිය යුතුය. තරඟකාර බවෙන් (රැල්ලට යෑමෙන්) සිදුවන්නේ ලොකු විනාශයකි. එදිනෙදා ජීවන රටාව තුළ අත්‍යවශ්‍යය දේ ලබා ගැනීමෙන් සොම්නසේ ජීවන රටාවක් ගෙන යෑමට අපහසු නැත බඩ පිරුනට හිත පිරෙන්නෙ නෑ වගේ සැහැල්ලු බවින් කවදාවත් සෑහීමකට පත් නොවීමෙන් ප්‍රශ්නද නොවිසඳීම සිදු වනු ඇත. ඒ අනුව තම තමන්ගේ ප්‍රශ්න දැන රටවැසියන් බුද්ධිමත්ව ජීවිතයට මුහුණ දීමට අධිෂ්ඨානය කරගත යුතුය.

# නිවන් අවබෝධය පිණිස ආශ්‍රව ප්‍රහාණය කරමු

12පිටුවෙන්...

සමාධි සම්බොජ්ඣංගය බිඳ වැටේ. වීර්යය ඉන්ද්‍රිය අධික වුවහොත් උද්ධච්ඡ-කුක්කුච්ඡ නීවරණ ඇති වී සමාධි සම්බොජ්ඣංගය බිඳ වැටේ. මේ ආදී වශයෙන් සිදුවන බැවින් ශ්‍රද්ධාදී ඉන්ද්‍රියෝ මධ්‍යස්ථ කර ගත යුතුය.

iii. **නිමිත්ත කුසලතා**

තමන් වඩන භාවනාව තුළින් අර්පණ උපචාර ආදී නිමිති පහළකර ගැනීම සඳහා අවබෝධයෙන්ම නිවැරදිවම භාවනා වැඩීමේ දක්ෂතාවය තිබිය යුතු බවය.

iv. **සමයෙ චිත්තස්ස පග්ගහනතා**

භාවනා වැඩීමේදී පංචනීවරණයන් පැන නැගී වීර්ය ආදිය හීනවන අවස්ථා හඳුනාගෙන අදාළ දුර්වලතාවය දුරු කිරීම පිණිස අවශ්‍ය උපදෙස් සිතට ලබාදීමට හැකිවීමයි. මෙහිදී යම් යෝගියෙකුට තීනමිද්ධය ඇති වන්නේ නම් විර්ය සම්බොජ්ඣංගය වැඩිය යුතුය. යමෙකුට භාවනා නොවැඩෙන්නේ නම් ධම්මවිචය සම්බොජ්ඣංගයද, භාවනාව පිළිබඳ සන්තුට්ඨියක් නොමැත්තේ නම් පීති සම්බොජ්ඣංගයද ආදී වශයෙන් උපකාර කරගනිමින් සමාධි සම්බොජ්ඣංගය වැඩිය යුතුය.

v. එසේම සිටතේ වේගය, වීර්යය අඩුකළ යුතු අවස්ථාවල අඩු කරමින්ද වැඩිකර ගත යුතු අවස්ථාවල වැඩි කර ගනිමින්ද මඡ්‍යස්ථව පවත්වා ගත යුතු කල්හි මධ්‍යස්ථ කර ගනිමින්ද දුරු කළ යුතු පුද්ගලයින් දුරු කරමින් කල්‍යාණ මිත්‍ර සේවනය ඇති කරගනිමින් සමාධි සම්බොජ්ඣංගයට නැමුණු සිත් ඇතිව භාවනා වැඩීමෙන් සමාධි සම්බොජ්ඣංගය වැඩී ආශ්‍රව ප්‍රහාණය කළ හැකිය.

***<u>උපේක්ඛා සම්බොජ්ඣංගය</u>***

සප්ත සම්බොජ්ඣංගයේ අවසානය උපේක්ඛා සම්බොජ්ඣංගයයි. උපේක්ඛා හෙවත් උපේක්ෂාව යනු මධ්‍යස්ථ භාවයයි. කුමන මධ්‍යස්ථ භාවයදැයි අටුවාව මෙසේ විස්තර කරයි.

"පංච ධම්මා උපෙක්ඛා සම්බොජ්ඣංගස්ස උප්පාදාය සංවත්තන්ති...."

"මහණෙනි ධර්මයෝ පස් දෙනෙක් උපේක්ඛා සම්බොජ්ඣංගයාගේ උත්පාදය පිණිස වෙති"

ඒ දහම් කරුණු 05 නම්,

i. සත්ත මජ්ඣත්තතා
ii. සංඛාර මජ්ඣත්තතා
iii. සත්ත සංඛාර කොළොයන පුග්ගල පරිජ්ජනතා
iv. සත්ත සංඛාර මජ්ඣත්ත පුග්ගල සේවනතා
v. තදධි මුත්තතා

<u>සත්ත මජ්ඣත්තතා</u>

සත්වයන් කෙරෙහි මධ්‍යස්ථ භාවයයි. එනම් මව්පිය දූදරු ගෝල බාල පිරිස් කෙරෙහි ඇලීමෙන් ඔවුන් ගැන නිතර සොයමින් දුක් වෙමින් සතුටු වෙමින් සිටීමෙන් වැළකීමයි.

<u>සංඛාර මජ්ඣත්තා</u>

තමන් පරිහරණය කරන නොකරන තමා සමීපයේ හා දුර ඇති බඩු භාණ්ඩ ආදිය පිළිබඳ රැකීම, ප්‍රවේසම් කිරීම, අලුත් කිරීම ඒ ගැන සිතමින් සතුටු වීම, දුක් වීම ආදී වශයෙන් මධ්‍යස්ථ භාවයෙන් තොරව ඇලීම හා ගැටීම දුරලීමයි.

තෙවැන්නෙන් අර්ථවග් වන්නේ ඉහත කරුණු ද්වය පිළිබඳව මධ්‍යස්ථ නොවී ඇලෙමින් නලවමින් සිටින අය දුරු කොට මධ්‍යස්ථ පුද්ගල සේවනායන් උපේක්ඛා සම්බොජ්ඣංගයට නැඹුරු සිතක් අතිව භාවනා වැඩීමයි.

මේ ආකාරයට සබ්බාසව සූත්‍රයේ සඳහන් සත් ආකාර වූ ආශ්‍රව ප්‍රහාණය කිරීමෙන් සතර මාගී ඵල ධර්මයෙන් අවබෝධයෙන් අමාමහ නිවන් ලබත්වා.

08 පිටුවෙන්....

## මූලාශ්‍ර

මූලාශ්‍ර වල සඳහන් නොවන කරුණු රාශියක් කුසලානකන්ද, හෙන්නන්ගල, බඹරගල, යටහලෙන හා කඳුරුවැව යන ලිපිවලින් ලබාගැනීමට හැකිවී තිබේ. ලක්දිව ආර්ථික ඉතිහාසයට අදාල තොරතුරු රාශියක් ගොජවාය, හෝ පිටිගමුව ටැම්ලිපිය ආදියෙන් සොයා ගැනීමට හැකියාව ලැබී ඇත. ගොඩවාය ලිපියෙහි වරායෙන් ගන්නා ලද බදු ගැන සඳහන් වන අතර බදුලු ටැම් ලිපියේ වෙළඳ නගරයක් පාලනය කළ ආකාරය විස්තර කර ඇත.

එසේ මිහින්තලා පුවරු ලිපිය, අභයගිරි පුවරු ලිපිය හා කළුදිය පොකුණ ලිපිය ආදී ලිපිවල විහාර පාලනය පිළිබඳ වංශකතාවල නොමැති තොරතුරු රාශියක් ඉදිරිපත් කර ඇත. කාල නිර්ණය කිරීමේදී ද සෙල්ලිපි වැදගත් සාධකයක් වේ. පුරා විද්‍යාත්මක කැණීම් වලින් මතුවන්නාවූ සංස්කෘතික අවධිවල කාලය නිශ්චය කිරීමේදී සෙල්ලිපි මහෝපකාරී වේ. සිගිරි ගී හා චිත්‍ර ඒවා පිළිබඳ ඉතිහාසය පමණක් නොව සමාජ ඉතිහාසය කාන්තා සමාජය ගමන් බිමන් පුද්ගල හා ස්ථාන නාමආදිය පිළිබඳ අධ්‍යයනය කිරීම විශාල රුකුලක් වී ඇත.

පුරා විද්‍යාත්මක මූලාශ්‍ර අතර කාසි ද වැදගත් කමක් ගනී. කාසි වලින් එක් එක් යුග වල ආර්ථිකයේ දියුණුව හා තාක්ෂණික දියුණුව පිළිබඳ තොරතුරු දැකගත හිය. රන්, රිදී, තඹ කාසි නිකුත් වී ඇත්තේ ඒ අනුවයි. හස් එබූ කාසි, පුරාණ ධරණී ස්වස්ථිකය හා ලක්ෂමී කාසි, දඹදෙණි තඹ මසුථ රන්මසු, රන් අඩ මසු, ලැරිනය, වී.ඕ.සි වැනි කාසි අතීතයේ පටන් මෙරට භාවිතා වී ඇත. විදේශීය රෝම කාසි ඉන්දු රෝම කාසි, චීන කාසි ද හමුවීමෙන් පැහැදිලි වන්නේ ශ්‍රී ලංකාව විදේශීය රටවල් සමඟ ද වෙළඳ සබඳතා පවත්වා ඇති බවයි. එසේම 1 වන පරාක්‍රමබාහු රජුගේ කාසි දකුණු ඉන්දියාවෙන් හමුවී තිබේ. කාසි පිළිබඳ අධ්‍යයනය කිරීම නාණක විද්‍යාව ලෙස හැදින්වේ. ලෝහ කාසි හමුවීමෙන් ලෝහ කර්මාන්තය පිළිබඳ දැනුමක් ලබාගැනීමටද කාල නිර්ණය කිරිමටද හැකියාව ලැබී ඇත.

ලංකා ඉතිහාසය ගොඩනගා ගැනීමේදී විදේශීය මූලාශ්‍ර ද විශාල දායකත්වයක් දක්වා ඇත. ලංකාව අතීතයේ සිටම ඉන්දියාව, චීනය, බුරුමය, මලය අර්ධද්වීපය, පර්සියාව, අරාබිකරය,ග්‍රීසිය, රෝමය වැනි පෙර අපර දෙදිග රටවල් සමඟ සබඳතා පෙන්වා ඇති අතර ඒ පිළිබඳව විදේශීය ලේඛකයින් විසින් ලියන ලද විවිධ සටහන් හමුවී ඇත. ඇරිස්ටෝටල් නැමැති අය විසින් රචනා කරන ලද ඩිමුන්ඩෝ" නම් කෘතියෙහි ලංකාව හා වයඹ දිග ඉන්දායාව අතර වෙළඳ සබඳතා පැවැත්වූ බව දක්වා ඇත. ග්‍රීක ජාතික වෙන ස්තීනිස්ගේ ඉන්ඩිකා නම් කෘතියෙහිද ලංකාව ගැන සඳහන් වේ. රෝම ජාතික ජලිනිගේ නැචුරාලිස් හිස්ටෝරියා නම් කෘතියේ ලංකාවේ ආර්ථික තොරතුරු දක්වා ඇත. පෙරිජලස් ඔප් ද එරිත්‍රියන් නැමැති පළමුවන ශතවර්ෂයට අයත් කෘතියක ලංකාවේ මුතුමැණික් හා කඩුපිළි තිබූ බව සටහන් වී ඇත. ක්‍රි.ව දෙවන සියවසේ ඇලෙක්සැන්ඩ්‍රියාවේ විසූ ටොලමි විසින් භූගෝල ශාස්ත්‍රය නම් ග්‍රන්ථයේ ලංකාවේ ස්ථාන නාම, ස්ථාන ඒවායේ පිහිටීම හා ලංකාවේ හැඩය ගැන නිවැරදි තොරතුරු අන්තර් ගත වී ඇත.

ක්‍රි.ව 9 සියවසේ සිටි අරාබි ජාතික සුලෙයිමාන් විසින් ලංකාව සෙරෙන්ඩිප් ලෙස හඳුන්වා දී ඇත. 6 වන සියවසේ විසූ රෝම ඉතිහාසඥයකු වූ ප්‍රොතෝපියස් විසින් පර්සියානු යුද්ධ නම් කෘතියේ ලංකාව ප්‍රසිද්ධ වෙළඳ නගරයක්ව පැවති බව දැක්වේ. අරාබි ජාතික ඉබන්බතුතා ලංකාව හා අරාබිය අතර පැවැති වෙළඳ සබඳතා පිළිබඳ විස්තර දක්වා ඇත. චීන ජාතික ෆාහියන් හිමිගේ වාර්ථාවල ලංකාව මහායාන බලපෑම්, මහා විහාරය හා අභයගිරිය පිළිබඳ තොරතුරු සඳහන් වේ. කෞටිල්‍යගේ අර්ථ ශාස්ත්‍රය නම් කෘතියේද ලංකාව තාමුපර්ණී සහ පාර සමුද්‍ර යන නම් වලින් හඳුන්වා ඇත. මහා භාරතය, මණිමේබලා , රාජතරංගණිය වැනි ග්‍රන්ථවල ලංකාවේ රෙදිපිළි හා මැණික්. වාරිකර්මාන්තය ආදිය ගැන ද සඳහන් වේ. මීට අමතරව දිව්‍යාදානය, ස්කන්ධ පුරාණය, සීලප්පදිතාරම්, මණිවේකලෙ පත්තුප්භට්ටු, පට්ටි නප්පා ලෛයි යන ද්‍රවිඩ ග්‍රන්ථ වල ලංකාව ගැන සඳහන් වේ. අනුරාධපුරය, පොළොන්නරුව, යාපහුව යන පුරාණ රාජධානි වලින් හමුවූ මූර්ති කැටයම් චිත්‍ර රජමාලිගා බල කොටු උද්‍යාන ආදියෙන් ද ලංකා ඉතිහාසය ගොඩනැගීමේදී සුවිශේෂී වූ කාර්යභාරයක් සිදුවී ඇත.

## <u>ධම්ම පද ගීතය</u>

("අප්පමාද වග්ගය" 21, 22 ඇසුරිනි.)

**<u>පමා නොවෙමු.</u>**

පමා වුනොත් වරදිනවා
පමා වුනොත් පරදිනවා
කියා ලොවේ නැනැති දනා
නිබඳ සිතන්නා .....
අමා නිවන් මඟ යන්නට
පෙරුම් පුරන්නා .....

පැණි හැලියේ ඇඹලයෝ සේ
කම් සැපතට වසඟ වුනොත්
කිසි දවසක නෑ සැනසෙන්නේ
හැමදාමත් මරණයමයි
උරුමය වන්නේ ....

පමාදයේ දොස් දැකලා
නොපමා අනුහස් හඳුනා
සීල සමාධි පඤ්ඤා
වැරෙන් වඩන්නා
නුවන් පුරේ අමරණීය සේ
සැනසෙන්නා.....

*පී.එම්. අහංගම*

# සත්වයාගේ පැවැත්ම සඳහා භෞතික පරිසරය දායකවන ආකාරය පිළිබඳ බෞද්ධ විග්‍රහය

රංගිරි ශ්‍රී ලංකා
සත්‍ය ගවේෂී බෞද්ධ හඬ
රංගිරි ශ්‍රී ලංකා 2022 ජනවාරි - 2565 දුරුතු කලාපය



ශාක, සත්ව ප්‍රජාව, ජලය හා වාතය පාරිසරික සාධක ලෙස බුදුසමය පෙන්වා දෙයි. බුදුසමය හා පරිසරය අතර ඇත්තේ දැඩි මිත්‍රත්වයකි. බුදුරදුන් රහතන් වහන්සේලා සුන්දර පරිසරයට ඇලුම් කළ ආකාරය විවිධ සූත්‍ර දේශනාවන්හි සඳහන් වේ. සංයුක්ත නිකායේ වන රෝප සූත්‍රයේ වන වගාව, ගස්වැල් සිටුවීම, පාලම් ඒ දඬු තැනීම, ළිං පොකුණු තැනීම පිං වැඩෙන ක්‍රියාවක් වන බව දේශනා කර ඇත. බුදුසමය තුළ විග්‍රහ කරන්නේ පරිසරයට මෛත්‍රී කළ යුතු බවයි. රුක්ක සූත්‍රයේ දේශනා කර ඇත්තේ "ගස වනාහී එය විනාශ කිරීමට පැමිණෙන පුද්ගලයාටත් සෙවන සපයයි" යනුවෙනි. කූටදත්ත සූත්‍රයේ යාග සඳහා යාගස්ථම්භ ඉදිකිරීමට ගස් කැපීමත්, යාග වලට සතුන් බිලි දීමත් හේතුකොට ගෙන භෞතික පරිසරයට හානි සිදුවන බව දේශනා කර ඇත. එමෙන්ම බුදු සමය චක්කවත්තිසීහනද සූත්‍රයට අනුව පෙන්වා දෙන්නේ පක්ෂීන්ට සිවුපාවුන්ට අභයදීම රජුගේද වගකීමක් බවයි. පංචශීල ප්‍රතිපදාවේ පළමු වැන්නද ප්‍රාණඝාතයෙන් වැළකීම වේ. දැක්කාවූද නොදැක්කාවූද (දිට්ඨාවායේව අද්දිට්ඨා), දිග වූද මහත්වූද (දීගාවායේ මහන්තාවා) ආදී ලෙස සියලු සත්වයන්ට මෙත් වැඩීමට බුදු සමය උගන්වයි. ශාක හා සතුන් පමණක් නොව ජල සම්පත රැකගැනීම පිණිස ද බුදුසමය කරුණු පෙන්වා දෙයි. ජලයට කෙළ ගැසීම, මූත්‍රා කිරීම, ඉදුල් වතුර දැමීම නොකළ යුතු බව උගන්වන බුදු සමය පානීය ජලාශ අසල ආරාම තැනීමෙන් වැළකී සිටීමට ද කරුණු පෙන්වා දී ඇත. වත්ථක්ඛන්ධකයේ වායු දූෂණය නොකිරීමට උපදෙස් පෙන්වා දී ඇත. වාතයද භෞතික පරිසරයේ අංගයකි. එබැවින් දූවිලි සහිත ඇද ඇතිරිලි උඩු සුළඟට හසු නොවන පරිදි ගසා දැමිය යුතු බව පෙන්වා දෙයි. ජලය මෙන්ම වාතයද මිනිසාගේ පැවැක්මට අතිශය වැදගත් සාධකයක් බව බුදු සමය විග්‍රහ කරයි.

"අසම්බාධං අවේරං අසපත්තං" තමා ජීවත්වන පරිසරය සම්බාධක සහිත වෛර සහිත, සතුරු වූවක් නොවේයැයි සිතීමට බුද්ධ දේශනාවෙහි සඳහන් කර ඇත. භෞතික පරිසරය රැකගැනීමට බුදුසමය කරුණු දක්වා ඇති අතර භෞතික පරිසරය හා මිනිස් චර්යාවන් අතර පවතින සම්බන්ධතාවය පිළිබඳව ද සූත්‍ර ඇසුරෙන් දේශනා කර ඇත. අග්ගඤ්ඤ, කූටදන්ත, සප්ත සූරියග්ගමන වැනි සූත්‍ර වල මිනිස් චර්යාවන් පරිසර විනාශය, ලෝක විනාශය සඳහා හේතුවන බව පෙන්වා දී ඇත. සමුද්දවානී ජාතකයේ පවා සඳහන් වන්නේ මිනිසුන් සදාචාරය නොතකා අධාර්මික ලෙස ජීවත් වන විට සමුද්‍රය කෝප වී මුහුදු ජලය ගොඩ ගලමින් ගම් නියම් ගම් විනාශ වන බවයි. එමෙන්ම මිනිසුන් අධාර්මික වන විට කලට වැසි නොවසී. අකල්හි වැසි වසී. අස්වැන්න විනාශ වේ. ලෙඩ රෝග හට ගනී. පරිසරය විකෘති වේ යනුවෙන් බුදුරජාණන් වහන්සේ අංගුත්තර නිකායෙහි දේශනා කර ඇත.

ඒ අනුව මිනිස් චර්යා හා පරිසරය අතර දැඩි සබඳතාවක් ඇති බවත් මිනිසාගේ පැවැත්මට භෞතික පරිසරය අත්‍යවශ්‍ය සාධකයක් බව පැහැදිළි වේ. මිනිසා පරිසරයට අනුගත විය යුතුය. පරිසරයේ පැවැත්ම රඳා පවතින්නේ මිනිස් චර්යාවෙනි. මේ නිසා බුදුසමය පරිසරයට ආදරය කරන්නට කරුණාව දක්වන්නට, ගුණධර්ම ප්‍රගුණ කිරීමට පමණක් නොව අල්පේච්ඡ වෙමින් පමණ දැන ආහාර ගැනීමට යථාලාභ සන්තෝෂය ඇතිව මූලික අවශ්‍යතාව පරිසරයට හානි නොවන ලෙස සපුරා ගනිමින් ජීවත් වීමට බුද්ධ දේශනාවන්හි පෙන්වා දෙයි. ඒ අනුව භෞතික පරිසරය මිනිසාගේ පැවැත්ම තහවුරු කරයි.

**ඒ.ජී.හර්ෂණී ප්‍රභා කුමාරි**
**කැලණිය විශ්ව විද්‍යාලය**
**ජනසන්නිවේදන අධ්‍යයන අංශය**

## සැනසීමට මඟ ඉවසීමයි.

අද සමාජය තුළ පවතින ප්‍රධාන කරුණක් ලෙස මිනිසුන් ඉවසීමක් නැතුව කටයුතු කිරීම හැදින්වීමට පුළුවන. අද සමාජයට අවශ්‍ය ඉවසීමෙන් කටයුතු කරන පිරිසක්ය. ඉවසිමේ අනිත් පැත්ත නොඉවසීමයි. එනම් හදිසි කෝපයයි. අද බහුල වශයෙන් දක්නට ලැබෙන්නේ ඉවසුම් නැති, හදිසි කෝපයක් ඇති පිරිසක්ය. ඒ සඳහා බුදු දහම පැත්තෙන් කරුණු කාරණා දැනගෙන සැනසීමක් ලබා ගැනීම කළ යුතුව ඇත.

ඉවසීම තුළින් සැනසීම ලැබෙන්නේ කෙසේද? යන්න විමසා බැලීමෙන් පැහැදිලි වන්නේ ප්‍රතිවිරුද්ධ කෙනා හෝ පක්ෂය දැඩි තිරණ ගැනිමෙන් වැළකී සිටීමයි. උදාහරණයක් ලෙස යම් කිසි කෙනෙක් අපට බැන්නොත් හෝ ගැහුවොත් අපත් ඔහුට ඒ දේම කරන්න යෑම තුළින් සිදුවන්නේ නොනවතිනගැටුමක් ඇතිවීම හා වෛරසයේ දෝංකාරය උත්සන්න වීමක්ය. වෛරය යනු සත්වයා විනාශයට පත්කරන මානසික විපර්යාසයකි. එතුළින් කායික මානසික දෙඅංශයම පිරිහෙනු ඇත. ඒ නිසා බුදුරජාණන් වහන්සේගේ දේශනය මතක් කිරීම වැදගත් වේ.

"නහී වේරේන වේරානි - සම්මන්තීද කුදාචනං
අවේරේනච සම්මන්ති - එස ධම්මෝ සනන්තනෝ"

"වෛරයෙන් වෛරය නොසන්සිඳේ. අවෛරයෙන් වෛරය සංසිඳේ." තමාගේ සතුරා තමාමය. අපට මිතුරෝ ඇති කර ගැනීමටත් සතුරෝ ඇති කර ගැනීමටත් පුළුවන. හදිසි කෝපය, ක්ෂණික තරහව, තමනුත් අනුනුත් විනාශ කිරීමට පෙරමුණ ගන්නේය. එබැවින් සතුරා ඉදිරියේ වුවද ඉවසීම අත්‍යාවශ්‍ය වන්නේය. කියමනක් තියනවා "හොස්ස ලගින් මැස්ස යන්න බෑ" කියලා. අද සමාජය තුළත් පැහැදිලි වන්නේ පුංචි පුංචි දේටත් මිනිසුන් ඇනකොටාගන්න මරාගන්න ස්වභාවයකි. ක්‍රිස්තුස් වහන්සේ පවසා ඇත්තේ කෙනෙක් කම්මුලට ගැසූ කළ අනිත් කම්මුලත් අල්ලන ලෙසයි. එතුළින් ක්ෂණික තරහක් ඇතිවුන කෙනාට ලැජ්ජාවක් හෝ පසුතැවීමක් ඇතිවනවාට සැකයක් නැත.

අද පැහැදිලි කරුණක් ලෙස බසයක ගමන් කරන විට, වෙළඳ පොලක බඩු මුට්ටු ගන්නා විට, ටවුමක ගැවසෙන විට, පුංචි දේටත් බහින් බස් වී විශාල ගැටුමකට මුල පිරීම දක්නට ලැබේ. එතුළින් පුද්ගල හා දේපල විනාශයක් ඇතිවනු නියතය. "පනින්න පෙර සිතා බලනු" කියා පවසන්නේ යමක් කිරීමට පෙර සිතිය යුතු බවයි. ඒ තුළ ඉවසීමෙන් කටයුතු කළ යුතු බව ඇගවේ. "ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය" ඉවසන පුද්ගලයා සතුරන් ජව රැන්නා අයුරු ප්‍රකට වේ. ඉවසීම තුළ පවතින්නේ ක්ෂණිත හෝ කෙටිකාලීක සැනසීමතට වඩා දිගු කාලීන සැනසීමක්ය. දීඝිති කුමාරයා තමා සේවය කළ බරණැස් රජු විනාශ කරන්න තුන් වතාවක්ම කඩුව අරගෙනත් දුරදිග බලා ඉවසීම තුළින් එය යටපත් කරගන්නා ලදී.

ඉගෙන ගන්නා ශිෂ්‍යයෙකු වුවද රාජ්‍ය සේවකයෙකු වුවද, ඕනෑම නිලතලයක් දරණ හෝ නොදරණ කෙනෙකු වුවද තමන් කරා එන අභියෝග, ප්‍රශ්න, ගැටලුවලදී එයින් කම්පාවට පත්වීම හෝ ක්ෂණික තරහක් ඇති කර ගැනීම එතරම් හොඳ දෙයක් නොවේ. බුදුරජාණන් වහන්සේට තරම් සතුරන්ගේ විරුද්ධ කරුවන්ගේ ආක්‍රමණ වලට මුහුණ දීමට සිදුවූ තවත් කෙනෙකු මිහිපිට නැති තරම්ය. උන්වහන්සේ කිසිම තැනකදී අටලෝ දහමෙන් කම්පා වූවේ නැත. ඉවසීමේ පරතෙරටම වැඩිය උන්වහන්සේ ක්ෂාන්තිවාදී ජාතකයේදී ඉවසීම මොනතරම් ප්‍රගුණ කලාද යන්න පැහැදිලි වේ.

සැනසීම ප්‍රාර්ථනා කරන ඕනෑම කෙනෙකු ඉවසීම ප්‍රගුණ කළ යුතුය. එය ලෞකික වශයෙන් ද ලෝකෝත්තර වශයෙන්ද හොඳ විපාක ලබා දෙන උසස් ගුණාංගයකි. විශේෂ වශයෙන් අද සමාජයට අවශ්‍යව පවතින්නේ ඉවසීමෙන් කටයුතු කරන පිරිසක් හදාගැනීමය. ඒ උදෙසා සැම කෙනෙකුටම ශක්තිය, ධෛර්‍ය ලැබේවා. ඉවසීමෙන් දෙලොවම සැනසීමට පත්වේවා යන්න මගේ පැතුමයි.

**ගලගෙදර රතනවංශ හිමි**

**මෙම තීරුවට ඔබටත් ලිපි එවිය හැකියි. ඔබේ ලිපි වචන 250කට කැටි කොට එයට අදාළ පින්තූරයක්ද සමඟ අප වෙත එවන්න. අප්‍රකට හා ඓතිහාසික පුණ්‍යභූමි පිළිබඳ විස්තරයන්ට ප්‍රමුඛස්ථානය හිමිවේ. ඔබේ ලිපි සෑම මසකම පොහෝ දිනට සති 2කට පෙර එවන්න.**
**(මෙම පුවත්පතේ පලවන සියලුම ලිපිවල අන්තර්ගතය පිළිබඳ වගකීම එකී ලේඛකයන් සතුය.)**
**රංගිරි ශ්‍රී ලංකා පුවත්පත,රංගිරි ශ්‍රී ලංකා මාධ්‍ය ජාලය,දඹුල්ල.** (rangirinewspapers@gmail.com)